
# THE WHITE HACKLE

JULY 1998



ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY



මේජර් ජනරාල් එස්එච්එස් කෝට්ටෙගොඩ ආර්ඩබ්පී ආර්එස්පී විසින්
රෙජිම වෙතින් පිරිනමන ලද සම්මාන මුරය පරීක්ෂා කරන අයුරු



රෙජිමේන්තු මධ්‍යස්ථානය ඉදිරිපිටදී ශ්‍රීලපාහ නිලධාරීන් විසින් මේජර් ජෙනරාල් එස්එච්එස්
කෝට්ටෙගොඩ ආර්ඩබ්පී ආර්එස්පී පිළිගන්නා අයුරු



රෙජිම වෙතින් පිරිනමන ලද සම්මාන පෙළපාලිය පරීක්ෂා කරන අයුරු



මේජර් ජනරාල් එස්එච්එස් කෝට්ටෙගොඩ ආර්ඩබ්පී ආර්එස්පී විසින්
98/06/15 දින රෙජිම හිඳී සියලු නිලධාරී/සෙසුනිලයින් ඇමතීම.



බනි/සැර නිවස්නයේදී රෙසැමේ විසින් මේජර් ජෙනරාල් එස්එච්එස්
කෝට්ටෙගොඩ ආර්ඩබ්පී ආර්එස්පී පිළිගන්නා අවස්ථාව



මේජර් ජනරාල් එස්එච්එස් කෝට්ටෙගොඩ ආර්ඩබ්පී ආර්එස්පී ඇතුළු ජ්‍යෙෂ්ඨ
නිලධාරීන් තේ පැන් සංග්‍රහය භුක්තිවිඳින අවස්ථාව

# THE WHITE HACKLE

JULY 1998, VOLUME 05 NO. 03



ශ්‍රී දළද මාලිගාවේ සුන්බුන් ඉවත් කිරීම

පිටුව 06



12 ශ්‍රීලපාහ වසරක අභිත මෙහෙවර

පිටුව 28



අණ දෙන නිලධාරි භාරදීම භාරගැනීම 2(සේවි) ශ්‍රීලපාහ

පිටුව 35

## Headlines


| | |
|---|---|
| යුද්ධය හා සිත | 7 |
| ජයසිකුරු ක්‍රියාන්විතය පිළිබඳ විස්තර | 12 |
| What News | 15 |
| ක්‍රීඩා | 18 |
| ආබාධිත සෙබළුන්ට හා මියගිය රණවිරුවන්ට ආධාර | 19 |
| ආබාධිත රණවිරු පාඨමාලා | 20 |
| තල්අරඹ | 25 |
| 12 ශ්‍රීලපාහ වසරක අභිත මෙහෙවර | 28 |
| අඩපණ වී යන කොටි බලය | 31 |
| අකිකරු මදුරුවා | 33 |
| ඉංග්‍රීසින් උඩරට රාජධානිය ඇල්ලීමට ගත් උපක්‍රම | 37 |


**කවරයේ කථාව :** 51 සේනාංකාධිපති මේජර් ජෙනරාල් [illegible] 98.06.15 දින [illegible] ශ්‍රීලපාහ නිලධාරි සෙසු නිලයින් වෙතින් පිරිනමන ලද සම්මාන පෙළපාලිය පිළිගනිමින් [illegible]

PRINT WELL (PVT) LTD.

# Feedback

## අදහස් උදහස් හා විවේචන

# Readers Please Write in

The WHITE HACKLE, the Voice of the Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the seventh issue.

We should not rest on our laurels. Targets have to be set. Greater goals achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome. What is valued is our making the attempt, then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through "The White Hackle" the journal of the oldest and proudest Regiment of them all' If you have much to say about your Battalion's experience go ahead and write in to the "WHITE HACKLE'. We are willing to accept and use what is of a standard, like sketches, stories and poems, whatever comes from your thoughts and your pen.

Our Motto is "Ich Dien", I Serve"/ Let "WHITE HACKLE" be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all a happy New Year '96 and Compliments of the Season.

*Editor in Chief*

## හිතවත් පාඨකය, කරුණාකර ඔබගේ අදහස් අප වෙත එවන්න

ශ්‍රී ලංකා පාබල හමුදවේ හඩ ඉතා උසස් ලෙස නංවන 'වයිට් හැකල් සඟරාවේ' තෙවන කලාපයත් සමග එහි ළදරු අවධිය අවසන්කල අප ඉතා විශ්වාස වන්තව ඉදිරියට පිය ඔසවමින් පරිනත භාවයට පත් වෙමින් සිටින්නෙමු. රෝම අධිරාජ්‍යය ඉතා කෙටි කලකින් ගොඩ නැගුවක් නොවන අතර අපි ද පියවරින් පියවර ඉතා විශ්වාසවන්තව ස්ථිර අඩිතාලමක් සඳහා ඉදිරියට ගමන් කරමින් සිටින්නෙමු.

එනමුත් අප දැනට ලබා ඇති ප්‍රගතියෙන් සෑහීමකට පත්විය නොහැක, තව ඉදිරියට යා යුතු මග බොහෝ ය. එය දුෂ්කර ද නැතහොත් බාධාවකින් තොර වන්නේ දැයි තීරණය වන්නේ ඔබගෙන් ලැබෙන මහගු සහයෝගය මතය. 'වයිට් හැකල් සඟරාවේ' ප්‍රගතිය සඳහා අප සියලූ දෙනාටම ඉටු කිරීමට ඇති කාර්යභාරය ඉමහත් ය. ඔබගෙන් සුළුවෙන් හෝ අප වෙත ලැබෙන සහයෝගය සෑම අවස්ථාවකම අපි අගයමු. අවශ්‍ය වන්නේ ඔබගේ උත්සාහයයි. එයින් අප වඩාත් ධෛර්යමත් වන අතර අපගේ කාර්යය නිසි අයුරු ඉටු කිරීමට අවශ්‍ය පන්නරය ලබන්නෙමු.

මෙම සඟරාව පිළිබඳ හා එහි ලිපි රචනා පිළිබඳ ඔබගේ අවංක අදහස් හා විවේචන අප වෙත එවන්න. එය වයිට් හැකල් සඟරාවේ ඉදිරි ගමනට මහගු අත්වැලකි. 'වයිට් හැකල් සඟරාව' ශ්‍රී ලංකා යුධ හමුදවේ අභිමානවත් ඉතිහාසයට හිමිකම් කියන පෞඪ තම රෙජිමේන්තුවක් වන ශ්‍රී ලංකා පාබල හමුදව මගින් ත්‍රෙයි මාසිකව පල කරනු ලබයි.

මෙම පෞඪ රෙජිමේන්තුවේ සාමාජිකයෙකු හා සාමාජිකයෙකු වී සිටීම ගැන ඔබ ඔබ ගැනම ආඩම්බර විය යුතු ය. මෙම රෙජිමේන්තුව අනාධිමත් කලක් රැකගත් විලසට අප විසින් එය ඉදිරියට ද සුරැකිය යුතුය.

ඔබ බලඇණිවල යම් විශේෂ සිදුවීම් හා අවස්ථා පිළිබඳ ඔබ හට පැවසීමට ඇත්නම් 'වයිට් හැකල් සඟරාව' වෙත ලියන්න. ඔබගේ ලිපි ඉතා උසස් තත්වයක ඇතැයි අප විශ්වාස කරන අතර එම ලිපි 'වයිට් හැකල් සඟරාවේ' පල කිරීමට අප පුල පුලා බලා සිටින්නෙමු. එමෙන්ම ඔබගේ උසස් කවි සංකල්පනා හා සිතුවම් සඳහා ද මෙම සඟරාවේ ඉඩ ප්‍රස්ථාව ඇත.

අපගේ ආදර්ශ පාඨය යන 'සේවය කරමි' මත පිහිටා අප එකිනෙකාට, රෙජිමේන්තුවට, හමුදවට හා රටට සේවය කරමු. අපගේ පාබල හමුද ධජය ඉතා විශ්වාසවන්තව, අභිමානයෙන්, ඉතා ඉහලින් ලෙලදුන් විලසටම, තව දුරටත් ලෙලදීමට අවස්ථාව උද කර දෙමු.

ප්‍රධාන කර්තෘ

THE WHITE HACKLE is for Members of the SLLI, their Families, Ex-Servicemen of SLLI and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We invite readers' views. Under 150 words - a post card will do - and include your name, rank and address. We'll withhold your name if you so desire and may condense your views because of space. We can't publish or answer every one, but we'll use representative views. Send your letters to:

**Feedback,**
The White Hackle,
RHQ SLLI, Army Cantonment,
Panagoda, Homagama


THE WHITE HACKLE

**SRI LANKA LIGHT INFANTRY MAGAZINE**

**Col of the Regt.**
Major General AK Jayawardhana, RWP, RSP, rcds, psc

**Oftg. Centre Commandant**
Lieut. Col. JS Masakkara SLLI

*The White Hackle*, Staff

| | |
|---|---|
| Editor-in Chief | - Lieut. Col JS Masakkara SLLI |
| Associate Editor | - Major KJ Jayaweera SLLI<br>Major IGRG Bogodawatte SLLI<br>CPT. WDR Gunasekera SLLI |
| Chief Consultants | - Maj. Gen. AK Jayawardhana, RWP, RSP, rcds, psc |
| Honorary Consultants | - Maj. Gen. HV Athukorale VSV, psc - FBIM (Rtd) (Reg force)<br>Brigadier AER Abeysinghe KSV (Rtd) (vol force) |

| | |
|---|---|
| Publisher | - Regimental Centre<br>Sri Lanka Light Infantry. |

*The White Hackle* - is published quarterly under the Supervision of the Regimental Commander to provide the Regiment with information on people, policies, Operations, technical developments, views, opinions and ideas about the SriLanka Light Infantry. ◆ Manuscripts of interest to the Regiment are invited. ◆ Direct Communication is authorized to Editor, or Asst Editor The White Hackle, Regimental Centre, Army Cantonment Panagoda, Homagama, Phone 855204 or 437073 - 4 Extn 4340 or 4341. ◆ Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. ◆ Publication of this periodical is authorized by the Dte of PA, Army HQ CBO by letter No. A/275/27 of 16 Mar '94 ◆ Use of Funds for printing this publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conferance held at Welioya.

# ශ්‍රී ලාංකීය ජනතාවට නීතියෙන් හිමි වී ඇති මූලික අයිතිවාසිකම්

සෑම ප්‍රජාතන්ත්‍රවාදී රටකම නීතියෙන් හිමි වනමූලික අයිතිවාසිකම් වල ආරක්ෂාව ජනතාවට එම රජයන් මගින් ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ ද සියලුම ජනතාවට හිමි මූලික අයිතිවාසිකම් 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබාදී ඇත. එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදයේ 10 වෙනි ව්‍යවස්ථාවේ සිට 17 වන ව්‍යවස්ථාව දක්වා එම මූලික අයිතිවාසිකම් සඳහන් කර ඇත

විශේෂයෙන් සන්නද්ධ හමුද සාමාජිකයින් තම රාජකාරීන් ඉටු කිරීමේ දී මෙම මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා තිබීම ඉතා ප්‍රයෝජනවත් වේ. මන්ද යත් නීතිය සහ සාමය ස්ථාපිත කිරීමට සම්බන්ධ රාජකාරී කිරීමේ දී ඊට එරෙහිවන පුද්ගලයින්ට එරෙහිව රාජකාරී කිරීමට සන්නද්ධ හමුද සාමාජිකයින්ට සිදුවීමයි. එසේ රාජකාරී කිරීමේ දී ගනු ලබන්නා වූ ක්‍රියා මාර්ග තුළින් එම පුද්ගලයින්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය නොවනසේ රාජකාරී කළ යුතු වේ.

මෑත අතීතයේ සන්නද්ධ හමුද සාමාජිකයින් තම රාජකාරී ඉටු කිරීමේ දී මෙලෙස විවිධ පුද්ගලයින්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන සේ රාජකාරී කිරීම නිසා අසාධාරණයට ලක් වූ පුද්ගලයින් විසින් පවරා තිබූ නඩු තීන්දු වලට අනුව වන්දි ගෙවීමට ද සිදුවී ඇත. (පොලිස් නිලධාරීන් ද මෙවැනි අවස්ථා රාශියකට මුහුණ දී ඇත.).

ශ්‍රී ලංකා පුරවැසියන්ට නීතියෙන් ලැබී ඇති මූලික අයිතිවාසිකම් පහත සඳහන් පරිදි වේ.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන ව්‍යවස්ථාව

### සිතීමේ නිදහස, හෘද සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස

සෑම තැනැත්තෙකුටම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ද ලබ්දියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද ඇතුලුව සිතීමේ නිදහසට හෘදය සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට හිමිකම් ඇත්තේ ය.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව

### වධ හිංසාවලින් නිදහස

කිසිම තැනැත්තෙකු වධ හිංසා වලට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය.

## ආණුඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව.

### සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම්.

1. නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියෙන් රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේ ය.
2. කිසිම පුරවැසියෙකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස් නමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේ ය.
   එසේ වුව ද රජයේ සේවයේ අධිකරණ සේවයේ පළාත්පාලන සේවයේ නැතහොත් යම් රාජ්‍ය සංස්ථාවක සේවයේ යම් සේවා නියුක්තිවයක හෝ ධූරයක කාර්ය ඉටු කිරීම සඳහා යම් තැනැත්තකු යම් භාෂාවක් පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ඇතිව සිටීම සාධාරණව අවශ්‍ය වන අවස්ථාවක ඒ සේවා නියුක්තිය හෝ ධූරය සඳහා සුදුසුකමක් වශයෙන් ඒ භාෂාව පිළිබඳව එසේ ප්‍රමාණවත් දැනීමක් සාධාරණ කාලයක් තුළදී ලබාගත යුතු යැයි එවැනි තැනැත්තකුට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.
   එසේම තව දුරටත් එවැනි යම් සේවා නියුක්තියක හෝ ධූරයක හෝ කිසිදු කර්තව්‍යයක් යම් භාෂාවක් පිළිබඳ දැනීම ඇත්තේ නම් මිස ඉටුකළ නොහැකි වන අවස්ථාවලදී ඒවා සේවා නියුක්තියට හෝ ධූරයට හෝ ඇතුල්කර ගැනීමේ සුදුසු කමක් වශයෙන් යම් තැනැත්තෙකුට ඒ භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් තිබිය යුතු යැයි නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.
3. වර්ගය, ආගම, භාෂාව කුලය හෝ ස්ත්‍රී පුරුෂ භේදය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙළෙඳසැල් වලට පොදු භෝජනාගාර වලට ආපනශාලා වලට පොදු විනෝද ස්ථාන වලට හෝ තම තමන්ගේ ආගමට අයත් පොදු පූජනීය ස්ථාන වලට ඇතුල්වීම සම්බන්ධයෙන් යම් අශක්තතාවයකට බැඳීමකට සීමා කිරීමටත් නැතහොත් කොන්දේසියකට කිසිම තැනැත්තෙක් යටත් නොවන්නේ ය.
4 කාන්තාවන්ගේ ළමයින්ගේ හෝ අබල තැනැත්තියන්ගේ ප්‍රගතිය සඳහා නීතියෙන් හෝ අනු නීති වලින් හෝ විධායක ක්‍රියා මාර්ගයෙන් හෝ විශේෂ විධි විධාන සැලැස්වීම මේ ව්‍යවස්ථාවෙන් කිසිසේත් අවහිර නොවන්නේ ය.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථාව.

### අත්තනෝමතිකව සිර භාරයට ගැනීමෙන් රඳවා තබා ගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස සහ අතීතයට බලපාන දණ්ඩන නීති පැනවීම තහනම් කිරීම.

1. නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පරිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිර භාරයට ගැනීම නොකළ යුත්තේ ය. යම් තැනැත්තකු සිර භාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මත ද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේ ය.
2. අත් අඩංගුවේ තබා ගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පුද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තෙකුම, නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චයකාර වරයා ඉදිරියට ගෙන යා යුතු අතර, නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටිය අනුකූලව ඒ විනිශ්චයකාර වරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥා ප්‍රකාරව මිස ඒ තැනැත්තා තව දුරටත් අත් අඩංගුවේ තබා ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ ඒ තැනැත්තාගේ පුද්ගලික නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේ ය.
3. වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව චෝදනා නගනු ලැබ ඇත්තේ ද ඒ තැනැත්තාට නිසි අධිකරණයක් විසින් පවත්වනු ලබන සාධාරණ නඩු විභාගයක දී පෞද්ගලිකව හෝ නීතිඥවරයෙකු මගින් හෝ කරුණු කියා සිටීමට හිමිකම් ඇත්තේ ය.
4. නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය

පටිපාටියට අනුකූලව නිසි අධිකරණයක් විසින් කරනු ලැබූ ආඥාවක් අනුව මිස කිසිම තැනැත්තකු මරණීය දණ්ඩනයට යටත් කිරීම හෝ කිසිම තැනැත්තකු බන්ධනාගාර ගත කිරීම හෝ නොකළ යුත්තේය. එහෙත් විමර්ෂණයක් පවත්වන තෙක් හෝ නඩු විභාගයක් පවත්වන තෙක් හෝ යම් තැනැත්තකු සිර භාරයට ගැනීම අත් අඩංගුවේ තබා ගැනීම රඳවා තබා ගැනිම හෝ අන්‍යාකාරයකින් ඒ ,තැනැත්තාගේ පුද්ගලික නිදහස අහිමි කිරීම දඬුවමක් නොවන්නේ ය.

5. වරදකරු යැයි ඔප්පු කරන තෙක් සෑම තැනැත්කුම නිර්දෝෂී යැයි පූර්වානුමානය කළ යුත්තේය. එසේ වුව ද විශේෂ වූ සිද්ධි ඔප්පු කිරීමේ කාර්යය චූදිත තැනැත්තකු වෙත නීතියෙන්ම පවරණු ලැබිය හැක්කේ ය.

6. යම් ක්‍රියාවක් කළ හෝ යම් නොකර හැරීමක් සිදු වූ අවස්ථාවේ දී ඒ ක්‍රියාවට හෝ නොකර හැරීම වරදක් නොවේ නම් ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් කිසිම තැනැත්තකු වරදකට වරදකරු නොවිය යුත්තේ ය. තව ද යම් වරදක් සිදුකරණු ලැබූ අවස්ථාවේදී ඒ වරද සම්බන්ධයෙන් බලපැවැත්වූ දණ්ඩනයට වැඩි කිසිම දණ්ඩනයක් ඒ වරද සම්බන්ධයෙන් නියම නොකළ යුත්තේ ය.
යම් ක්‍රියාවක් කළ හෝ යම් නොකර හැරීමක් සිදු වූ අවස්ථාවේ දී එය ජාතීන්ගේ සම්මතයෙන් පිළිගත් පොදු නෛතික මූල ධර්ම අනුව සාපරාධී ක්‍රියාවක් හෝ නොකර හැරීමක් වූ විට ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් කවර වූ හෝ තැනැත්තකු නඩු විභාගයකට භාජනය කොට දඬුවම් කිරීමකට මේ ව්‍යවස්ථාවේ ඇතුලත් කිසිවකින් හානියක් නොවන්නේ ය.
යම් වරදක් සඳහා නියම කරනු ලබන අවම දණ්ඩනය ඒ වරද සිදු කළ අවස්ථාවේ දී ඒ වරද සඳහා නියමිතව තිබුණු උපරිම දණ්ඩනය නොඉක්මවන්නේ නම් ඒ වරද සඳහා එකී අවම දණ්ඩනය පනවන ලෙස නියම කිරීම මේ ව්‍යවස්ථාවේ විධිවිධාන කඩ කිරීමක් නොවන්නේය.

7. ආගමික හා විගාමික පනතේ හො 1967 අංක 14 දරණ ඉන්දු ලංකා (ක්‍රියාත්මක කිරීමේ) පනතේ හෝ එකී පනත් වෙනුවට ආදේශ කිරීම සඳහා පනවනු ලබන වෙනත් නීතියක් හෝ විධිවිධානය යටතේ කරණු ලබන ඉවත් කිරීමේ නියාමයක නැතහොත් රටෙන් පිට කිරීමේ නියාමයක හේතුවෙන් යම් තැනැත්තකු සිර භාරයට ගැනීම අත් අඩංගුවේ තබා ගැනීම රඳවා තබා ගැනීම හෝ අන්‍යාකාරයකින් හෝ ඒ තැනැත්තාගේ පුද්ගලික නිදහස අහිමි කිරීම මේ ව්‍යවස්ථාවේ විධිවිධාන කඩ කිරීමක් නොවන්නේ ය.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වෙනි ව්‍යවස්ථාව

**භාෂණයේ රැස්වීමේ සමාගමයේ රැකියා යාම් ඊම් යනාදියේ නිදහස**

1. සෑම පුරවැසියකුටම
   (අ) භාෂණයේ නිදහසට හා ප්‍රකාශණය ඇතුලූ අදහස් පළ කිරීමේ නිදහසට
   (ආ) සාමකාමීව රැස්වීමේ නිදහසට
   (ඇ) සමාගමයේ නිදහසට
   (ඈ) වෘත්තීය සමිති පිහිටුවීමේ සහ වෘත්තීය සමිති වලට බැඳීමේ නිදහසට
   (ඉ) එකලාව හෝ අන් අය සමග ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගම ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන් පිළිපැදීමෙන් ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීම් නිදහසට
   (ඊ) එකලාව හෝ අන් අය සමග හෝ ස්වකීය සංස්කෘතිය භක්ති විඳීමේ හා වැඩි දියුණු කිරීමේ නිදහසට සහ ස්වකීය භාෂාව භාවිතා කිරීමේ නිදහසට
   (උ) එකලාව හෝ අන් අය හා සමග යම් නීත්‍යානුකූල රැකියාවක වෘත්තියක කර්මාන්තයක වෙළෙඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමේ නිදහසට
   (ඌ) ශ්‍රී ලංකාව තුල යාම් ඊමේ නිදහසට හා අභිමත ස්ථානයකවාසය කිරීමේ නිදහසට සහ
   (ඒ) ශ්‍රී ලංකාවට පෙරලා පැමිණීමේ නිදහසට හිමිකම් ඇත්තේය.
2. වෙනත් යම් කිසි රටක පුරවැසියෙකුව නොසිටිය දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීම ආරම්භ වන තෙක් ශ්‍රී ලංකාවෙහි ස්ථිර සහ නීත්‍යානුකූලව පදිංචිව සිටියා වූ සහ එසේ දිගටම පදිංචිව සිටින්නා වූ තැනැත්තකුට ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීම ආරම්භවීමේ සිට අවුරුදු දහයක කාලයක් තුළ මේ ව්‍යවස්ථාවේ (1) වන අණු ව්‍යවසථාවෙන් ප්‍රකාශ කොට පිළිගනුලැබ ඇති අයිතිවාසිකම් වලට හිමිකම් ඇත්තේය.

15 වන ව්‍යවස්ථාවෙන් මූලික අයිතිවාසිකම් පිළිබඳ සීමා දක්වා ඇත

16 වන ව්‍යවස්ථාවෙන් පවතින ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති බලපවත්වන බව දන්වා ඇත.

17 වන ව්‍යවස්ථාවෙන් විධායක ක්‍රියා මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට ප්‍රතිකර්ම දක්වා ඇත.

යම් පුරවැසියෙකුගේ මූලික අයිතිවාසිකම් විධියක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් උල්ලංඝනය කළ හෝ කිරීමට ආසන්න විට ඊට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා යුක්තිය ඉටු කර ගත හැක. සන්නද්ධ හමුද සාමාජිකයින් ද මෙම රටේ පුරවැසියන් වුවත් එම සාමාජිකයින්ගේ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 (08) ඡේදයේ මෙසේ දක්වා ඇත.

## 15(08) ව්‍යවස්ථාව

12 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවෙන් 13 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් සන්නද්ධ හමුදවන්හි සාමාජිකයින්ට පොලිස් හමුදවේ සාමාජිකයින්ට සහ රටේ යථා පැවැත්ම භාරවී සිටින වෙනත් හමුදවල සාමාජිකයින්ට අදල වීමේදී එම අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද, ක්‍රියාත්මක විය හැක්කේ ද ඔවුන් ගේ කාර්යයන් යථා පරිදි ඉටු කරවා ගැනීම සහ ඔවුන් අතර, විනය පවත්වා ගැනීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත් වය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(ඌ) ඡේදයේ අනුව සෑම පුරවැසියෙකුම ශ්‍රී ලංකාව තුළ යෑම් ඊම් නිදහස්ව සහ අභිමත ස්ථානයක වාසය කිරීමෙස් නිදහස ද හිමිකම් ඇත.

1980 දශකයේ ත්‍රස්ථවාදී ප්‍රහාරයන්ට ලක් වූ නැගෙනහිර පළාතේ ගමක එක් කාන්තාවක් එම ප්‍රදේශය අතහැර දකුණු ප්‍රදේශයට පදිංචිය සඳහා යන ලදී. ප්‍රදේශයේ රජයේ බලධාරීන් විසින් මෙම කාන්තාව නැවත බලෙන් පැරණි ස්ථානයේ පදිංචි කිරීමට කටයුතු කරණ ලදී. එවිට මෙම කාන්තාව ඉහත 14(ඌ) ඡේදය යටතේ නඩු පවරණ ලදී. පදිංචිය සඳහා බලපෑම් කිරීම නීති විරෝධී බවත් එමගින් ඇයගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වන බවත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කරන ලදී.


සකස්කලේ
මේජර් ආර්ඩීපී මෙල්
කාරය නියුක්ත අණදෙන නිලධාරී
5 වන (සේවා) බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව

# Rules that Made a Great Career

Here are some of the rules of conduct which Capt. K. M. Cariappa prescribed for himself while at Staff College, Quetta, in the year 1933. That the Captain rose to become the first Indian Commander - in- Chief, should bear out of the validity of these rules. There can be no doubt that General Cariappa's well-thought-out guidelines will benefit aspiring young officers of the Armed Forces even today.

## DONTs

Don't's be too dressy, but be smart in your turnout at all times.

Don't talk in a loud voice - it is bad form to do so.

Don't ever contradict your senior officers. If you disagree with their views merely say I hope you wan' think I am contradicting you. I feel etc.

Don't be snobbish or conceited - it is bad manners and it does not do you any good in life - you will merely become unpopular with your brother officers and others in the station.

Don't brag of what you can do at games and at your work - let others find out for themselves what you are really worth.

Don't ever sing any documents, official or otherwise, without first reading it from top to bottom. You might be badly let down by your clerk if you don't read it.

Don't grouse that you have too much work to do in your unit. Grousing is a sure sign of slackness and slackers are not wanted in the Army.

Don't ever make a statement unless you are sure of facts and figures.

Don't give your opinion unless it is asked for.

Don't for goodness sake talk "shop" in the Mess or at private parties.

Don't bring in official matters to interfere with private affairs.

Don't be too flashy about your work. Go about it quietly and unassumingly.

Don't please don't sulk if you get caught by your senior officers for any mistake you may make. It is very bad form for an office to sulk - it leads to bad discipline in your unit.

Don't get into the most despicable habit of discussing your brother officers amongst yourselves. It has led to in the past and always leads to more trouble and unhappiness in your unit than you can dream of.

Don't ever criticise other units or brag about your own.

Don't sit tight and expect people in the Station to come and fall at your feet and make friends with you or to entertain you. You must go half away to do your bit.

Don't keep on saying that you cannot afford to do this or that or don't talk too much of the fleet of cars or strings of horses you may have at your home.

Don't be to sensitive or too imaginative - by this is meant don't take offence where no offence is intended

Don't be insinuating or sarcastic. Being sarcastic to your subordinates is like hitting a man who cannot hit back.

Don't make personal jokes, some take them well but a lot take them ill.

Don't try to purchase popularity of a cheap kind by excessive convictively.

Don't draw public attention by eccentric behabiour or by a vulgar display of wealth of you are blessed with it.

Don't too free with the Other Ranks in your unit nor too stand offish. Get to know well and You will get a "lot of them".

Don't take part in low jokes in the vernacular with the Other Ranks.

Don't tell "tales out of school" with the hope of gaining favour of your senior officers. It is most unbecoming of an officer to indulge in "Carrying tales"

Don't run into debt and if you do, own up about it to your Commanding Officer and tell him all the debt owed.

Don't refer to your unit Commander as 'C.O" but refer to but refer to him as "Commanding Officer"' it is more respectful.

Don't discuss politics and religion in the Mess

Don't get married unit at least, you are captain and you have done all the obligatory courses. of instruction.

## DO s

Do make your motto "do it now" and stick to it all times.

Do everything you do thoroughly.

Do be very punctilious about saluting and salute smartly at all times.

Do be "straight and call and spade a spade". If you hear of any one having spoken ill of you-instead of nursing hearsays and there by letting things get unpleasant - go straight to the person concerned and have it thrashed out with him then and there and then forget about it.

Do respect everything that is Regimental. See that no unauthorised person uses your Regimental note paper or wears your tie or makes use of any such other Regimental thing.

Do keep your "family" i.e. Regimental, troubles to yourselves. For Heaven's sake don't wash dirty linen in public.

Do own up your mistake before you are found out.

Do go it your Commanding Officer or to your Adjutant when you are in trouble of any on description, and tell them all about. They will save you many an embarrassment in life if you do it at the very first instance.

Do remember that the duties of your profession which require you to keep your bodies strong, do not in any way involve the keeping of your minds weak.

Do see that you never waste an instant's time. The sin of idleness is a thousandfold greater in you than in other youths. for the fate of those who will one day be under your command in the battlefield hangs upon your knowledge - lost moments now will be lost lives then - and every instant which you carelessly take for play buy with blood.

Do realise that as officers and gentlemen you belong to a class whose word is trusted - it is a Heritage you should be proud of your unit play.

Do stick to the customs of the Service and your own unit, no matter how trivial such customs many appear to you. They help to maintain the esprit be corps so essential to keep up the good name, the tradition and the efficiency of your unit.

Major Jayanth Jayaweera

# ශ්‍රී දළදා මාළිගාව ඉදිරිපිට ශ්‍රීලපාහ භට පිරිස් ශ්‍රමදාන පදනමින් සුන්බුන් ඉවත් කිරීමේ යෙදී සිටින අයුරු.







ශ්‍රී දළදා මාළිගාවේ ගොඩනැගිලි සංකීර්ණයේ සුන් බුන් ඉවත් කොට පවිත්‍ර කිරීම සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙතින් නිලධාරී/සෙසුනිලයින් 160 ක් පමණ සහභාගීත්වයෙන් 98.04.25 දින සහ 26 දිනයන් හි එය පිරිසිදු කිරීමට සහභාගී වීම වෙනුවෙන් ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ නෙරංජන් විජේරත්න මහතා විසින් සියලුම ශ්‍රීලපාහ ඒකකයන් භට ඒ වෙනුවෙන් ආශිර්වාද පතා පහත සඳහන් ලිපිය ද එවා ඇත. එය සියලු අයගේ දැන ගැනීම සඳහා මෙහි පළ කරමි.

**රෙජිමේන්තු ආඥාපති තුමා,**
**ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මූලය**
**යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම**

**හිතවත් ආඥාපති තුමනි**

**ශ්‍රී දළදා මාළිගාවේ ගොඩනැගිලි සංකීර්ණයේ සුන්බුන් ඉවත් කොට පවිත්‍ර කර දීම**

බෞද්ධ ලෝකයේ මුදුන්මල්කඩ ගෞතම සම්මා සම්බුද්ධරජාණන් වහන්සේගේ වාම ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ වඩා හිඳුවා පූජෝපහාර පවත්වන ශ්‍රී දළදා මාළිගාවට 1998 ජනවාරි මස 25 වැනි දින එල්ල කළ ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාරයෙන් පසු ඉවත් කිරීමට ඉතිරිව පැවැති සුන්බුන් ඔබ රෙජිමේන්තුවේ සංවත්සරය දිනය නිමිති කොට 1998.04.25 සහ 26 දෙදින පාබල හමුදා භට පිරිස් යොදා ශ්‍රමදාන පදනමින් ඉවත් කර දීමට විධිවිධාන යෙදීම මහත්සේ අගය කොට සලකමි.

ශ්‍රී දළදා මාළිගාවේ පරිසරය මෙම ආපද සම්බන්ධ අවස්ථාවේ හැකි උපරිම මට්ටමින් සංරක්ෂණයට මේ අන්දමින් ඔබ රෙජිමේන්තුව දායක වීම මුල්කොට සමස්ත වශයෙන් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට මගේ හෘදයාංගම ස්තූතිය හිමිවේ.

ඔබතුමාට, රෙජිමේන්තුවේ සියළුම ඒකකවල සියළුම සාමාජිකයිනට, රෙජිමේන්තුවේ අභිවෘද්ධියට, ආශිර්වාද වේවායි දළදා සමිඳු සෙවනේ සිට ඉත සිතින් ප්‍රාර්ථනය කරමි.

**මෙයට හිතවත්**
**නෙරංජන් විජයරත්න**
**ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිළමේ**

# යුද්ධය හා සිත

වර්තමාන ලෝකයේ පවතින විවිධ අරගල ගැටළු හා විවෘත යුද්ධයන් ලෙස විශ්ලේෂණාත්මකව බැලුවිට, ඉන් තහවුරු වන එක් පැහැදිලි කරුණක් ඇත. එනම් පවතින යුද්ධය කොතෙක් සංකීර්ණ වුව ද එහි ආරම්භය සහ පැවැත්ම හෝ අවසානය රැඳී ඇත්තේ එම යුද්ධියට උරදෙන ජන කොටසේ මානසිකත්වය මතය. මෙය මනෝ විද්‍යාත්මකව පැහැදිලි කිරීමේ දී යුද්ධයක් ඇති වීමට විවිධ ජන කොට්ඨාශ, ජාතීන් හෝ රටවල් අතර පවතින අවිශ්වාසය හෝ හීනමානය මෙම යුද්ධයන් හට හේතු සාධක වේ. කෙසේ වුව ද අද ලෝකයේ පවතින විවිධ යුද්ධයන් සඳහා හේතුවන වෙනත් සාධක බොහෝ ඇතත් මෙම ලිපිය මගින් මා විග්‍රහ කිරීමට බලාපොරොත්තු වන්නේ මූලික වශයෙන් ඕනෑම යුද්ධයක්, ගැටුමක් ජන කොට්ඨාශයක් තුළ ඇතිවීම එහි පැවැත්ම හා අවසානය සිදුවනුයේ 'මිනිස් සිත' මුල්වීමෙන් බවත්, එම යුද්ධය තුළ ජීවත්වන සෙබලාගේ මානසික තත්ත්වය යුද්ධයේ විවිධ අවස්ථාවන්හිදී අධ්‍යයනයට ලක් කිරීමත් ය.

## යුද්ධයක් යනු....

යුද්ධය සඳහා විවිධාකාර අර්ථකතනයක් ඇත. එහෙත් මනෝ විද්‍යාවට අනුව සැලකීමේ දී යුද්ධය යන්නෙහි අර්ථය මෙසේ වේ. 'පවතින සමාජය තුළ ජීවත්වන මිනිසා ඔවුනොවුන්ගේ සමාජමය ආර්ථිකමය හෝ දේශපාලන ස්ථාවරත්වයන් තකා තම සමාජයේ පොදු සාධකයක් වන නිජ භූමිය, ආගම්, සංස්කෘතිය හා භාෂාව රැක ගැනීමෙහිලා සිය කැමැත්තෙන් හෝ යම් බාහිර බලපෑමක් මත සිදුකරන ප්‍රජාතාන්ත්‍රික විරෝධී ක්‍රියා කලාපයකි.

මෙම අර්ථකථනයේ මා විසින් ප්‍රජාතාන්ත්‍රික විරෝධී යනුවෙන් අදහස් කරනුයේ සමස්ථයක් වශයෙන් යුද්ධය ලෝක ප්‍රජාව පිළිකුල් කරන ක්‍රියාවක් බැවිනි.

## සතුරු මිතුරු පාර්ශවයන් හා ඔවුන්ගේ සිත

ඕනෑම යුද්ධයකට සෘජුව, ඉදුරාම මුහුණ දෙන්නේ මේ ජන කොට්ඨාශ දෙකයි. සමහර විට මෙම දෙපාර්ශවයම එකම ජන කොට්ඨාශයකට, රටාවකට, ආගමකට, ජාතියකට, දේශපාලන පක්ෂයකට හෝ වෙනත් සමානතාවයකට අයත් වූවෝ විය හැක. කෙසේ වුවද මා පෙර සඳහන් කළ යුද්ධියේ මනෝ විද්‍යාත්මක අර්ථකථනයේ සඳහන් වූ හේතුන්මත මොවුන් එකිනෙකාට විරුද්ධව යුදවැදී ඇත. එසේ නම් මොවුන්ගේ මානසිකත්වය කෙසේ වේද?

මිනිස් සිත ඉතා සංවේදී ඉන්ද්‍රියකි. අප එකිනෙකාගේ සිත් එකිනෙකාට වෙනස් වේ. එසේ වුව ද, යුද්ධයක දෙපාර්ශවයන්ගේ සිත් තුළ යම් යම් සමානාත්මතාවයන් ඇති වේ. මනෝ විද්‍යාව අනුව මෙය සමාන චර්යා ධර්මයන් හේතුවෙන් විය හැක. යුද වැදී සිටින දෙපාර්ශවයේම අරමුණ 'තම සතුරා පැරදවීම' වේ. සතුරා පැරදවීමට සෑම විටම එකෙක් අනෙකාට වඩා බලවත් වීමට ප්‍රයත්න දරයි. පිරිස් බලය වැඩි කර ගැනීම, යුධායුද ලබා ගැනීම හා වෙනත් ක්‍රම මේ සඳහා උපයෝගී කර ගනියි. තව ද මෑතකාලයේ සොයා ගත් ප්‍රබල අවියක් වන මනෝ විද්‍යාත්මක ක්‍රියා මගින් ඉදුරා ම සතුරාගේ මනස ව්‍යාකූල කිරීමට සමත් වී ඇත. (මේ සබැඳිව මා විසින් මෙම සරාවට 'මනෝ විද්‍යාත්මක ක්‍රියා හා නවීන යුද ශිල්පය' යනුවෙන් ලිපියක් ජූලි හා ඔක්තෝබර් කලාපයන් හි පලකර ඇත.)

## යුද්ධයට සම්බන්ධවන සෙබලුන්ගේ මානසිකත්වය කෙසේ විය යුතු ද? (State of mind of a conbatant)

(අද අප මුහුණ දී ඇති යුද්ධයට උචිත වන අයුරින් මනෝ විද්‍යානුකූලව මා මෙම ප්‍රශ්නයට හැකි පමණින් පැහැදිලිව පිළිතුරු දෙමි) ප්‍රථමයෙන් සාමාන්‍ය පුරවැසියකු සෙබලකු ලෙස බැඳීමට ඔහුට හෝ ඇයට හේතු වූ සාධක සලකා බැලිය යුතු ය.

අද අප සමාජ තත්ත්වය මත,

1. පැහැදිලි ජීවනෝපාය මාර්ගයක්
2. සමාජයේ සැලකිල්ල
3. ආර්ථික ස්ථාවරත්වයක්
4. රටේ පොදු අවශ්‍යතාවයක්
5. පොදු පහසුකම් උදෙසා

යන කරුණු මෙයට හේතු වශයෙන් පැහැදිලිවම දකිය හැක. මෙයට අමතරව සමහරක් සෙබලුන් පැහැදිලි අරමුණක් නැතිව හමුදවට බැඳී ඇත. කෙසේ වුවත් මොවුන් හමුදවට බැඳෙන විට තිබූ සිවිල් නිදහස මානසිකත්වය යම් තාක් දුරට වෙනස් මගකට යොමු කිරීමක් යුද හමුද මූලික පුහුණුව මගින් සිදුවේ. ක්‍රමවත් පුහුණුවක් මගින් ප්‍රථමයෙන් ඔහුගේ සිවිල් සිත බිඳ දමා මෙතෙක් කල් නොදුටු කෝණයකට මෙම ආධුනික සෙබලාව රැගෙන යයි. මෙහි දී මනස අභ්‍යන්තරයේ සිදුවන ක්‍රියාවලිය (Conceptual change in mind) අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ.

මෙහි දී ඕනෑම සෙබලකු තමා මානසිකව හා ශාරීරිකව තම ජීවන රටාව වෙනස් මගකට යොමු වන බව හොඳකාරවම අවබෝධකර ගත යුතුය. යුධ පුහුණුවේ ප්‍රථම අධියර තුළ සිදුවන යම් ක්‍රියා සමහරවිට මෙම විපර්යාසය තේරුම්ගත නොහැකි පුද්ගලයා හට ඔරොත්තු නොදෙන තත්ත්වයක් ගෙන දේ.

**උදහරණයක් වශයෙන්.**

1. දිගු කාලයක් එකම ස්ථානයක රැඳීගෙන ඒකාකාරී ක්‍රියා කලාපයකට මුහුණදීමෙන් පුහුණුව එපා වී ඉන් පැනයාම.

2. තමාට මානසිකව හෝ ශාරීරිකව උසුරාගත නොහැකි දැඩි අභ්‍යාසවලට මුහුණදීමෙන් පුහුණුව අප්‍රියවීම

3. උපදේශකයින්ගේ දැඩි ක්‍රියා කලාපයන්ට මුහුණදීමට නොහැකිව පැනයාම (මෙම කරුණුවලට අමතරව වෙනත් බොහෝ සාධක තිබුණ ද ලිපියට අදල මෙම කරුණු තුන පමණක් මා ගෙන හැර දක්වනමි)

මෙම කරුණු දෙකෙහි දී ආධුනිකයා පුහුණුව හැරයාම මගින් ඔහුගේ මානසික අසංතෘප්තිය හොඳින් පැහැදිලි වේ. මෙවන් මානසිකත්වයක් තුල නිර්භවත්වයක් තම සිත තුළ ගොඩනගංවා ගැනීම අපහසු වේ. ලොව කිසිම හමුදවක යුද පුහුණු පහසු නැත. අවශ්‍ය වන්නේ තම සිත මා පෙර කීවාක්සේ විපර්යාසයකට ඔරොත්තු දෙන ආකාරයට හැඩගස්වා ගැනීමයි.

යුධ හමුදවට තමා බැඳුනේ ඇයිද? යන්න නිවැරදිව අවබෝධකරගෙන එමගින් ස්ථිර මානසිකත්වයකට එළඹෙන පුද්ගලයා

ඉතා සාර්ථක යුද සෙබලකු බවට පත් වේ. මෙම මානසිකත්වය එකිනෙකාට වෙනස්වන නිසාවෙන් පාඨමාලාවක් තුළ දක්ෂයන් හා අදක්ෂයින් ඇතිවීම සිදුවිය හැක. දරදඬු සිත හා මොලොක් සිත යනුවෙන් සරලව විග්‍රහ කරන මෙම ස්ථාවර මානසිකත්වය හා අස්ථිර මානසිකත්වය ආධුනිකයින් තුල කොතෙක් දුරට බලපාන්නේ ද යන්න උපදේශකයින් විසින් නිරතුරු අධ්‍යයනය කළ යුතු කරුණකි. නවීනතම උපකරණ පහසුකම් ක්‍රමහෝ අති දක්ෂ උපදේශකයින් සිටිය ද, පුහුණුවේ ප්‍රතිඵල පිළිබිඹු වනුයේ පුහුණුව ලබන්නන්ගේ ස්ථිර මානසිකත්වය මතය. මෙම ස්ථිර මානසිකත්වයට පිවිසීමට නොහැකි වන සෙබලාගේ සිත අසංතෘප්තභාවයට පත්වීමෙන් ඔහු තම පුහුණු කාලසීමාවේ දී පැනයාම සිදුවේ.

ස්ථාවර මානසිකත්වය යනු කුමක්ද? එනම්, කෙනෙකු තුළ තමා කරන කාර්යය පිළිබඳව ඇතිවන පැහැදිලි සිතයි. යුද සෙබලකු නම්, තමාගේ කාර්යය කුමක්ද? එය ඉටුකිරීමට තමාට ඇති හැකියාව, පරිසරය, අන්‍යෝන්‍ය සහයෝගය හා නිසි උපදේශය තමාට ලැබී ඇතැයි තම සිතතුල ධාරණය කරගත් විට මෙම ස්ථාවරත්වයට එළඹිය හැක. ව්‍යාකූල සිතකින් යම් කාර්යයක් ඉටුකරන පුද්ගලයා විසින් එම කාර්යය සම්පූර්ණයෙන් කඩාකප්පල් කරගනු ඇත. යුද සෙබලාගේ මෙම ස්ථාවර මනසිකත්වය මගින් මුළු හමුදාවේම ඒකීය අරමුණ පහසුවෙන් ඉටුකරගත හැක.

ස්ථාවර මානසිකත්වයක් ගොඩනැඟීම ආධුනික කාලසීමාවේ සිටම ක්‍රමවත්ව සිදුවිය යුතු ය. මේ සඳහා උපදේශකයින් හා නායකයින් ඉඳුරා ම වගකිව යුතු වේ. සිවිල් පුද්ගලයකු ලෙස හමුදාවට බැඳෙන පුද්ගලයාගේ සිත තම කාර්යයට හා පොදු අරමුණකට යොමුකරවීම පුහුණුවීම් රටාවේ සිද්ධාන්තයක් විය යුතු ය. පුද්ගලික චර්යා රටාව ක්‍රම ක්‍රමයෙන් වෙනස් කිරීම හා අවසානයේ එම පුද්ගලයාගේ සිත සම්පූර්ණයෙන් වෙනත් අරමුණකට යොමු කිරීම චර්යාවාදී මනෝවිද්‍යාව අනුව සිදුකළ හැක. මෙය නවීනවිද්‍යාවේ දියුණුවත් සමග ලොවට ප්‍රථමයෙන් හෙළිකලේ ජේබී වොට්සන් නමැති ඇමරිකානු මනෝවිද්‍යාඥයා විසිනි. මෙම සංකල්පය වර්තමාන ඇමරිකානු හමුදා ව්‍යුහය තුළ ඉතා ප්‍රබල ලෙස භාවිතා වේ. මෙමගින් යුද සෙබලුන්ගේ සිත ක්‍රමානුකූලව පරිවර්ථනයකට ලක් කර එක් අරමුණක් කරා යොමු කරවනු ලැබේ. ඔවුන් මෙය Transition of individual mind concept යනුවෙන් පුහුණු කාලසීමාවේ සිටම ඉතා ක්‍රමානුකූලව සිදු කරනු ලබයි.

### යුධ සෙබලකුගේ ස්ථාවර මානසිකත්වය (Mental Solidity)

ඕනෑම සෙබලකු හෝ නිලධාරියකු තමා හමුදාවටබැඳුණුවිට තම සිත්තුල ඇඳි තිබූ පින්තූරයට බොහෝ වෙනස් ජීවන රටාවකට හමුදාවට බැඳුනාට පසුව මුහුණ දීමට සිදුවේ. මෙයට හේතුව වනුයේ බොහෝ අයහට හමුද ජීවිතය ගැන බැඳීමටප්‍රථම තිබූ නොදැනුවත්කමය. එවිට අවශ්‍ය වන ඉතාම වැදගත් කාර්යය නම් ඉතා ඉක්මනින් නව පරිසරයකට හා නව ජීවන රටාවකට සරිලන සේ තම මනස ගොඩනගා ගැනීමයි. (Syncronizing the mind)

යුද හමුදාවට බැඳීමට තමා විසින් ගත් තීරණය සැම විටම නිවැරදි යැයි සිතීමට තම සිත පුහුණු කිරීම මෙහි දී වැදගත් වේ. තමා නොදුටු, නොපැතු ලොවකට පිවිසීමට තීරණය කලේ තමා නම් එයතුළ ජීවත්වීමට තම සිත ස්ථාවරත්වයකට පත් කරගත යුතුවේ. මෙහි දී යම් අයෙකුට තම සිත පාලනය කරගත නොහැකි වූ විට හමුද ජීවිතයෙන් පලායාමට පෙළඹේ. මනෝ විද්‍යාවට අනුව තම සිත තමාට තේරුම් ගත නොහැකි පුද්ගලයා ආත්මාභිජේක්ෂණය (Egocentric) නොමැති අයකු ලෙස හඳුන්වනු ලබයි. එනම් තමාට තමුන්ගැන විශ්වාසයක් නැති තත්ත්වයයි. (Lack of self - Esteem) මෙම කුලයට අයත් පුද්ගලයින්ගේ චර්යා රටාවද- අවුල් සහගත වේ. එවන් පුද්ගලයින්ගේ අභ්‍යන්තරික වශයෙන් පොදුවේ පහත ලක්ෂණ දකිය හැක.

1. පුද්ගලික ජීවිතය මහත් අවුල්කාරීවීම
2. විවාහ ජීවිතය අවුල්කාරීවීම
3. නිතරම අසහනයෙන් ගත කිරීම
4. සැමවිටම අන් අයව අවිශ්වාස කිරීම
5. තම ඇඳුම් පැළඳුම් හෝ කෑම බීම ගැනවත් සැලකිල්ලක් නොදැක්වීම ආදියයි.

කෙසේ වුවද, සිවිල් නිදහස් ජීවන රටාවක සිට හමුද ජීවන රටාවකට පිවිසෙන පුද්ගලයකුගේ මානසික ස්ථාවරත්වය ඇති කිරීම පහසු නැත. මෙම ක්‍රියාදමය ඉතා සූක්ෂමය හා සැලසුම් සහගතව සිදුවිය යුතුයි. පුහුණුව ලබන අවධියේ සිට පුහුණු සෙබලකුගේ තත්ත්වයටත්, එතැනින් රාජකාරී තත්ත්වයන්ටත් මුහුණදීමේ දී මෙම මානසික ස්ථාවරත්වය ක්‍රමානුකූලව සිදු නොවීමෙන් යමෙකු මානසික රෝගියකු වීමට ද ඉඩ ඇත.

ඕනෑම සාර්ථක සෙබලකු තුළ තිබිය යුතු අත්‍යවශ්‍යම සාධකය වනුයේ නිවැරදි දෘෂ්ඨියයි. (Correct vision) තමාගේ සිත තමාට අවනත කර ගත් විට මෙම නිවැරදි දෘෂ්ඨිය හෙවත් දැකීම ලැබෙනු ඇත. තමා කළ යුතු කාර්යය පිළිබඳවත්, තමාගේ හැකියාව පිළිබඳවත් තමාට ලැබෙන සහයෝගය හා එම කාර්යේ අවසාන ප්‍රතිඵලයකුමක් ද යන්නත් නිවැරදිව දකීමට නම් මෙම ස්ථාවර මානසිකත්වය තුළින් නිවැරදි දැකීම ලබාගත යුතුය. මෙමස්ථාවර මානසිකත්වය ලබාගත් යුද සෙබලා තම හමුද ජීවිතය හා සිවිල් ජීවිතය කිසිදු අවුලකින් තොරව වෙන් වෙන්ව තෝරා බේරාගෙන ඉතා සාර්ථක ජීවිතයකට පිවිසෙනු ඇත.

මෙම ලිපියෙහි දෙවන කොටස වශයෙන් යුද්ධය පවතින විට බයට මුහුණ දෙන සෙබලාගේ මනසෙහි සිදුවන ක්‍රියාදමය විග්‍රහ කිරීමට මා අදහස් කරමි. මෙම ලිපිය සැකසීමේ දී මා විසින් කිසිදු කරුණක් වෙනත් ලිපියකින් හෝ පොතකින් උපුටා නොගත් අතර, ප්‍රධාන වශයෙන් අහඹු ලෙස තෝරාගත් සෙබලුන් හා නිලධාරීන් සමග කළ සාකච්ඡාවන් ගෙන් හා මෙතෙක් මා ලත් අත්දැකීම් යොදා ගතිමි. මෙය හුදෙක් නිදහස් පර්යේෂණාත්මක ලිපියක් වන අතර, ඔබගේ විවේචන හෝ අදහස් මා ඉතා අගය කරමි.


ජේආර් කුලතුංගපීඑස්සී
ලුතිතන් කර්නල්
(Dip inPsy Ops - USA)


## ගගයි කෙතයි

ගගක් වූ ඔබේ සෙනෙහෙ දිය
තිබුන ද වේලි බැඳ
සිර කොට....
දනිමි නිසැකවම
වේලි බැඳි පිරිතිරි
සරු කරන බව
මා සිත් කෙත


2/ලුතිතන් තරිඳු වීරසිංහ
2 ශ්‍රීලපාහ
මාවඩිවෙම්බු යුහ කඳවුර
මඩකලපුව

# වෙසක් පහන් කූඩු තරගය



*1998 මැයි මස 11 දින වෙසක් උත්සවය වෙනුවෙන් 2 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුවේ ප්‍රධානත්වයෙන් වව්නියාව ඊරට්ටපෙරියකුලම් යුධ හමුද කඳවුරේ වෙසක් පහන් කූඩු තරගයක් පැවැත්වූ අතර, එම අවස්ථාව සඳහා 4 ශ්‍රීලපාහ මැදමූලය, 5 විපාරෙ පසුමූලය, 8 විපාරෙ පසුමූලය, 9 විපාරෙ පසුමූලය, 2(සෙව්) විපාරෙ පසුමූලය, 1 කරෙ, සහ 2 කමාන්ඩො පසුමූලය සහභාගී වූ අතර, මෙම ඒකක මැද මූලය වෙතින් නිර්මාණය කරන ලද වෙසක් පහන්කූඩුව "ප්‍රථම ස්ථානය" ලබාගත්හ. එම පහන් කූඩුවේ දර්ශනයක් ඉහත ජායාරූපයෙන් දැක්වේ.*

*සෙ/15 871 කෝප්‍රල් සරත් පිළිවී*
*බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ*

# සාමයේ පරවියා දැන්වත් ඉගිලීයන්

රට දය රැකගන්නට යුද පෙරමුණට — ගිහින්
සෙබලුන් විලස ඇත ඔබ ගිනි අවිය — අරන්
සතුරන් සමග කරනා විට දරුණු — සටන්
ඔබ සැම රැකදේවි දෙවිඳුන් සුමන — සමන්

තැබූපය පෙර මිස පස්සට ගන්නට — එපා
හොරකොටි ගෙරව්වට ඔබ බිය වෙන්ට — එපා
විනයට පටහැනිව කිසිවිට යන්ට — එපා
ජයගෙන මිසක පස්සට නම් එන්ට — එපා

යුද නාවික ගුවන් හමුද බල — ඇණියේ
සෙබලුන් සමග සහයට එන පොලීසි — යේ
ග්‍රාමය රකින අනෙකුත් හට පිරිස් දයේ
උරුමය ඔබට සිරිලක් මව රකින — පැයේ

සෙබලුනි 'සෙබලියනි' සිරිලක් මව — රකින
ඔබකල මෙහෙය ඇති මහමෙර උසට — පැන
දුක්කම් කටොලු විඳ සේවය කරන — දින
ලැබේවා ඔබට සම්මා සම්බුදු — සරණ

ඇළදොළ වැව් පොකුණු ගංගා පිරී — යන්
හැම ගහකොළයකම අතුපල බර වී — යන්
රත්වන් ගොයම් කරලින් කෙත් සරුවී — යන්
'සාමයේ පරවියා' දැන්වත් ඉගිලී — යන්

සෙ/5ඩි00052 සැරයන් පුංචිබංඩා
5 ශ්‍රීලපාහ 'සී' කණ්ඩායම
යුද හමුද කඳවුර - රක්කත්ඩි

# සොරකමින් වංචාවෙන් නොව මිනිස්කමින් ලොව ජයගන්න

දුක් කම්කටොළු පිරි, දහසක් අවහිර බාධක මධ්‍යයේ දේශයේ සුරැකීමේ උදරතර අදහසින් යුද වදින මුර දේවතාවනි ඔබටත් අනෙකුත් සියළු දෙනාටත් මෙය ආදර්ශයක් වේවා.

7 ශ්‍රීලපාහ ඒකකයේ පාලන කණ්ඩායමේ සේවය කරන අම්පාර නගරයට ආසන්න කටුක ගම්මානයක සිට තමා ඉපදුන නිවහල් දේශය රැකගැනීමේ මූල පරමාර්ථය පෙරටු කරගෙන තම අම්මා, තාත්තා හා එකම නැගනිය කිසියම් ස්ථාවරත්වනයකට ගෙන ඒමේ අධිටනින් දිළිඳු පවුලකින් යුද හමුදවට එක් වූ ඔහු සෙ/309093 සාමාන්‍ය සෙබළ ජයවර්ධන ඩීඑම් යනුවෙන් හැඳින්වුවහොත් මා නිවැරදිය.

මාසයක් පාසා ඔහු ලබන වැටුප දුප්පත් අම්මා, තාත්තා හා එකම නැගනිය වැටී සිටින දිළිඳු කම නමැති ආගාධයෙන් ගොඩ ගැනීමට විය පැහැදම් කළේ ය. මේ අතර ඔහු සිහිනෙකින්වත් නොසිතූ දෙයක් සිදුවිය. හිරු අවරට යන මොහොතක ඉදිරි ආරක්‍ෂක වලල්ලේ තම මිතුරන් ද සමග රාජකාරී සඳහා පියමන් කරන අතර තුර ඔහුගේ පසුගිය මාස දෙකක වැටුප හා ලියකියවිලි ද සහිත මුදල් පසුම්බිය නැතිවිය. ඔහුද එය දැනගත්තේ පසු දින සවස් වරුවේය. ඔහුගේ සිතේ තිබුණු සියළු බලාපොරොත්තු නිශ්ඵල විය. ඔහු දස අත කල්පනා කරන්නට විය. ගිය ගිය තැන ඔහු සෙව්වේ තම මුදල් පසුම්බියයි. මන්ද ඔහුගේ පවුලේ සියළු අයවළුන් රැකුණේ ඔහු ලබන මාසික වැටුපෙන් බව මා ද හොඳකාරව දනිමි.

ලබන්නාවූ සිංහල අලුත් අවුරුද්දට ඔහු සිතා සිටියේ තමා ළඟ තිබූ එම මුදල් ද රැ ගෙන ගොස් එම මුදලින් ආදරණීය අම්මාත්, තාත්තාත් එකම නැගණියටත් අළුත් රෙදිපිළි හා අනෙකුත් අවශ්‍යතා ඉටු කර දී එම දිනය ප්‍රීතියෙන් ගත කිරීමට ය. ඔහුගේ දෙමාපියන් ද මහ මග බලා සිටියේ ඔහු එනතුරුය.

දිනෙන් දින කාලය ගෙවී යන්නට විය. මේ අතර අප බළඇණිය හා අත්වැල් බැඳ සිටින 8 වැනි බළඇණිය ගජබා රෙජිමේන්තුවේ සෙබළකු සැඳෑ සමයේ තම හුරු පුරුදු රාජකාරිය සඳහා බංකරය බලා පියමන් කරන්නට විය. ඒ යන අතර මගදී ඔහු එකෙනහිම දුටුවේ මුදල් පසුම්බියකි. ඔහු එය අතට ගත් විගස තමා භාරව සිටින එම ඒකකයේ බුද්ධි නිලධාරී අතට භාර දෙන ලදී. හෘද සාක්‍ෂියට එකඟවම එම සෙබලා මේ දෙස සිතුවා විය හැක.

'මෙය අන්සතු දෙයක්, මෙය අයිති තැනැත්තා මා වැනිම දිළින්දෙකි. මෙය ඔහු අතට කෙසේ හෝ පත්කළ යුතුමය'

බලන්න ඔහු කෙතරම් නිහතකමානී සෙබලෙක්ද? සෙබළකුගේ උතුම් ගුණාංග වන අංවක බව, ගුණගරුක බව කාර්යශූරත්වය, චිත්ත ධෛර්යය යන සියළුම දේ ඔහුගේ හදවතෙහි ගැබ් වී ඇති බව පැවසීමට තවත් අටුවාටීකා අවශ්‍ය නැත. එම මුදල් පසුම්බිය තිබූ අයුරින්ම ඔහු හට මෙම ඒකක බුද්ධි නිලධාරී විසින් නැවත භාර දෙන ලදී.

අද ඔහු තම අම්මාත් තාත්තාත් එකම නැගිණියත් සමග එක් වී අවුරුදු සැමරීමට නිවාඩු යාමට මග බලා සිටී ඔහු අද එසේ නිවාඩු ලබා යන්නේ එම සොහොයුරාගේ අවංක නිහතමානී ගුණගරුක බව නිසා බව පුන පුනා කිව යුතුය.

එසේනම් රට දැය රකින සෙබළ සොයුර / සොයුරියණි මෙය ඔබටත් අනෙකුත් සියළු දෙනාටත් මහඟු ආදර්ශයක් වනු ඇත.

අමිත ගුණ නුවන යුතු උතුමෝ පබඳ
අනත වෙහෙස ලදුවත් නොමවෙති දුහඳ
දිගත පතල සුවඳැති සොඳ සඳුන් කඳ
සිඳින මඩින එක ලෙස පැතිරෙයි සුවඳ

ගුණ නුවන යන දෙකෙන් පිරිපුන් පුද්ගලයා නොයෙකුත් කරදර හිරිහැර ලැබුනත් දුෂ්ඨ නොවන අතර, පැතිරෙන සුවඳ ඇති සඳුන් ලීය කපා පොඩි කරන කල්හි ද එක සේ සුවඳ විහිදුවති. 'සුභාෂිතය' වැනි අගනා කෘති මගින් ද ලොවට හෙලි කරන ලද්දේ මෙවැනි පුද්ගලයින් ගැන බව ඔබ අප වටහා ගත යුතුය.

අන්සතු දේ ගැන ඇළුම් නොකර ඒ උතුම් ගුණගරුක සෙබළාගේ ක්‍රියා කලාපය අප ආදර්ශයට ගත යුතුය. තව තවත් එවැනි ගුණගරුක පුතුන් මව්වරුන් හට බිහිවේවා. එවැනි පුතුන් අප අතරටම චිත් නිවහල් දේශය පර සතුරන්ගේ බේරා ගැනීමට ශක්තිය ධෛර්යය ලැබී සාමයේ අරුනළු මේ පුංචි මිණි මුතුවේ පතුරවන්නට අවස්ථාව ලැබේවායි මාගේ එකම ප්‍රාර්ථනයයි.

සෙ/307246 ලාකෝ
අත්තනායක ඒඑම්ජ්ජේඑස්කෝ
මූලස්ථානය 7 ශ්‍රීලපාහ
යුහ කඳවුර, නුවර පාර,
කිලිනොච්චිය.

## TO WHICH CATEGORY YOU BELONG

| A | | B |
|---|---|---|
| SECOND LIEUTENANT | - | LEARNING SOMETHING<br>DOING EVERYTHING |
| LIEUTENANT | - | KNOWS EVERYTHING<br>DOING SOMETHING |
| CAPTAIN | - | DON'T KNOW ANYTHING<br>DOING EVERYTHING |
| MAJOR | - | KNOWS EVERYTHING<br>DOING NOTHING |
| LT/COL & ABOVE | - | KNOWS SOMETHING<br>DOING SOMETHING |

MATCH EACH OTHER FROM PART "A" TO "B")

2/LT RKDN CHANDRADASA, SLLI
7 SLLI

## ජීවිතය මල් යානාවක් නොව එළිමහන් සිරගෙයකි.

අද අපේ ජීවිත තල් වැටකට හෝ මායිම් ගම්මානයකට සීමා වී ඇත. දෙමව්පිය අඹුදරු සහෝදර සහෝදරියන් අත්හැර දමා අප රට ජාතිය ආගම වෙනුවෙන් සටන් වදින්නෙමි. ජීවිතයේ මල් වයසේ පසුවන අප වැනි සහෝදර රණවිරුවන් පසුවන්නේ එළිමහන් සිරගෙයක ය. තල් අරඹේ සිට ආදර බිරිඳට හෝ දරුවාට ආදර හසුනක් ලියන්නේ සිත සනසා ගැනීමටය. සිත් පිත් නැති කොටියා මාන බලා ඉන්නේ අප බිලි බැමට වුව ද අප පසුවන්නේ ඉමහත් සන්තෝෂයෙන් සහ ඉමහත් ප්‍රීතියෙනි. අපේ ආදර බිරිඳ දරුවන් දෙමව්පිය සහෝදර සහෝදරියන් පෝෂණය කරනු අදිටනින් වුවද එයත් එක් අන්දමකින් බිලිගන්නා විට ජීවිතය ගෙවෙන්නේ එළිමහන් සිරගෙයිමය.

සෙ/303811
සාසෙ හපුආරච්චි එච්ජ්එස්
7 ශ්‍රීලපාහ "බී" කණ්ඩායම
නුවරපාර - කිලිනොච්චිය)

## හදවත දිනන මග

මිනිසුන් සමග කටයුතු කිරීමේ මූලික උපක්‍රම :

1. මිනිසුන් හෙලා දැකීමේ වෙනුවෙන් ඔහුන් තේරුම් ගැනීමට අපි උත්සාහ කරමු.
2. හොඳ ගතිගුණ පිළිගැනීමේ දී හිතවත් වන්න. ප්‍රශංසා කිරීමේ දී නොපසුබටවන්න.
3. ඔබට උවමනා දෙය නොව ඔහුට උවමනා දෙය ගැන ක්‍රියාකර එය ලබාගත හැකි ආකාරය ඔහුට පෙන්වා දෙන්න.

මිනිසුන්ගේ කැමැත්තට භාජනය වීමේ ක්‍රම හයක්

1. අනෙක් මිනිසුන් කෙරෙහි අවංකව උනන්දු වන්න
2. සිනා සෙන්න
3. මිනිසුන්ගේ නම ඔහුට භාෂාවෙහි තිබෙන මිහිරිම හා වැදගත් කම හඬ බැව් මතක තබාගන්න.
4. හොඳ සවන් දෙන්නෙකු වන්න. තමන් ගැන සමකරන්නට අනෙක් මිනිසුන් දිරිගන්වන්න.
5. අනෙක් මිනිසා උනන්දුව දක්වන දෙය ගැන කථා කරන්න.
6. අනෙක් මිනිසාට තමා වැදගත් යැයි හැගෙන්නට සලස්වන්න. එය අවකංව කරන්න.

නි/62974 2/ලුතිතන් කේආර් තුඩුගල. ශ්‍රීලපාහ
7 ශ්‍රීලපාහ "බී" කණ්ඩායම
(මෙම නිලධාරී 96/05/23 දින ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් මියයන ලදී.)

# බිරිඳටත් සාධාරණ වැටුපක්

යමෙක් සහකාරියක් සමග නීත්‍යානුකූලව විවාහවීමෙන් පසු ඇය ඔහුගේ බිරිඳ වේ. ඇය "මාගේය" යන්න අර්ථවත් කර දක්වීමේ දී මාගේ බිරිඳ යනුවෙන් ව්‍යවහාර කිරීමෙන් වරදක් නොවේ. මාගේ බිරිඳ ඇය ඉටුකරණ සේවය සඳහා සාධාරණ වැටුපක් මාසිකව ගෙවන ලෙස මාගෙන් ඉල්ලීමක් කළහොත් එයට කිසිසේත්ම එකඟ විය හැකිද? හේතුව මා උපයන වැටුප ප්‍රමාණවත් නොවන බැවිනි.

පවුල් සන්ධානය ගොඩනැගීමේ දී විටෙක බිරිඳ (ඇය) අප නිවසේ මෙහෙකාරිය වශයෙන්ද. විටෙක ඇයදරුවන් බලාගන්නා ආදර බර තැනැත්තිය ද වේ. විටෙක ඇය නිවසේ වඩු කාර්මිකයෙකු වශයෙන් ක්‍රියා කරණ අවස්ථා ද නැත්තේම නොවේ. තවත් විටෙක ඇය ගෙවත්තේ වැඩකරණ කම්කරුවා ද වෙයි. වරෙක ඇය අපගේ රෙදි සෝදන්නිය වන අතර, අපගේ කෑම පිළියෙළ කර දෙමින් කුස්සි අම්මාගේ ද චරිතය ඔපවත්ව නිරූපණය කරයි. විටෙක අප අසනීපයෙන් පසුවන අවස්ථාවලදී අපට සාත්තු සප්පායන් කරණ ඇය නිවසේ, පවුලේ කරුණාවන්ත හෙදිය යැයි පැවසුවහොත් එය නිවැරදි වේ. තවත් විටෙක ගෙදරට එන යන්නන් සුහද මුඛයෙන් පිළිගැනීමේ දී පිළිගැණීමේ නිලධාරිණියකගේ භාරදූර කර්තව්‍ය ද ඇය උසුලන්නීය. ඒ වගේම දූ දරුවන් අතරේ අමතර ඉගෙනීම් කටයුතු වලදී ඇය නිරන්තරයෙන්ම නිවසේ සුහදසීලි කරුණාවන්ත ගුරුවරියකගේ ද චරිතය ද මැනවින් නිරූපණය කරයි.

තව ද විටෙක දරුවන්ගේ පමණක් නොව මාගේ ද මව වශයෙන් කටයුතු කරණ මැය සැපතේ දී මෙන්ම විපතේ දීත් මා දිරිමත් කරණ ළඟින්ම දුක සැප බෙදගන්නා කල්‍යාන මිතුරිය වන්නේ මැයයි.

සැපතේ දීත් විපතේදීත් මා දිරිමත් කරමින් සෙනෙහස ආදරය නොඅඩුව ලබා දෙමින් මා අභියස සෙවනැල්ල මෙන් නොසැලී ක්‍රියා කරන ඇය කීකරු භාර්යාවකි. ඇයගේ උතුම් සේවයට පඩක්කම් නොලැබුනත් මාස්පතා ගෙවිය යුතු "සාධාරණ වැටුපක්" නම් මුදලින් නොව රන් රිදී මුතු, මැණික් වලින්වත් ගෙවා එහි වටිනාකම මිළ කළ හැකිද? සෑහීමකට පත්විය හැකි වන්නේ ද?

සැකසුම
සෙ/11827 බනි II අනුර පීජ්එත්




# ජයසිකුරු ක්‍රියාන්විතය පිළිබඳ විස්තර


වව්නියාව කිලිනොච්චි මාර්ගය අත් පත් කර ගැනීමේ පරම චේතනාවෙන් දියත් කෙරුණු 'ජයසිකුරු ක්‍රියාන්විතය ඉතා දුෂ්කර ගමනක් යෙදවීමෙන් මේ වන විට මාන්කුලම් කොටි බළකොටු ප්‍රදේශයදක්වා තම අණසක පතුරුවා ඇත.

මාන්කුලම් ප්‍රදේශය සතුරාගේ තවත් ප්‍රබල මංසන්දියකි. ක්‍රියාන්විතයේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා මෙම ප්‍රදේශය අනිවාර්යයෙන්ම හමුද අණසක යටතට ගැනීම කළ යුත්තක්ව තිබුණි. එහි එක් පියවරක් වශයෙන් 'ඕලුමඩු' ප්‍රදේශය ත්‍රස්ත ග්‍රහණයෙන් මුදවා ගන්නා ලදී. එහි දී මාන්කුලම් ප්‍රදේශයට නැගෙනහිරින් හමුද බලය තහවුරු වන්නට විය. එසේ ද මාන්කුලම් ප්‍රදේශයේ බටහිර දෙසින් ද එවැනි ම ප්‍රදේශයක් රජයේ හමුද යටතට ගැනීමේ අරමුණ වී තිබුණේ කොටි ත්‍රස්තයින් තුන් පැත්තකින් අවහිර කිරීම සඳහායි.

1998.02.10 දින ආරම්භ කෙරෙනු ක්‍රියාන්විතයේ අරමුණ වී තිබුණේ මාන්කුලම් ප්‍රදේශයට බටහිරින් තුනුක්කායි මාර්ගය අල්ලා ගැනීම සඳහා දනට අත්පත් කරගෙන ඇති ප්‍රදේශයෙන් ඉදිරියට පාදස්ථානයක් පාද ගැනීමයි. මෙම ක්‍රියාන්විතය සඳහා ගුවන් සංක්‍රමික බළසේනාව ඇතුළු බළඇණි කිහිපයක් සහභාගී වන ලදී. මෙහිදී '3 ශ්‍රීලපාහ' ඒකකයට පැවරී තිබුණේ ඉදිරි ආරක්‍ෂක වළල්ලේ සිට කිලෝ මීටර් 02 ක් පමණ දුරින් පිහිටා තිබූ ජීප්රථ මාර්ගය දක්වා ඉදිරි ප්‍රහාරක කටයුත්තකි. අප ඒකකයට බටහිර දෙසින් 1 ගැමුණු හි එක් කණ්ඩායමක් ද නැගෙනහිර දෙසින් 6 ගරෙ කණ්ඩායමක් ද ප්‍රහාරක රාජකාරියෙහි යෙදුණි. තව ද වම් පැති ආරක්‍ෂාව 1 ගැමුණු හා දකුණු පැති ආරක්‍ෂාව 6 ගරෙ හා 1 ශ්‍රීලංසිරෙ ඒකක වලින් සිදුකළහ.

98.02.08 දින අණදෙන නිලධාරීගේ අණසක නියෝග වලින් පසුව ඒකකයේ සියලුම හට පිරිස 98.02.09 දින උදසනින්ම ඉදිරි ආරක්‍ෂක වලල්ල සමීපයට පැමිණෙන ලදී. ශ්‍රී ලංකා ගුවන් හමුද ආවරණ යටතේ මෙම ආරක්‍ෂක වළල්ල පැවතිනි. 98.02.09 දින 1200 පැයට අප ඒකක විමර්ෂණ කණ්ඩය විශේෂ බළකායේ කණ්ඩයක් සහ 'බී' කණ්ඩායම ඉදිරි ආරක්‍ෂක වළල්ලෙන් නික්මෙන ලදී. මේ අරමුණ වූයේ ඒකකයේ අනිකුත් හට පිරිස් වලට ප්‍රථම ඉදිරි භූමිය නිරීක්‍ෂණය කිරීම සහ අනිකුත් හට පිරිස් වල ඉදිරි ගමනට ආවරණය සැපයීමය. සවස 1600 පැය වන විට එම හට පිරිස් ලැගුම් ගන්නා ස්ථානය දක්වා ගමන් ගන්නා ලදී. එහි දී විමර්ශණය වූයේ ඉදිරියේ සතුරු ක්‍රියාකාරකම් පවතින බවයි. එබැවින් නියෝගවල අණුව ලැගුම් ගන්නට නියමිතව තිබූ ස්ථානයෙන් මීටර් 300 ක් පමණ දකුණින් ස්ථානගත වන ලදී. පසුදින 98.02.10 දින උදසන 0530 පැයට පමණ අනිකුත් හට පිරිස් හා සම්බන්ධවන ලදී. ඉන් අනතුරුව අප හට පිරිස් වලට සමාන්තරව මීටර් 1200







ක් පමණ බටහිරින් ගමන් කර 1 ගැහේබ හට පිරිස් හා සම්බන්ධවීම අරමුණ විය. එහි දී 1 ශ්‍රීලංසිරෙ හට පිරිස් ඉදිරියෙන් ගමන්කළ අප හට පිරිස් හා ඔවුන් අතර, සම්බන්ධතාවය පවත්වන ලදී. ක්‍රියාන්විතයේ තුන් වන අධියර වූ ජීප් රථ මාර්ගය අල්ලා ගැනීම සඳහා යුහුසුලු විය. එහි දී ඉදිරි ප්‍රහාරක කටයුතු සඳහා වම් පසින් 1 ගරෙ එක් කණ්ඩායමක් ද, අප ඒකකයේ ඒ බී සී කණ්ඩායම් සහ 6 ගැහේබ එක් කණ්ඩායමක් ද ස්ථානගත වන ලදී. ඉතාමත් සුපරීක්‍ෂාකාරිව ඉදිරියට ගමන්කළ හට පිරිස පියවර 300 පමණ ගොස් එදින එහි ස්ථානගත වන ලදී.

98.02.11 දින නැවතත් ඉදිරියට යාම ආරම්භ කළ අප හට පිරිස් ස්ථානගත වී සිටි ස්ථානයේ සිට මීටර් 700 ක් පමණ ඉදිරියෙන් ගමන් කරමින් සිටිය දී ක්‍රියාන්විතයේ අරමුණ වී තිබූ මාර්ගය හමු වී ඉන් පසු එම මාර්ගයට පියවර 200 ක් පමණ උතුරින් අප හට පිරිස් ස්ථානගත වන ලදී. මෙහි දී තාවකාලික ආරක්‍ෂක වලල්ලක් තනා ගත් හට පිරිස් අල්ලාගත් ප්‍රදේශයේ බලය තහවුරු කර ගත්හ. මෙම කාර්යයේදී අප හට පිරිස් ත්‍රස්ථයන් හා ගැටුනේ එක් අවස්ථාවකදී පමණි. එය විශේෂත්වයක් විය. එය ද සිදුවූයේ මාර්ගය හරහා ඉදිරියට ගොස් එහි සිටි 'බී' කණ්ඩායමේ විමර්ෂණ පෙළ ඉදිරියට යාමේ දී එහි දී කිසිදු හටයෙකුට තුවාල සිදු නොවීය.

98.02.12 දින ද එම ස්ථානයේම හට පිරිස් ස්ථානගත වන ලදී. 98.02.13 දින අප ඒකකය මුදවා 9 ගැහේබ ඒකකය ආරක්‍ෂක වලල්ලේ ආරක්‍ෂාව නැවතත් සතුකර ගැනීමෙන් පසු අප ඒකක කණ්ඩායම් ආරක්‍ෂක වලල්ලේ වම් පෙදෙසට ගමන් කරන ලදී. එම ස්ථානයේ ස්ථානගතව සිටි 1 ශ්‍රීලංසිරෙ හට පිරිස් මුදවා අප ඒකකය එහි ස්ථානගතවන ලදී. පසුව 'බී' කණ්ඩායම නැවතත් එයින් මිදී බළඇණි මූලස්ථානය ස්ථානගතව සිටි ස්ථානයට පැමිණ එහි ලැගුම් ගත්හ. 98.02.12 දින අප ස්ථානගතව සිටි ආරක්‍ෂක වල්ලේ බටහිර දෙසින් අප ස්ථානගතව සිටි මාර්ගය දෙසට ගමන්කළ 1 ශ්‍රීලංසිරෙ ඒකකය මාර්ගය අසළට පැමිණීමත් සමගම ත්‍රස්තයන් ඔවුන්ට ප්‍රහාරයක් දියත් කරන ලදී. මෙම හේතුවෙන් නැවතත් 1 ශ්‍රීලංසිරෙ ඒකකයට මුලින්ම ස්ථානගතව සිටි ආරක්‍ෂක වලල්ල වෙත පසු බසින්නට විය. එම සිදුවීමෙන් පසුව ඉදිරි භූමිය නිරීක්‍ෂණය කළ අප ඒකක විමර්ෂණ කණ්ඩයට ග්‍රිඩ් අංක 619340 දරණ ස්ථානයේ සතුරු කඳවුරක් ඇති බවට තොරතුරු අණාවරණය විය. ඉන් අනතුරුව එම සතුරු කඳවුරට ප්‍රහාරයක් දියත් කිරීම අප ඒකකය වෙත පැවරුණි.

98.02.14 දින සතුරු කඳවුරට ප්‍රහාරයක් දියත් කරන ලදී. මෙහි දී 'ඩී' කණ්ඩායම ප්‍රහාරය සඳහා ද 'බී' කණ්ඩායම වම් පැති ආරක්‍ෂක කණ්ඩායම වශයෙන් සහභාගී වන ලදී. ඉතාමත් සූක්‍ෂම ලෙස ආරක්‍ෂක වලල්ලෙන් ඉදිරියට ගමන් කල 'ඩී' කණ්ඩායම සතුරු කඳවුරේ ආරක්‍ෂක වැට දක්වාම කුඩා කණ්ඩායම් වශයෙන් ගමන් කර එම වැටට සමාන්තර ඉදිරි ප්‍රහාරක කණ්ඩායම සූදනම් කිරීමෙන් අනතුරුව ඒ අනුසාරයෙන්ම සතුරු බංකර් දෙසට ගමන් කිරීමට විය. මෙහි දී 'බී' කණ්ඩායම ද ඉදිරියට ගමන් කරන 'ඩී' කණ්ඩායමට වම් පැති ආරක්‍ෂාව සපයමින් ඔවුන් සමග ඉදිරියට ඇදෙන්නට විය. නිමේෂයකින් සතුරු ජොනී බට්ටෙකුට අප හටයෙක් ගොදුරු විය. එම ශබ්දයත් සමග ත්‍රස්තයන් හා දරුණු සටනකට මුල පිරුණි. මෙහි දී ත්‍රස්තයන් සුළු අවි වලට අමතරව




ඔවුන්ගේ ආධාරක අවි ද උපයෝගී කර ගනිමින් ඉතාමත් නිවැරදිව ප්‍රහාර එල්ල කරනු අපට නිරීක්ෂණය විය. ඔවුන්ගේ මෝටාර් ප්‍රහාරය ඉතාමත් නිවැරදිව අප භට පිරිස් සිටි ස්ථාන වලට පතිත වූ බැවිනි. මෙහි දී අප කණ්ඩායම් දෙකෙහිම විශාල ප්‍රමාණයක් තුවාල වලට ලක්වන ලදී. ඒ අතර, මියයෑම් වලට ලක්වනලදී. එම දියත් කෙරුණු දරුණු සටනින් පසු 'ඩී' කණ්ඩායමේ සෙබලුන් සතුරු බංකර් තම යටතට ගන්නා ලදී (බංකර් 03) එහි සිටි සියළුම ත්‍රස්තයින් ජීවිතක්ෂයට පත්ව තිබුණි. අල්ලාගත් ස්ථානවල රැඳී සිටින්නට තරම් භට පිරිස් නොමැති කමින් අප ඒකකයට පසු බසින්නට විය. ඊට හේතුව වූයේ සතුරා සමග සටන්කල සෙබලුන්ගෙන් විශාල ප්‍රමාණයක් තුවාල වීමෙනි. සටන පැවතුන අතරතුර 6 ගරෙ භට පිරිස් ද අප සමග සහායට ආ නමුදු නිසි සැලසුමක් නොතිබුණු බැවින් ඔවුනට ඉදිරියට යාමට නොහැකි විය.

ඉතා සටන් කාමීව අල්ලාගත් බංකර් අතහැර නැවතත් පෙරදින සිටි ආරක්ෂක වලල්ල වෙත අප ඒකකයට පැමිණෙන්නට සිදු වූයේ තුවාලකරුවන් විශාල ප්‍රමාණයකුත් සහ මරණ විශාල සංඛ්‍යාවක් වූ නිසාය. මෙහි දී ඒකකයේ සිටි වීර සෙබලුන් 67 ක් දෙනෙකු තුවාල ලැබූහ. ඒ අතරින් නිලධාරී තිදෙනෙක් සමන්විත වූහ. මේ අතර මෙම ඒකකයට අයත් නවත් වීර සෙබලුන් අප අතරින් සදහටම සමුගත්හ.

**ක්‍රියාන්විතයේ ගත යුතු දෑ-**

ක්‍රියාන්විතයට පෙර විමර්ශණ කටයුතු සුපරීක්ෂාකාරීව සිදුකිරීම හා එහි පරිමාණ අනුව ක්‍රියාන්විතය සැලසුම් කිරීම

ක්‍රියාන්විතයට පෙර එය සිදු කරන්නට යන ප්‍රදේශයට කාලතුවක්කු නිසිලෙස පතිත කර ඒවා සටහන්කර තැබීම.

ක්‍රියාන්විතයට සහභාගීවන අනෙකුත් බළඇණි සමග පෙර පුහුණු ක්‍රියාත්මක කිරීම.

තුවාල කරුවන් ඉවත්කර ගැනීම, පතරොම් වෙඩි ද්‍රව්‍ය බෙදහැරීම පිළිබඳව නිසි සැලසුම් සකස් කිරීම හා ඒ අනුව ක්‍රියා කිරීම.

ක්‍රියාන්විතයට සහභාගීවන සියලුම දෙනා නිසි පරිදි දැනුවත් කිරීම.


සකස් කලේ
නි/62848 ලුති. එච්ජ්ජ්පන්සි ප්‍රභාත්. ශ්‍රීලපාහ
"බී" කණ්ඩායම - 3 ශ්‍රීලපාහ යුද හමුද කඳවුර. පුලියන්කුලම

# What's New

## තොරතුරු බිඳක්....

Major K J Jayaweera SLLI

### එතෙර පාඨමාලා නිලධාරී

කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව 98.03.09 සිට 98.06.13 දින දක්වා - ඉන්දියාව
නි/61040 මේජර් එස්ජේ විතානගම, ශ්‍රීලපාහ - 3 ශ්‍රීලපාහ

තරුණ නිලධාරී පාඨමාලාව - 98-05-11 සිට 98-09-26 දින දක්වා පාකිස්ථානය
නි/61024 මේජර් පීපීජේ ප්‍රියන්ත - 1 ශ්‍රීලපාහ
නි/61561 කපිතන් ඩබ්ලිව්එස්එන්ඩී තුඩගේන - 1 ශ්‍රීලපාහ
නි/61688 කපිතන් ඩීජීකේ දිසානායක - 4 ශ්‍රීලපාහ
නි/62159 කපිතන් කේවීඩීආර් ධර්මප්‍රිය - 10 ශ්‍රීලපාහ
නි/61768 ලුතිනන් එන්ජීකේ ගුණසේන - 4 ශ්‍රීලපාහ

මිඩ් කැරියර් පාඨමාලාව - පාකිස්තානය 98-04-06 සිට 98-06-27 දක්වා
නි/60959 මේජර් එම්පී ගුණසිංහ - 8 ශ්‍රීලපාහ
නි/61617 මේජර් ඊඑම්ශූ ඒකනායක - 7 ශ්‍රීලපාහ

භාණ්ඩ භාර නිලධාරී පාඨමාලාව - 98.03.23 සිට 98.05.16 දින දක්වා - ඉන්දියාව
සෙ/12210 බනි II විමලරත්න ඊඑම් - 10 ශ්‍රීලපාහ

### විවාහ වීම් නිලධාරී

නි/60876 මේජර් ඩබ්ලිව්ඩීආර්ජේපී කුමාර ශ්‍රීලපාහ, 1997.12.20 වන දින ජයබිම වලව්වත්ත මාවනැල්ල මහලියගේ නිවසේ දී නයනා රසාංජලී කුමාරප්පෙරුම මෙනෙවිය සමග විවාහ විය.

නි/61250 කපිතන් ඩීජ්ආර් ඇන්තනි ශ්‍රීලපාහ 97.02.24 වන දින රාගම රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී අන්තෝනිදූර නදීෂා සුරේෂනි සිල්වා ගුණතිලක මෙනවිය සමග විවාහ විය.

නි/63041 ලුතිනන් ඩබ්ජීපී ගුණරත්න ශ්‍රීලපාහ 97.12.26 දින ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම අතිරේක දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී වලව්වත්ත අලගියවන්න මොහොට්ටි අප්පුහාමිලාගේ ඉඳු සංජීවනී අලගියවන්න මෙනවිය සමග විවාහ විය.

නි/62869 ලුතිනන් ඩබ්එම්එස්බී වලිසන්දර ශ්‍රීලපාහ 97.08.15 දින තුන්පන් කොටගල විවාහ ලේකම් කාර්යාලයේ දී දිසානායක මදියන්සේලාගේ දිල්රුක්ෂි ප්‍රදීපිකා කුමාරි දිසානායක මෙනවිය සමග විවාහ විය.

නි/3585 කපිතන් ජීඑල්එල් කිත්සිරි ශ්‍රීලපාහ තත් නිලධාරි 97.10.20 වන දින මානලියගේ නිවසේ දී කලුතන්ත්‍රි පටබැඳි තනජ නිරෝෂනී මෙනවිය සමග විවාහ විය.

නි/4618 2/ලුතිනන් ඊස්පෙන් අලුත්ගෙදර ශ්‍රීලපාහ තත් නිලධාරි 97.03.31 වන දින උකුවෙල විවාහ ලේකම් කාර්යාලයේ දී වෙඩික්කාර ගෙදර ශාන්තිලේඛා මෙනවිය සමග විවාහ විය.

නි/3433 කපිතන් ඩබ්ඩීආර් ගුණසේකර ශ්‍රීලපාහ තත් නිලධාරි 97.09.04 වන දින අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්ගෙන් ලද විශේෂ බලපත්‍රය පිට මනාලියගේ නිවසේ දී මීපේ ගල්කැටිය ගමගේ සමන්ති ප්‍රියංගිකා මෙනවිය සමග විවාහ විය.

### දරු උපත් නිලධාරී/ සෙසු නිල

නි/62153 කපිතන් කේඑම්ඩබ් බංඩාර ශ්‍රීලපාහ ගේ බිරිඳට 1997.11.03 මහනුවර මහා රෝහලේ දී දුවකු උපනි. නම කේඑම් සඟිනි ප්‍රදීපනි බංඩාර

සෙ/11597 බනි 1 එම්එස් පද්මසිරි ගේ බිරිඳට 1995.06.01 ජයවර්ධනපුර රෝහලේ දී දුවකු උපනි නම මද්දුමගේ කලනි මයුනිකා

සෙ/13321 ව/සැර ඉලේසිංහ ඩීජේබී ගේ බිරිඳට 1997.08.29 පේරාදෙණිය රෝහලේ දී දුවකු උපනි. නම වමෝදා සඳරුවනි ඉලේසිංහ

සෙ/13544 සැරයන් කුලරත්න ආර්ඩීඑස් ගේ බිරිඳට 1997.12.18 අනුරාධපුර රෝහලේ දී පුතකු උපනි. කවිඳු ගිහාන් කුලරත්න

සෙ/14946 සැරයන් ජයරත්න කේඑම්එස් ගේ බිරිඳට 1997.05.26 වලස්මුල්ල රෝහලේ දී පුතකු උපනි. නම ජනිත් මධුපාන් ජයරත්න

සෙ/15909 කෝප්‍රල් ධම්මික ටී ගේ බිරිඳට 1997.10.06 යන රෝහලේ දී පුතකු උපනි. නම දිල්ෂාන් දෙවින්ද තෙන්නකෝන්

සෙ/300276 කෝප්‍රල් වික්‍රමසිංහ ඩබ්එම්එස්බී ගේ බිරිඳට 1998.03.03 අනුරාධපුර රෝහලේ දී දුවකු උපනි. නම ඩබ්එම් රශ්මි අමෝදා දිවාංජලී

සෙ/15903 කෝප්‍රල් වික්‍රමසිංහ ජීජී ගේ බිරිඳට 1998 අප්‍රේල් මස 22 දින මහනුවර මහ රෝහලේ දී පුතකු උපනි. නම සසංක දිල්ෂාන් වික්‍රමසිංහ.

සෙ/301149 කෝප්‍රල් සෝමචන්ද්‍ර ආර්එම්ඩී ගේ බිරිඳට 1997.09.11 වන දින කුරුණෑගල රජයේ රෝහලේ දී දුවකු උපනි. නම දරශනී චන්දිමා රත්නායක

සෙ/15353 සාසෙ ධමින් ගජධීර ඒ ගේ බිරිඳට 1997 අප්‍රේල් මස 30 වන දින මොහොට්ටි රෝහල මාතරහිදී දුවකු උපනි. නම සදිනි දිල්හාරා

සෙ/301506 සාසෙ මැන්පිට එම්ඩීඑයිජ්න් ගේ බිරිඳට 1997.11.19 වන දින පීඑච්ඩී දියෙස් අනුස්මරණ කාන්තා රෝහල පානදුර හිදී පුතකු උපනි. නම හෂාන් නිපුන

### විවාහ වීම් නිලධාරී/සෙසුනිල

සෙ/13708 සැරයන් ජයවර්ධන ඊපීඑන් 98.03.25 වන දින කුලියාපිටිය ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී දියතගල් පෙඩිරුරයලාගේ ශ්‍රියානි මංගලිකා අමරසිරි මෙනවිය සමග විවාහ විය.

සෙ/301936 කෝප්‍රල් දිසානායක ඩීඑම්එස්පී 98.03.06 වන දින ගම්පහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී කිස්තෝතු බඩුගේ චන්ද්‍රිකා මල්කාන්ති මෙනවිය සමග විවාහ විය.

සෙ/301109 කෝප්‍රල් ජයලත් ඊටීපී 97.12.04 වන දින හික්කඩුවේ අතිරේක රෙජිස්ට්‍රාර්ගේ අවසරය පිට අංක 80 ගාලවැව මනාලියගේ නිවසේ දී රංහාමිගේ රංජනී රත්නායක මෙනවිය සමග විවාහ විය.

සෙ/300157 කෝප්‍රල් සිරිමල් කුමාර ඩබ් 98.03.13 වන දින හදපාන්ගොඩ ලේකම් කාර්යාලයේ දී එපිටවල ආරච්චිගේ සජානා මෙනවිය සමග විවාහ විය.

සෙ/302627 ලාකෝ රණසිංහ ආර්එන් 98.03.09 වනදින කෑගල්ල දිස්ත්‍රික්කයේ මානියම්ගම විවාහ ලේකම් කාර්යලයේ දී ශ්‍රියා කුසම්ලත් මෙනවිය සමග විවාහ විය.

සෙ/302625 ලාකෝ රංජිත් යූජී 98.01.26 වන දින රද්දොලුගම විවාහ ලේකම් කාර්යාලයේ දී මලේකල් මල්කාන්ති මෙනවිය සමග විවාහ විය.

සෙ/303512 ලාකෝ ප්‍රේමසිරි එච්ඒ 98.02.02 වන දින හිරින්ද බටහිර විවාහ ලේකම් කාර්යාලයේ දී කොණ්ඩාරච්ගේ රාණි මෙනවිය සමග විවාහ විය.

## විවාහ වීම්

සෙ/304333 ලාකෝ දයානන්ද එස්වයි 98.01.16 වන දින ගලෙන්බිදුනුවැව විවාහ ලේකම් කාර්යාලයේ දී තම්මැටිවත්තර රම්‍යලතා මෙනවිය සමග විවාහ විය.

සෙ/304348 ලාකෝ විජේරත්න ඒපීජී 98.01.30 වන දින දඹුවැව විවාහ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී කළු අප්පුලාගේ චන්ද්‍රානි කුසුම්ලතා මෙනවිය සමග විවාහ විය.

සෙ/303532 ලාකෝ ජයන්ත කුමාර කේපීඑස් 98.05.22 වන දින දෙම්පේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්ගේ බලය පිට නැදුන්ගොල්ල මණ්ඩාවල මනාලියගේ නිවසේ දී බටවල ගමගේ ඉනෝකා කුමාරි මෙනවිය සමග විවාහ විය.

සෙ/300695 ලාකෝ රාජපක්ෂ ආර්එම්පී 98.04.27 වන දින කොටුමුදුන විවාහ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී වැවේගම් මහේලාගේ එරන්දිකා මානෙල් රත්නායක මෙනවිය සමග විවාහ විය.

සෙ/301124 ලාකෝ පෙරේරා එස්ඒආර් 98.04.04 වන දින පමුණුගම විවාහ ලේඛම් කාර්යාලයේ දී වික්‍රමකළුතොට හේවගේ අසිතා ද සිල්වා මෙනවිය සමග විවාහ විය.

සෙ/15895 ලාකෝ විජේසුන්දර ඩබ්එම් 98.05.06 වන දින තක්ගොඩපිටිය විවාහ ලේකම් කාර්යාලයේ දී වීරක්කොඩි පතිරන්නැහැලාගේ නිරෝෂිකා චාන්දනී වීරක්කොඩි මෙනවිය සමග විවාහ විය.

සෙ/302088 ලාකෝ ප්‍රියන්ත එස්ජ්‍යූ 97.11.17 වන දින යටියන්තොට විවාහ ලේකම් කාර්යාලයේ දී මහ වෙදගේ සමන්ති රම්‍යකාන්ති මෙනවිය සමග විවාහ විය.

සෙ/303573 සාසෙ කිංස්ලි කේ 98.04.08 වන දින උඩුදුම්බර බෝබැබිල විවාහ ලේකම් කාර්යාලයේ දී එගොඩගම වත්තේගදර සුලාරි නිල්මිණි මෙනවිය සමග විවාහ විය.

සෙ/303539 සාසෙ ප්‍රසන්න කේවීජ් 98.01.09 වන දින හික්කඩුවේ අතිරේක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී දේව ජානුකා ප්‍රියදර්ශනී ද සිල්වා සමග විවාහ විය.

සෙ/303581 ලාකෝ ප්‍රනාන්දු බීඩබ්ජ් 98.03.09 වන දින බදුල්ල ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී රන්කොත් ජේඩිගේ චම්පිකා සේනා කුමාරි මෙනවිය සමග විවාහ විය.

සෙ/14598 සැරයන් අමරසූරිය ඩබ්එම් 19998.02.02 දින නෙළුන්දෙණිය විවාහ ලේකම් කාර්යාලයේ දී ජේ එම් වසන්ති ජයසූරිය මෙනවිය සමග විවාහ විය.

සෙ/15275 කෝප්‍රල් රාජපක්ෂ ආර්පීආර් 1998.03.18 පලපොලුව මනාලියගේ නිවසේ දී එම්කේඩීඑස් රාජපක්ෂ මෙනවිය සමග විවාහ විය.

සෙ/15933 කෝප්‍රල් කීර්තිරත්න පීඑල් 1998.02.06 මරදන්කඩවල විවාහ ලේකම් කාර්යාලයේ දී කේ සුසිලා මාලිගාවත්ත මෙනවිය සමග විවාහ විය.

සෙ/302350 කෝප්‍රල් ජයසිංහ පීජීජී 1997.12.25 වන දින තුම්පනේ විවාහ ලේකම් කාර්යාලයේ දී කේඑම් ශ්‍රියානි මානෙල් කුලතුංග මෙනවිය සමග විවාහ විය.

සෙ/301850 ලාකෝ සනත්කුමාර පීජී 1997.10.20 ගෝනදෙණිය විවාහ ලේකම් කාර්යාලයේ දී කේජී සන්ධ්‍යා කුමාරි මෙනවිය සමග විවාහ විය.

සෙ/301890 ලාකෝ ප්‍රේමසිරි යූජී 1996.08.01 දින මහනුවර විවාහ ලේකම් කාර්යාලයේ දී පීජී ශ්‍රියානි ප්‍රියදර්ශනී මෙනවිය සමග විවාහ විය.

සෙ/15871 කෝප්‍රල් සරත් පීඑච් 1993.09.02 කොටහේන මනාලියගේ නිවසේ දී කේජී ධම්මිකා ප්‍රියදර්ශනී මෙනවිය සමග විවාහ විය.

සෙ/304242 ලාකෝ වෙලත්තලාව වීපීආර් 1998.02.09 මුරුතවල රෙජිස්ටාර් කාර්යාලයේ දී පීජී ඉන්ද්‍රාණි කුසුම්ලතා මෙනවිය සමග විවාහ විය.

සෙ/305018 ලාකෝ බණ්ඩාර ආර්එම්එම්කේ 1998.04.24 කරපල විවාහ ලේකම් කාර්යාලයේ දී උදේනි කුමාරි සෙනවිරත්න මෙනවිය සමග විවාහ විය.

සෙ/303959 ලාකෝ හේරත් එච්එම්එස් 1997.09.26 මාකෙලිය විවාහ ලේකම් කාර්යාලයේ දී එච්එම් අචලා චාන්දනී මෙනවිය සමග විවාහ විය.

සෙ/102925 ආසෙ නන්දන කුමාර පීජී 1996.09.06 ගිරාඳුරුකෝට්ටේ විවාහ ලේකම්කාර්යාලයේ දී වයිඩී දූලිකා දිල්රුක්ෂි මෙනවිය සමග විවාහ විය.

සෙ/302052 සාසෙ චන්ද්‍රජීව පීජ්එන් 1998.01.29 දින කැළණිය වේවැල්දූවේ අංක 178/2 දරණ නිවසේ දී, ජයසුන්දර මුදියන්සේලාගේ බංඩාර මැණිකේ ජයසුන්දර මෙනවිය සමග විවාහ ගිවිස ගන්නා ලදී.

සෙ/15397 සැරයන් ගුණරත්න ඩබ්ජ්ජේපීකේ - 97.03.05 දින දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලය හාරිස්පත්තුවහි දී කාරියවංශ අබේපුස්සගේ ධම්මිකා සමන් කුමාරි මෙනවිය සමග විවාහ වන ලදී.

සෙ/302592 කෝප්‍රල් බංඩාර එම්ආර්එස් 97.07.30 දින පාතහේවාහැට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තලාතුඔය හිදී රත්නායක මුදියන්සේලාගේ සම්පත් කුමාරි මැණිකේ රත්නායක මෙනවිය සමග විවාහ විය.

සෙ/303074 කෝප්‍රල් ගුණරත්න එස්සී 98.01.29 දින කුරුවිල විවාහ ලේකම් කාර්යාලයේදී කෙහෙල් ගෙදර ස්වර්ණා ගුණතිලක මෙනවිය සමගින් විවාහ වන ලදී.

සෙ/304344 කෝප්‍රල් තිලකසිරි අයිඑච්එස් 98.05.09 දින පුවක්දෙණිය මනාලියගේ නිවසේ දී රත්නායක මුදියන්සේලාගේ දේවිකා නිල්මිණි මෙනවිය සමග විවාහ වන ලදී.

සෙ/305826 ලාකෝ විමලදස එම්ජී - 96.03.17 දින රත්නපුර අතිරේක රෙජිස්ටාර් කාර්යාලයේ දී හේවාරත්න සුනේත්‍රා කාන්ති මෙනවිය සමග විවාහ විය.

සෙ/306461 ලාකෝ ප්‍රසන්න පීඑම්එස් - 97.09.05 දින දික්වැල්ල අතිරේක රෙජිස්ටාර්ගේ විශේෂ බලපත්‍රය මත බතිගම බටහිර පිහිටි ලහිරු නිවසේ දී නදීරා ලක්මාලි අමරසේකර මෙනවිය සමග විවාහ විය.

සෙ/13832 සාසෙ ප්‍රේමජයනන්ද පී 98.01.09 දින පරාක්‍රමපුර විවාහ ලේකම් කාර්යාලයේ දී ගුණපාලගේ ආරියවතී මෙනවිය සමග විවාහ විය.

සෙ/304560 සාසෙ කරුණානායක ඩීඑම්සී 97.09.25 දින බකමූණ විවාහ ලේකම් කාර්යාලයේ දී හේරත් මුදියන්සේලාගේ රම්‍යලතා මෙනවිය සමග විවාහ විය.

සෙ/305281 සාසෙ ආනන්ද එන්කේ - 97.01.24 දින මාවනැල්ල අරනායක පාරේ නො. 137 දරණ විවාහ රෙජිස්ටාර් කාර්යාලයේ දී මුළුගම්මන මුදියන්සේලාගේ ස්වර්ණලතා මැණිකේ මෙනවිය සමග විවාහ විය.

සෙ/306506 සාසෙ අමරසිරි කේපීජේආර් - 97.08.22 දින ගල්කිස්ස වයිඑම්සී ශාලාවේදී දිස්ත්‍රික් රෙජිස්ටාර් තුමිය ඉදිරිපිට වික්‍රමසිංහ පටබැඳිගේ ස්වර්ණලතා සමග විවාහ වන ලදී.

සෙ/119365 ආසෙ සමන්කුමාර ටීඩබ් 93.01.25 දින මොරවක දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී කිලෝවැල්ලා මුහන්දිරම්ගේ ගජධි මාලනී මෙනවිය සමග විවාහ විය.

සෙ/125892 ආසෙ රස්නැක්ගෙදර ජී - 92.08.28 දින වදමන්දෙණියවිවාහ ලේකම් කාර්යාලයේ දී ගම්ලත් රාලලාගේ වසන්තා මොනරවිල සමග විවාහ විය.

සෙ/303055 කෝප්‍රල් සෙනරත් ඩබ්ජ්එල් 12 ශ්‍රිලපාහ 1998 ජනවාරි මස 23 දින වැලිගම සොලේදණ්ඩ ශ්‍රියානි නිවසේ පදිංචි චමිලා දීපිකා සමග වැලිගම ශ්‍රියානි නිවසේ දී විවාහ වෙන ලදී.

සෙ/300695 කෝප්‍රල් පෙරේරා එන්එන්ජ්පී 1998.01.15 දින මහනුවර ගලගමුව විවාහ ලේකම් කාර්යාලයේ දී ජයකොඩි ආරච්චිගේ අජන්තා මෙනවිය සමග විවාහ විය.

සෙ/300206 කෝප්‍රල් ජයසිංහ අයි 1998.01.29 දින කුරුණෑගල දිස්ත්‍රික් විවාහ රෙජිස්ටාර් කාර්යාලයේ දී මුතුනායකගේ තාලිනී ගුණතුංග මෙනවිය සමග විවාහ විය.

සෙ/301344 ලාකෝ අමරසේන කේඩබ්ජීජේ 1997.04.08 දින දූරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී අධිකාරි විතාරණලාගේ සංජීවනී අධිකාරි මෙනෙවිය සමග විවාහ විය.

සෙ/303930 සාසෙ සෙනෙවිරත්න එස්පීඑම් 19997.054.23 දින කලූදවල විවාහ රෙජිස්ටාර් කාර්යාලයේ දී පුංගිගේ දම්පිකා පීරිස් මෙනවිය සමග විවාහ විය.

සෙ/308424 සාසෙ අල්විස් අයිජ් 1997.09.24 දින මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී හේවාජේඩිගේ චතරිකා නිල්මිණි ගුණරත්න මෙනවිය සමග විවාහ විය.

සෙ/305619 සාසෙ චන්ද්‍රසේන කේඑම්1997.12.25 දින පින්නවල විවාහ ලේකම් රෙජිස්ටාර් කාර්යාලයේ දී පද්මා ප්‍රියංගනී පියදස මෙනවිය සමග විවාහ විය.

නි/3585 කපිතන් ජීජ්එල් කිත්සිරි ශ්‍රිලපාහ 1997 ඔක්තෝබර් මස 20 වන දින මනාලියගේ නිවසේ දී කලුතන්ත්‍රිපටබැඳි තනූජා නිරෝෂනී මෙනවිය සමග විවාහ විය.

සෙ/9ඩී00452 කෝප්‍රල් ලියනආරච්චි යූ 1998.02.29 වන දින පානදුර ඉඩම් හා අතිරේක රෙජිස්ටාර් කාර්යාලයේ දී හේවා පොන්සේකාගේ ඉරේෂා සුදර්ශනී පොන්සේකා මෙනවිය සමග විවාහ විය.

සෙ/9ඩී00491 සාසෙ ෂෙල්ටන් විජේරත්න ආර්ඩී 1995.03.08 වනදින මිලියද්ද විවාහ ලේකම් කාර්යාලයේ දී වීරසිංහ දේවයලාගේ චමිලා නන්දනී වීරසිංහ මෙනවිය සමග විවාහ විය.

සෙ/9ඩී00878 සාසෙ රෝහණඅමරසිරි ආර්ඩී 1997.03.19 වන දින මාවතගම විවාහලේකම් කාර්යාලයේ දී වෙඩිපුර දේවයලාගේ කමලා චන්ද්‍රකාන්ති පියසේන මෙනවිය සමග විවාහ විය.

## මියයෑම් නිලධාරී /සෙසු නිල

### 1 ශ්‍රීලපාහ

සෙ/301217 සාසෙ කරුණාරත්න ඒ
සෙ/308966 සාසෙ දිසානායක ඒඑම්පී
සෙ/128914 ආසෙ කුරුප්පු ආර්ජ්
නි/63060 ලුතිතන් කේජ්කේපීඅයිජ් ආරියරත්න, ශ්‍රීලපාහ
නි/63617 2/ලුති ඒඩීකේඩබ්ලියුඑම්පී වලිසිංහ, ශ්‍රීලපාහ
සෙ/303847 කෝප්‍රල් ජයරත්න ජේඑම්ජේ
සෙ/302781 සාසෙ ඉලංගකෝන් අයිඑම්
සෙ/12588 සාසෙ නවරත්න එන්බී
සෙ/128821 ආසෙ නවරත්නබංඩා ආර්එම්
සෙ/302129 කෝප්‍රල් වීරකෝන් පීජ්පී

### 3 ශ්‍රීලපාහ

සෙ/12782 සැරයන් රත්නසිරි ආර්ඩබ්එන්
සෙ/303908 සාසෙ සාලේ ටීඑස්
සෙ/306327 සාසෙ ගම්ලත් ජීපීසී
සෙ/307075 සාසෙ වික්‍රමසිංහ ආර්ඩීයූපී
සෙ/126930 ආසෙ දිසානායක ඩීපීඑම්පී
සෙ/127016 ආසෙ රූපසිරි එම්එල්
සෙ/127630 ආසෙ නිහාල් පියතිලක කේඩබ්
සෙ/311024 ආසෙ ශාන්ත කුමාර එච්එම්
නි/63737 2/ලුති ටීඑම්එන්බී තෙන්නකෝන් ශ්‍රීලපාහ
සෙ/300553 කෝප්‍රල් සේනාරත්න ඩීපීඑස්
සෙ/122802 සාසෙ මාරසිංහ එම්ජ්
සෙ/228363 ආසෙ අතුකෝරල කේපීඩබ්
සෙ/306304 සාසෙ සිල්වා ආර්ජ්ටී
සෙ/304156 සාසෙ පියරත්නබංඩා ඩීඑම්
සෙ/310002 සාසෙ රංජිත් එම්
සෙ/125777 ආසෙ ක්‍රිශාන්ත බීඑල්
සෙ/310018 සාසෙ නිරෝෂන් ඒඑම්
සෙ/310825 සාසෙ තිලකරත්න එම්පී
සෙ/129337 ආසෙ රණසිංහ ආර්ජ්සී
සෙ/113192 ආසෙ සුනිල් රත්නායක ටීඑම්
සෙ/129337 ආසෙ ප්‍රනාන්දු එම්
සෙ/305367 සාසෙ ජයවර්ධන කේ

### 4 ශ්‍රීලපාහ

සෙ/303405 ලාකෝ උඩුගම එච්වීර්ඩබ්පී
සෙ/301469 ලාකෝ ප්‍රියදර්ශණ අයිඩීඑස්
සෙ/130028 ආසෙ සරත්කුමාර කේජේ
සෙ/309241 සාසෙ දිසානායක ඩීඑම්බී
සෙ/304284 ලාකෝ පියසේකර එස්ජ්පීඑන්
සෙ/309874 සාසෙ අනුරශාන්ත ඩීටී

### 6 ශ්‍රීලපාහ

සෙ/308569 සාසෙ වසන්ත කුමාර එච්එම්ජ්
සෙ/13317 කෝප්‍රල් විමලරත්න ආර්පී
සෙ/310532 ආසෙ රංජිත් එච්එම්ජ්
සෙ/13743 කෝප්‍රල් සමරතුංග එච්කේඑන්
සෙ/300662 ලාකෝ බංඩාර එල්ආර්එස්
සෙ/305518 ලාකෝ සමන්කුමාර ජේජ්
සෙ/309769 සාසෙ පාලිත හේමප්‍රිය ජේ
සෙ/311822 සාසෙ ජනිත එම්
සෙ/304703 සාසෙ උදයකුමාර කේපීසී
සෙ/130293 අසෙ රාජපක්ෂ එස්ඩබ්බීජ්

### 7 ශ්‍රීලපාහ

සෙ/13571 ව/සැර කරුණාරත්න ආර්ජ්පීඑස්
සෙ/301463 කෝප්‍රල් විජේසිරි කේඑස්
සෙ/30807323 සාසෙ දසනායක ඩීජ්ආර්එස්
සෙ/307918 සාසෙ ජයසිංහ එච්එස්කේ
සෙ/308621 සාසෙ ප්‍රේමරත්න පී
නි/62974 ලුති කේආර් තුඩුගල ශ්‍රීලපාහ
නි/62009 කපිතන් ඒඑස් දිසානායක ශ්‍රීලපාහ
සෙ/15459 සැරයන් සුනිල්ශාන්ත ඩබ්
සෙ/309000 සාසෙ පුෂ්පකුමාර එච්එම්පී
සෙ/306156 ලාකෝ පොඩිබංඩා ඩීඑම්ජ්
සෙ/302445 කෝප්‍රල් ජයපාල ඒඑම්
සෙ/303824 සාසෙ රුවන් එච්පී
සෙ/89487 ආසෙ ප්‍රේමරත්න කේපී
සෙ/15530 සැරයන් ගුණරත්න වයිපීඑම්
සෙ/306147 සාසෙ සමන් පී
සෙ/309075 සාසෙ සෙනෙවිරත්න ආර්ඩීජ්
සෙ/310312 සාසෙ එදිරිසූරිය එස්පීඑස්පී
සෙ/309581 සාසෙ සුහසිංහ එච්පි
සෙ/309310 සාසෙ ජයරත්න එම්ජ්
සෙ/15339 සැරයන් වීරසේන ඩබ්
සෙ/300655 කෝප්‍රල් බංඩාර ඊඑම්ඩබ්
සෙ/303795 කෝප්‍රල් කුමාරසිරි ආර්යූපී
සෙ/306044 ලාකෝ ප්‍රියදර්ශණ එම්පීඑස්
සෙ/308672 සාසෙ බස්නායක බී එච්එම්
සෙ/306675 සාසෙ අබේසේකර කේවී
සෙ/308214 සාසෙ විජේතුංග එම්ජ්
සෙ/308650 සාසෙ බංඩාර ආර්එම්ආර්ඩබ්
සෙ/305182 කෝප්‍රල් ප්‍රියන්ත ඩීපීසී
සෙ/306071 සාසෙ ජයන්ත හේරත් පීආර්සී
සෙ/308648 සාසෙ වීරසිංහ ඩබ්එම්ජ්
සෙ/308631 සාසෙ සම්පත් ඩබ්වී
සෙ/308991 සාසෙ සමරක්කොඩි ඒපී

### 8 ශ්‍රීලපාහ

සෙ/14674 කෝප්‍රල් අබේසිංහ ආර්එම්
සෙ/304992 ලාකෝ සේනාරත්න එස්පීපීජීකේ
සෙ/303517 ලාකෝ තිලකරත්න ඊඩීපීඑන්
සෙ/307439 සාසෙ පියසේන එච්ජ්
සෙ/308289 සාසෙ රාජපක්ෂ ආර්ජ්ජ්එම්
සෙ/113234 ආසෙ පත්මසිරි ද සිල්වා ඩී
සෙ/113215 ආසෙ බණ්ඩාර ආර්ආර්
සෙ/11168 ආසෙ සමන්කුමාර පීඩී
සෙ/121627 ආසෙ කුමාර පත්මසිරි ආර්එම්
සෙ/303022 කෝප්‍රල් ජයලාල් කේබීඑස්
සෙ/304616 සාසෙ සුනිල් එන්ඩබ්බීඩී
සෙ/304981 සාසෙ ජයරත්න ආර්එම්පී
සෙ/307688 සාසෙ කුමාර ඩීඑම්ඩීඑස්
සෙ/113248 ආසෙ ඉන්දික සමන්කුමාර එච්එම්
සෙ/304522 කෝප්‍රල් කුමාරසිරි බීඩබ්එම්
නි/62940 2/ලුති එරජ්පීඑස්එම්ඩී ගුණසේකර, ශ්‍රීලපාහ
සෙ/303129 සාසෙ රංජිත් ජී
සෙ/308096 සාසෙ රත්නායක ආර්එම්එස්

### 10 ශ්‍රීලපාහ

සෙ/307740 සාසෙ ජයවර්ධන එම්ජ්එස්
සෙ/227597 ආසෙ ප්‍රේමරත්න ජේජ්එස්
සෙ/306186 ලාකෝ ජයන්ත කුමාර ඩීආර්
සෙ/303853 ලාකෝ වීරසිංහ එච්වීඑල්කේ
සෙ/307312 සාසෙ වනසිංහ පීජීඑම්එල්
සෙ/307323 සාසෙ ප්‍රේමරත්න ආර්ඩබ්ජ්එන්ආර්
සෙ/126558 ආසෙ තෙවරප්පෙරුම ඩීජ්සී
සෙ/306721 සාසෙ බණ්ඩාර කේඑම්කේ
සෙ/307718 සාසෙ ගාමිණී ඩීඑම්පී
සෙ/227674 ආසෙ වීරසූරිය ඩබ්එන්කේ
සෙ/305250 සාසෙ සුමිත් ආනන්ද කේකේ
සෙ/126528 ආසෙ ගාමිණී එච්ජීජී
සෙ/3034472 සාසෙ ජයරත්න එම්ඩීජී
සෙ/11645 ආසෙ චන්ද්‍රසිරි එච්ජ්
සෙ/307003 සාසෙ ජයසිංහ ආර්එස්කේඑස්
නි/63467 2/ලුති යූජී සුරේෂ් කුමාර, ශ්‍රීලපාහ

### 11 ශ්‍රීලපාහ

සෙ/304526 ලාකෝ සෝමසිරි එම්පී
සෙ/309741 සාසෙ ප්‍රියන්ත ආර්ඩී

### 12 ශ්‍රීලපාහ

සෙ/105043 ආසෙ පත්මසිරි එස්එච්
සෙ/305653 ලාකෝ දිමුතුසිරි ඩීකේසී

### 15 ශ්‍රීලපාහ

සෙ/122581 ආසෙ රණතුංග බංඩා වයිඑම්
සෙ/304048 සාසෙ කීර්තිරත්න එල්ජ්

### 2 (සෙව්) ශ්‍රීලපාහ

සෙ/23129 ලාකෝ ප්‍රදීප්කුමාර ආර්ජ්
සෙ/23266 සාසෙ ඩේවිඩ් පී
සෙ/2ඩී02519 ලාකෝ විමලසේන එච්කේ
සෙ/2ඩී03091 සාසෙ ආරියවංශ එම්පීකේ
සෙ/22628 සාසෙ සිසිර නායනානන්ද ආර්එච්පී

### 5 (සෙව්) ශ්‍රීලපාහ


සෙ/5ඩී01136 ලාකෝ නැකුලන්ද ආර්එම්
සෙ/5ඩී 00540 කෝප්‍රල් විජේපාල පී
සෙ/98වීඑප්ආර් 4979 ආසෙ චමින්ද විජිතකුමාර ඩබ්ජ්

### 9 (සෙව්) ශ්‍රීලපාහ

සෙ/00455 ලාකෝ මුතුබංඩා ඩීඑම්
නි/4787 2/ලුති කේඑම්ඩීජ් තෙන්නකෝන්. ශ්‍රීලපාහ
සෙ/0691 සාසෙ බංඩාර ආර්එම්ජී
සෙ/01036 සාසෙ හීන්බංඩා ඩීඑම්

### 14 (සෙව්) ශ්‍රීලපාහ


සෙ/00528 සාසෙ පත්මතිලක එස්ජේටී
සෙ/97 වීඑප්ආර් 2298 ආසෙ සෝමතිලක ඩබ්එම්



1994 වර්ෂයේ අගෝස්තු මස 25 වෙනි දින කපිතන් විජේසූරිය (6 ශ්‍රීලපාහ) දනුවත් කිරීම මත බර ඉසිලීමේ ජාතික පුහුණුකරුවන ආර්බී වික්‍රමසිංහ මහතා යටතේ 1994 සැප්තැම්බර් මස 02 වෙනි දින ආරම්භ කර 1995 මැයි මස 07 වෙනි දින ටොරින්ටන් ක්‍රීඩා අමාත්‍යංශයේ ගෘහස්ථ ක්‍රීඩාගාරයේ පැවැති ආධුනික බර ඉසිලීමේ තරගාවලියෙන් කි.ග්‍රෑ 76 බර පංතියේ නියෝජනය කරමින් මුලු බර කි.ග්‍රෑ 160 ඔසවමින් ප්‍රථම ස්ථානය දිනාගත්තෙමි. 1995 ජූලි මස 22 වෙනි දින එම ස්ථානයේ දීම පැවැති අන්තර් මධ්‍යම බර ඉසිලීමේ තරගයෙන් ක්‍රි.ග්‍රෑ 70 බර පංතිය නියෝජනය කර මුලු බර කි.ග්‍රෑ 160 බර ඔසවා දෙවන ස්ථානය ද 1996 ඔක්. මස 05 දින මහනුවර ධර්මරාජා විදුහලේ පැවැති අන්තර් මධ්‍යම බර ඉසිලීමේ තරගයෙන් කි.ග්‍රෑ 70 බර පංතියේ මුලු බර කි.ග්‍රෑ. 190 බර ඔසවමින් ප්‍රථම ස්ථානය ද 1997 ජූනි මස 26 දින පැවැති බස්නාහිර පළාත මෙහෙයවන අන්තර් දිස්ත්‍රික් තරගාවලියේ කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් කි.ග්‍රෑ 70 බර පංතියේ මුලු බර ක්‍රි.ග්‍රෑ 180 බර ඔසවමින් ප්‍රථම ස්ථානය දිනාගත් අතර 1997 ජාතික මහා ක්‍රීඩා උළෙලින් කි. ග්‍රෑ 76 බර පංතියේ කි.ග්‍රෑ 195 බර ඔසවමින් දෙවන ස්ථානයට හිමි රිදී පදක්කම දිනා ගැනීමට හැකිවිය. ඒ වගේම 1998 ජාතික ක්‍රීඩා උළෙලින් මහනුවර වයිඑම්සීඒ හි පැවැති ජාතික ක්‍රීඩා තරගයේ කි.ග්‍රෑ 69 බර පංතියේ මුලු බර කි.ග්‍රෑ 200 ඔසවමින් තුන්වන ස්ථානය හිමිකර ගැනීමට සමත්විය.

සෙ/300663
කෝප්‍රල් පියරත්න පේඑම්
6 ශ්‍රීලංකා පාබල හමුදව

1994 වර්ෂයේ අගෝස්තු මස 25 වෙනි දින කපිතන් විජේසූරිය (6 ශ්‍රීලපාහ) දනුවත් කිරීම මත බර ඉසිලීමේ ජාතික පුහුණු කරුවන ආර්බී වික්‍රමසිංහ මහතා යටතේ 1994 සැප්තැම්බර් මස 02 දින සිට යුධ හමුද බර ඉසිලීමේ කණ්ඩායමට අනුයුක්තව පුහුණු කටයුතු ආරම්භ කර 1995 මැයි මස 07 වෙනි දින ටොරින්ටන් ක්‍රිඩා අමාත්‍යංශයේ ගෘහස්ථ ක්‍රීඩාගාරයේ පැවැති ආධුනික බර ඉසිලීමේ තරගාවලියේ කි.ග්‍රෑ 83 බර පංතියේ නියෝජනය කරමින් මුලු බර කි.ග්‍රෑ 175 බර ඔසවමින් ප්‍රථම ස්ථානය දිනා ගත්තෙමි. 1995 ජූලි මස 22 දින එම ස්ථානයේ දීම පැවැති අන්තර් මධ්‍යම බර ඉසිලීමේ තරගයෙන් කි.ග්‍රෑ 76 බර පංතිය නියෝජනය කර මුලු බර 182.5 බර ඔසවා දෙවන ස්ථානය ද 1995 සැප්තැම්බර් මස 09 වැනි දින පවත්වන ලද උතුරුමැද පළාත මෙහෙයවන අන්තර් දිස්ත්‍රික්ක තරගාවලියේ අ/පුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් කි.ග්‍රෑ 76 බර පංතියේ මුලු බර කි.ග්‍රෑ 180 ඔසවමින් දෙවැනි ස්ථානය ද 1996 ඔක්. මස 05 වෙනි දින මහනුවර ධර්මරාජ මහ විදුහලේ පැවැති අන්තර් මධ්‍යම බර ඉසිලීමේ තරගයේ කි.ග්‍රෑ. 76 බර පංතියේ මුලු බර කි.ග්‍රෑ 180 ඔසවා දෙවැනි ස්ථානය ද 1997 ජූලි මස 13 වෙනි දින පැවැති උතුරුමැද පළාත මෙහෙයවන අන්තර් දිස්ත්‍රික්ක තරගාවලියේ අ/පුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් කි.ග්‍රෑ. 76 බර පංතියේ මුළු බර 185 ඔසවා දෙවන ස්ථානය හිමිකර ගන්නා ලදී.



සෙ/301593
කෝප්‍රල් රූපසිංහ පීආර්
6 ශ්‍රීලංපාබල හමුදව

# ආබාධිත සෙබලුන්ට හා මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ට ස්වයං නිවාස තනාගැනීම සඳහා රු. 150000/= ක් ලබාදීමේ ව්‍යාපෘතිය

ඉහත සඳහන් ව්‍යාපෘතිය යටතේ නිත්‍ය/ස්වේච්ඡා ශ්‍රීලපාහ ඒකක වලට අයත් මියගිය /ආබාධිතරණවිරුවන් හට නිවාස තනාගැනීම පිණිස රු. 150000/- බැගින් යුහමු අභිසුසාඅම වෙතින් ලබා දෙන ලදී.

ඉහත සඳහන් නිවාස ව්‍යාපෘතිය යටතේ පහත ලිපිනයේ සඳහන් 1 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/11913 සැරයන් ලියනගේ එච්ආර් (ආබාධිත) වෙනුවෙන් ඉදිවූ නිවස 1998 ක් වූ අප්‍රේල් මස 10 වන දින 0932 පැයට යෙදුනු සුභ මොහොතින් බටුවත්ත විහාරස්ථානයේ විහාරවාසී ස්වාමීන් වහන්සේගේ අනුශාසනා මධ්‍යයේ රෙම ශ්‍රීලපාහ සේනාවිධායක ලුතිතන් කර්නල් ජේඑස් මාසක්කාර, ශ්‍රීලපාහ අතින් විවෘතකර අදාල රණවිරුවාහට භාර දෙන ලදී.

සෙ/11913 සැරයන් ලියනගේ එච්ආර් - නො. 589/ඒ,
නාරන්ගොඩපාලුව,
බටුවත්ත - රාගම.

මෙම උත්සවය සඳහා පහත සඳහන් නිලධාරීන් සහ ආරාධිත අමුත්තන් සහභාගිවන ලදී.

1 ශ්‍රීලපාහ 2 වන අණදෙන නිලධාරී - මේජර් එන්කේ වඩුගොඩපිටිය, ශ්‍රීලපාහ
රෙජිආබ ශ්‍රීලපාහ නිලධාරී අණදෙන - මේජර් අයිජීආර්පී බෝගොඩවත්ත, ශ්‍රීලපාහ
රෙජිආබ ශ්‍රීලපාහ වැටුප්භාර නිලධාරී - ලුතිතන් අයිකේඩී එදිරිසිංහ, ශ්‍රීලපාහ ඇතුලු 2 ලුතිතන් කේජ් ජයසිංහ, ශ්‍රීලපාහ
බස්නාහිර පළාත් සභා මන්ත්‍රී - එස්පී අබේසේකර මහතා
රාගම ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටීජ්ඩී ගුණසේකර මහතා
සාම විනිසුරු - එච්එස් ජයසේකර මහතා
විත්‍රපටි අධ්‍යක්ෂ - සුගතපාල සෙනරත් යාපා මහතා



*රෙජිමේන්තු මධ්‍යස්ථානය - ශ්‍රීලපාහ සේනාවිධායක ලුතිතන් කර්නල් ජේඑස් මාසක්කාර. ශ්‍රීලපාහ විසින් එදින 0932 පැයට යෙදුන සුභ මොහොතින් පීත්ත පටිය කපා නව නිවස විවෘත කරන අයුරුයි. බටුවත්ත විහාරස්ථානයේ විහාරවාසී ස්වාමීන් වහන්සේ සහ සෙ/11913 සැරයන් ලියනගේ එච්ආර් සහ ඔහුගේ බිරිඳ දරු දෙපල ඇතුළු රෙජිආබ ශ්‍රීලපාහ සෙබළුන් පසෙකින් සිටි.*




*නව නිවස විවෘත කිරීමෙන් අනතුරුව 1 ශ්‍රීලපාහ 2 වන අණදෙන නිලධාරී මේජර් එන්කේ වඩුගොඩපිටිය. ශ්‍රීලපාහ විසින් 1 ශ්‍රීලපාහ ඒකකය වෙතින් නව නිවස වෙත පරිත්‍යාග කිරීමට ලබාගත් පුටු කට්ටලයක් සැරයන් ලියනගේ එච්ආර් හට පරිත්‍යාග කරන අයුරුයි.*

# ආබාධිත ර
# හදාරණු ලබ



ශ්‍රීලයුයුබ ඒකකයෙහි ආරම්භකර ඇති සන්නාලි පාඨමාලාව හැදැරීම සඳහා මෙම ඒකකය වෙතින් යා කරන ලද ආබාධිත සෙබලුන් තිදෙනක් සන්නාලි පාඨමාලාව හදරන අයුරුයි.




ආබාධිත රණවිරුවන් උදෙසා ආරම්භ කර ඇති රණවිරු ඇගලුම් ව්‍යාපෘතිය සඳහා යා කරන ලද මෙම ඒකකයට අයත් ආබාධිත සෙබළ සාසෙ පෙරේරා ඩීසී ඇගලුම් පුහුණුව ලබන අයුරු මෙම ඡායාරූපයෙන් දැක්වේ .



දැනට රණවිරු සෙවනෙහි ආරම්භ කර ඇති සම්භාණ්ඩ පාඨමාලාව සඳහා යා කරන ලද මෙම ඒකකයට අයත් සාසෙ වර්ණසිරි ජේඑම් එම පාඨමාලවේ පුහුණුවීම් කටයුතුවල නිරතව සිටින අයුරුයි.


# ණවිරුවන්
# න පාඨමාලා



ආබාධිත සෙබළ සාසෙ
පින්නවල කේපීආර් පරිඝණක
පාඨමාලාව හදරන අයුරුයි.



රණවිරු සෙවනෙහි ආරම්භකර
ඇති ඉලෙක්ට්‍රොනික් පාඨමාලාව
හැදෑරීම සඳහා යා කරන ලද
සාසෙ නිශාන්ත ප්‍රනාන්දු එම්එස්
එම පාඨමාලාව හදරන අයුරුයි.



මෝටර් කාර්මික පාඨමාලාව
හැදෑරීම සඳහා ශ්‍රීලංවියාඉ
වෙත යා කර සිටින මෙම
ඒකකයට අයත් සාසෙ නන්ද
කුමාර එච්ආර් වාහනයක්
පරීක්ෂා කරන අයුරුයි

# රෙජිමේන්තු ආධාරක බළඇණිය, ශ්‍රීලපාහ

1983 ජූලි මාසයෙන් ආරම්භ වූ ද්‍රවිඩ ත්‍රස්තවාදය නිසා ආබාධිත තත්ත්වයට පත් යුධ හමුද සෙබලුන්ගේ පාලනය හා සුභසාධන කටයුතු විධිමත් අයුරින් ඉටු කිරීමේ පහසුව සඳහා ශ්‍රී ලංකා යුධ හමුද මූලස්ථානයේ අනුමැතිය පරිදි ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයට අනුයුක්තව මෙම රෙජිමේන්තු ආධාරක බළඇණිය පිහිටුවන ලදී.

මූලිකව ක්‍රියාත්විතයේ දී ආබාධිත තත්ත්වයට පත් සෙබලුන් 125 ක් පමණ පිරිසකින් 1993 අගෝස්තු මස 15 වන දින ආරම්භ කරන ලද මෙම ඒකකය බෙදුම්වාදී යුද්ධයත් සමග ශ්‍රීලපාහ රෙජිමේන්තුවට අයත් සෙබලුන් විශාල පිරිසක් ආබාධිත වීමත්, මෙම ආබාධිත සෙබලුන් ආබාධිත බළඇණියට ඇතුලත් කිරීමෙන් අනතුරුව වර්ධනය වූ මෙම බළඇණිය යටතේ දනට නිලධාරීන් 04 දෙනෙක් සහ සෙබලුන් 700 කට අධික ප්‍රමාණයකින් සමන්විත වී ඇත.

මෙම සෙබලුන් සංඛ්‍යාව වැඩිවීමත් සමග ඔවුන්ගේ පාලනමය කටයුතු සිදුකර ගැනීමට පහසුවීම සඳහා රෙජිආබ ශ්‍රීලපාහ අතීතයේ සුලුවෙන් පවත්වා ගෙන ගිය කාර්යාල කටයුතු පුලුල් කිරීමට සිදුවිය. මෙම කාර්යාල කටයුතු වලට ඇතුලත්ව මුදල් පාලනමය කටයුතු සඳහා රෙආස හා වැහාදී කටයුතු සැකසීම සඳහා ප්‍රමුඛත්වයක් දී කටයුතු කරයි.

මෙම කාර්යාල සේවා මගින් ආබාධිත සෙබලුන්ගේ සුදුසුකම් අනුව ඔවුන්ට සුදුසු වෘත්තීය පුහුණුවක් ලබාදී යුධ හමුදවට මෙම ආබාධිත සෙබලුන්ගෙන් කාර්යක්‍ෂම සේවයක් ලබාදීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදව මගින් පිහිටුවන ලද පුනරුත්ථාපන අධ්‍යක්‍ෂ මණ්ලයේ සහයෝගයෙන් විවිධ පාඨමාලා සඳහා මෙම රෙජිආබ ඒකකය මගින් ආබාධිත සෙබලුන් අනුයුක්ත කරන ලදී. එපමණක්ද නොව රෙම ශ්‍රීලපාහ පසු මූලය බූස්ස කඳවුරේ පවත්වන ලද ලිපිකරු පාඨමාලාව සඳහා ද සෙනීන් විශාල පිරිසක් සහභාගී කරවන ලදී. මීට අමතරව දනට ක්‍රියාත්මක වෙමින් පවතින රණවිරු ඇහලුම් කම්හලෙහි බොහෝ ආබාධිත සෙබලුන් සේවය කරන අතර මෙම ඒකකයට අයත් ශ්‍රීලපාහ ආබාධිත සෙබලුන් විශාල පිරිසක් ඇතුලත්ව සිටී.

පාඨමාලාවක් හදරන ලද ආබාධිත සෙනීන් යුධ හමුදවේ උසස් මූලස්ථානයත් වෙත පොදු රාජකාරී සඳහා යා කිරීම් සිදු කර ඇති අතර, මීට අමතරව එදිනෙද පවතින ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා නිවසට ආසන්න හමුද කඳවුරු වෙත යා කිරීම් සිදුකිරීමට මෙම රෙජිආබ ශ්‍රීලපාහ සෑම විටම කටයුතු කර ඇත. එමගින් මොවුන්ගේ මානසික තත්ත්වය උසස් මට්ටමකින් පවත්වා ගැනීමටත්, තව දුරටත් යම් කිසි සේවයක් ලබාගැනීමටත්, ඔවුන්ගේ දනීමේ මට්ටම වැඩිදියුණු කර ගැනීමටත් ඉවහල් වේ.

මෙම රෙජිමේන්තු ආධාරක බළඇණිය වෙත රපෝර්තු කරවා ඇති ආබාධිත සෙනීන් හට විවිධ පාඨමාලා හැදරීම සඳහා යොමුකරවන අතර, 1993 වර්ෂයේ සිට මේ දක්වා පාඨමාලාව හදරා ඇති සෙනීන් සංඛ්‍යාව සහ එම පාඨමාලාවන් පහත සඳහන් පරිදි වේ.

### 1993 වර්ෂයේ හදරන ලද පාඨමාලාවන් සහ සහභාගී වු සෙනීන් :-

| | |
|---|---|
| වැටුප් හා ගිණුම් පාඨමාලාව | - 01 |
| පරිගණක පාඨමාලාව | 01 |

### 1994 වර්ෂයේ හදරන ලද පාඨමාලාවන් සහ සහභාගී වු සෙනීන්

| | |
|---|---|
| පරිගණක පාඨමාලාව - | 01 |
| ගබඩාකරු පාඨමාලාව | 01 |

### 1995 වර්ෂයේ හදරන ලද පාඨමාලාවන් සහ සහභාගී වු සෙනීන්

| | |
|---|---|
| ඇහලුම් පාඨමාලාව | 01 |
| ලිපිකරු පාඨමාලාව | 02 |
| සන්නාලි පාඨමාලාව | 01 |
| ගබඩාකරු පාඨමාලාව | 01 |

### 1996 වර්ෂයේ හදරන ලද පාඨමාලාවන් සහ සහභාගී වු සෙනීන්

| | |
|---|---|
| ඇහලුම් පාඨමාලාව | 17 |
| බුද්ධි පාඨමාලාව | 04 |
| මෝටර් කාර්මික පාඨමාලාව | 08 |
| ලිපිකරු පාඨමාලාව | 44 |
| ගුවන් විදුලි අලුත් වැඩියා කිරීමේ පා/මා | 01 |
| සන්නාලි පාඨමාලාව | 06 |
| ගබඩාකරු පාඨමාලාව | 02 |
| පරිගණක පාඨමාලාව | 01 |
| ත්‍රිවිලර් අලුත් වැඩියා කිරීමේ පාඨමාලාව | 01 |
| වායු සමීකරණ පාඨමාලාව | 01 |
| ඉලෙක්ට්‍රොනික් පාඨමාලාව | 01 |
| වඩු කාර්මික පාඨමාලාව | 01 |
| රණවිරු සංගීත පාඨමාලාව | 01 |
| සත්ව පාලන පාඨමාලාව | 01 |

### 1997 වර්ෂයේ හදරන ලද පාඨමාලාවන් සහ සහභාගී වු සෙනීන්

| | |
|---|---|
| මෝටර් කාර්මික පාඨමාලාව | 12 |
| ඇහලුම් පාඨමාලාව | 02 |
| ලිපිකරු පාඨමාලාව | 45 |
| වැටුප් හා ගිණුම් පාඨමාලාව | 07 |
| ගුවන් විදුලි අලුත් වැඩියා පාඨමාලාව | 02 |
| සන්නාලි පාඨමාලාව | 04 |
| ගබඩා කරු පාඨමාලාව | 03 |
| විදුලි කාර්මික පාඨමාලාව | 03 |
| පරිගණක පාඨමාලාව | 18 |
| ත්‍රිවිලර් අලුත්වැඩියා පාඨමාලාව | 01 |
| රියැදුරු පාඨමාලාව | 03 |
| උපකරණ නඩත්තු කිරීමේ පාඨමාලාව | 02 |
| ඉලෙක්ට්‍රොනික් පාඨමාලාව | 03 |
| වීඩියෝ කැමරා පාඨමාලාව | 05 |
| ඡායාරූපකරණය | 02 |
| වැද්දුම් ශිල්පය | 04 |

### 1998 වර්ෂයේ හදරන ලද පාඨමාලාවන් සහ සහභාගී වු සෙනීන්

| | |
|---|---|
| මෝටර් කාර්මික පාඨමාලාව | 02 |
| ඇහලුම් පාඨමාලාව | 01 |
| ලිපිකරු පාඨමාලාව | 22 |
| වැටුප් හා ගිණුම් පාඨමාලාව | 01 |
| ගුවන් විදුලි අ/වැ කිරීමේ පාඨමාලාව | 01 |
| සන්නාලි පාඨමාලාව | 01 |
| ත්‍රිවිලර් අලුත්වැඩියා කිරීමේ පාඨමාලාව | 01 |
| රියැදුරු පාඨමාලාව | 01 |
| උපකරණ නඩත්තු පාඨමාලාව | 01 |
| ඉලෙක්ට්‍රොනික් පාඨමාලාව | 01 |

මෙම ආබාධිත බළඇණිය වෙත ර/කරවීමෙන් පසු පාඨමාලා හදරන ලද සෙනින් යුද හමුද මූලස්ථානය ඇතුලු දිවයිනේ ඇති යුධ හමුද කඳවුරු වෙත පොදු රාජකාරී සඳහා යා කිරීම් කර ඇති අතර, එම ආයතන සහ යාකර ඇති සෙනින් ගණන අනුපිළිවෙලින් පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| යුහමු වලට අයත් අධ්‍යක්‍ෂ මණ්ඩල / ආයතනයන් හි | 48 |
| ඒක්‍රිමූ අනුරාධපුර | 02 |
| රණවිරු ඇපරල්ස් | 41 |
| 1 රෙජිවීබ | 02 |
| 11 සේමු | 17 |

| | |
|---|---|
| යුහවිපි දියතලාව | 08 |
| ශ්‍රීලවියා ඉ අ/පුර | 03 |
| ශ්‍රීලවියාඉ කටුබැද්ද | 01 |
| යුහරෝහල - පනාගොඩ | 06 |
| රණවිරු සෙවන රාගම | 08 |
| සෙවිබසේමු | 12 |
| 211 බසේමු | 01 |
| ප්‍ර/මු කුරුණෑගල | 03 |
| 5(සෙවි) ශ්‍රීලපාහ පසුමූලය | 16 |
| 5 (සෙවි) ශ්‍රීලපාහ පෙර මූලය | 01 |
| 21 සේමු | 07 |
| මැද මූලය 3 ශ්‍රීලපාහ | 01 |
| 53 සේමු පසුමූලය | 01 |
| 52 කාසේමු | 02 |
| ශ්‍රීලයුපීබ | 02 |
| ශ්‍රීලයුයුබ දෙඹගොඩ | 01 |
| ප්‍ර/මු බූස්ස | 03 |
| රෙම ශ්‍රීලපාහ පසුමූලය බූස්ස | 04 |
| යුහ පුස්තකාලය - පනාගොඩ | 01 |
| රෙ ඉසේරේ | 03 |
| රෙම ශ්‍රීලවියාඉ | 01 |
| 31 බසේමු | 01 |
| සුසාවෙසැ අනුරාධපුර | 02 |
| 3 ශ්‍රීලපාහ ඉදිරිමූලය | 01 |
| 6 ශ්‍රීලපාහ ඉදිරිමූලය | 0-1 |
| ගුවන් ජංගම මෙහෙයුම් අංශය | 01 |
| 2 කාසේමු | 01 |
| 4 කාසේමු | 01 |
| පසුමූලය 2 ශ්‍රීලපාහ | 20 |
| 223 බසේමු - වැලිඔය | 01 |
| ආසේඉ - දියතලාව | 01 |
| සුපුපා - අම්පාර | 01 |
| රෙම ශ්‍රීලපාහ | 16 |
| 1 ශ්‍රීලපාහ පසුමූලය | 01 |
| පසුමූලය 3 ශ්‍රීලපාහ | 03 |
| පසුමූලය 4 ශ්‍රීලපාහ | 04 |
| මූලස්ථානය 4 ශ්‍රීලපාහ | 04 |
| රෙජි පාලන කණ්ඩායම | 05 |
| පසුමූලය 6 ශ්‍රීලපාහ | 01 |
| පසුමූලය 12 ශ්‍රීලපාහ | 01 |
| පසුමූලය 10 ශ්‍රීලපාහ | 03 |

රෙජිමේන්තු ආධාරක බළඇණිය ශ්‍රීලපාහ ආරම්භයෙන් පසු මේ වන තෙක් ශ්‍රීලපාහ ආබාධිත සෙබලුන්ගේ සුහසාධනය වෙනුවෙන් ශ්‍රී ලංකා යුධ හමුද අතිරේක සුහ සාධක අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සහයෝගය ඇතිව ස්වයං නිවාස ව්‍යාපෘති හා රණවිරු ගම්මානයන්හි නිවාස ලබාදීම් වැනි කටයුතු වලට මෙම බළඇණිය ප්‍රමුඛත්වයක් දී කටයුතු කර ඇත. එපමණක් ද නොව ආබාධිත වූවන් හට ආධාර කරන දනපති ව්‍යාපාරිකයන්ගේ සහයෝගය ලබාගෙන වඩාත්ම ආබාධිත තත්ත්වයේ පසුවන සෙබලුන්හට ප්‍රමුඛත්වය මත එම ආධාර ලබාදීමට ක්‍රියා කර ඇත.

දනට දිවයිනේ නොයෙකුත් ප්‍රදේශවල ආරම්භ කර ඇති හා නිම වූ රණවිරු ගම්මානයන් හි ශ්‍රීලපාහ ආබාධිත සෙබලුන් වෙනුවෙන් නිවාස 86 ක් ලබාදීමට කටයුතු කර ඇත. යුධ හමුද අතිරේක සුහසාධක අධ්‍යක්‍ෂ මණ්ලය වෙතින් ආබාධිත සෙබලුන්ගේ සුහසාධනය සඳහා නිවාස තනා ගැනීමට රු. 1,50,000.00 ක මුදල් ආධාර මත තනා නිම කර ඇති නිවාස සංඛ්‍යාව 12 ක් වන අතර එම ආධාර මුදල් ප්‍රමාණය මතම නිවාස 24 ක වැඩ නිම වෙමින් පවතී. රු. 200,000.00 ක මුදල් ආධාර මත නිවාස 03 ක් තනා නිම කර ඇත.

මෙම නිවාස ලබාදීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී යුද්ධයේ දී දිවිපිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් සඳහා ප්‍රමුඛත්වයක් ලබාදීමට මෙම ඒකකයට සැමවිටම ක්‍රියා කරන්නේ ය. තනා නිමකර ඇති නිවාසයක් විවෘත කිරීමේ අවස්ථාවන් වලදී රෙම ශ්‍රීලපාහට අයත් නිලධාරීන් සහ ආරාධිත අමුත්තන්ගේ ප්‍රධානත්වයෙන් රෙජිආබ ශ්‍රීලපාහ විසින් එම නිවාස ලාභීන් වෙත නිවාස පරිත්‍යාග කිරීම සිදුකරනු ලැබේ.

මෙම නිවාස ලබාදීමේ සුහසාධන වැඩපිළිවෙල යටතේ දනට ඉදිකර ඇති රණවිරු ගම්මානයන් හි ශ්‍රීලපාහ ඒකකයන්ට අයත් ආබාධිත සෙනීන්ට සහ මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන් සඳහා එම ගම්මාන වෙතින් ලබාදී ඇති නිවාසයන් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදිවේ.

**ලැබී ඇති නිවාස ගණන**

| | |
|---|---|
| වතුපිටිවල රණවිරුගම | 17 |
| කැරගල රණවිරුගම | 16 |
| පාන්ගොල්ල වත්ත රණවිරුගම | 13 |
| දෙඹගොඩ රණවිරුගම | 12 |
| උඩුපිල රණවිරුගම | 08 |
| ෆොව්ඩන් වත්ත රණවිරුගම | 05 |
| ජාතක බෝගොල්ලාගම | 05 |
| තල්ගස්විල රණවිරුගම | 05 |
| ගුරුගේ ඉඩම් දූනගහ | 02 |
| රණවිරුගම වැල්ලවාය | 02 |
| ගුරුගේ ඉඩම් කිරිදිවැල | 01 |
| දවිරුගම හමුද නිවාස සංකීර්ණය | 04 |
| ගෙවීමේ පදනම පැරඩයිස් වත්ත කුරුවිට | 04 |

මීට අමතරව යුධ හමුද අතිරේක සුහසාධක අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සහයෝගය ඇතිව මුදල් ආධාර මත නිවාස තනාගැනීම සඳහ රු, 1,50,000.00 බැගින් මුදල් ලබා දුන් ශ්‍රීලපාහ ඒකකයන්ට අයත් ආබාධිත / මියගිය රණවිරුවන්ගේ ඥාතීන් විසින් තනානිම කර ඇති නිවාස සංඛ්‍යාව සහ එම මුදල් ආධාර මත දනට වැඩ නිමවෙමින් පවතින නිවාස ගණන පහත සඳහන් පරිදිවේ.

| | |
|---|---|
| වැඩ අවසන් වීමෙන් පසු පදිංචි නිවාස ගණන | 12 යි |
| වැඩ නිමවෙමින් පවතින නිවාස ගණන | 27 යි. |

යුධ හමුදපති තුමාගේ විශේෂ මුදල් පරිත්‍යාග මත මෙම ආබාධිත බළඇණියට අයත් ආබාධිත සෙබලුන් තිදෙනකුට නිවාස තනා ගැනීම සඳහා රු. 2,00,000.00 බැගින් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, එම සෙබලුන් තිදෙනාගේ නිවාසයන්හි වැඩ දනට නිමවෙමින් පවතී.

තව ද මෙම බළඇණිය වෙත ඇතුලත් කර ඇති ආබාධිත සෙබලුන්ගේ මානසික තත්ත්වය උසස් මට්ටමකින් පවත්වා ගැනීම සඳහා ඔවුන් ක්‍රීඩා වෙත ද යොමු කිරීමට මෙම බළඇණිය ගත් ක්‍රියා මාර්ගයන්ගෙන් එකකි. ඇතැම් ආබාධිත ක්‍රීඩකයින් ඔවුන්ගේ පැවැති ක්‍රිඩා දක්‍ෂතාවයන් නිසා ක්‍රීඩා කෞශල්‍ය මහත් සේ දියුණු කර ගැනීමට සමත් විය. මෙම දක්‍ෂතාවයන් ඇති ආබාධිත ක්‍රීඩකයින් දේශ දේශාන්තරවල පවා ගොස් ජයලබා අප මව්බිමටත්, ජාතියටත්, ශ්‍රී ලංකා යුධ හමුදවටත්, ශ්‍රීලපාහ රෙජිමේන්තුවටත් මහත් ගෞරවයක් ලබාදීමට සමත් වී ඇත.

මෙයට අමතරව සංගීත ක්ෂේත්‍රයට හමුද සෙබලුන් දක්වන ලැදියාව මත සංගීතය පිළිබඳ කුසලතා ඇති ආබාධිත සෙබලුන් ශ්‍රීලපාහ රෙජිමේන්තුව නියෝජනය කරමින් දරනට රණවිරු සෙවනෙහි ආරම්භකර ඇති රණවිරු සංගීත කණ්ඩායම වෙත ද සේවයක් ලබාදීමට ඉදිරිපත්ව දනට සංගීත කණ්ඩායම නියෝජනය කරමින් සිටී.

1993 අගෝස්තු මස 15 වන දින සිට මෙතෙක් කල් ඉදිරියට ආ රෙජිආබ ශ්‍රීලපාහ බළඇණිය මේ වන තෙක් යුද්ධයෙන් මියගිය හා ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන් වෙනුවෙන් කළ සේවය අති මහත් ය. මින් ඉදිරියට ශ්‍රී ලංකා ධරණීය තලයේත්, සිංහල ජාතියේත්, භෞමික අඛණ්ඩතාවය සුරැකීම සඳහා ජීවිතය පරදුවට තබා සටන් වැද ආබාධිත තත්ත්වයට පත්වන අපගේ වීරෝදර රණවිරුවන් වෙනුවෙන් මෙයට වඩා උසස් සේවයක් කිරීමට රෙජිමේන්තු ආධාරක බළඇණිය ශ්‍රීලපාහට හැකිවේවායි ක්‍රියා ප්‍රාර්ථනා කරමු.

රෙජිමේන්තු ආධාරක
බළඇණිය ශ්‍රීලපාහ

# ආබාධිත රණවිරුවන්ට පරිත්‍යාග භාණ්ඩ ලැබීම

ශ්‍රී ලංකා ද්වීපයේ ඒකීය භාවය වෙනුවෙන් ත්‍රස්තවාදීන් සමග සටන් වැද ආබාධිත තත්ත්වයට පත් අප ශ්‍රී ලංකා පාබල හමුදාවේ ආබාධිත රණවිරුවන් හට පරිත්‍යාග ලබාදීමේ අරමුණ මුදුන්පත් කර ගෙන පොල්ගස්ඕවිට වෙනිවැල්කොළ ක්‍රීඩා සමාජය විසින් සංවිධානය කරනු ලැබූ බක්මහ උළෙල 1998 අප්‍රේල් මස 25 වැනි දින ශ්‍රී ලංකා පාබල හමුද ආබාධිත සෙබලුන්ගේ සහභාගීත්වයෙන් සහ ශ්‍රී ලංකා යුධ හමුද සංගීත කණ්ඩායමේ ද සහයෝගය ඇතිව පොල්ගස්ඕවිට වෙනිවැල්කොළ ක්‍රීඩාපිටියේ දී පවත්වන ලදී.

එම ක්‍රීඩා සමාජයේ සභාපති සුදත් වැලිවත්ත මසහතාගේ ආරාධනයෙන් මෙම බක්මහ උළෙල සඳහා සහභාගී වූ ශ්‍රීලපාහ ආබාධිත රණවිරුවන් හට අත්වාරු යුවල්, රෝද පුටු, හා විශේෂ ත්‍යාග පාර්සල් එම ක්‍රීඩා සමාජය විසින් එම බක්මහ උළෙලේ ත්‍යාග ප්‍රධානෝත්සවයේ දී ප්‍රධානය කරන ලදී.




*වෙනිවැල්කොළ ක්‍රීඩා සමාජයේ සභාපති සුදත් වැලිවත්ත මහතා විසින් ආබාධිත රණවිරු සෝ/14498 සැරයන් ආදාවල එන්එම්එල්යු හට අත්වාරු යුවලක් පරිත්‍යාග කරන අයුරුයි.*

## සෙබල පියෙකුගේ හදවතේ රිද්මය

තනිවී හිදින බංකරේ හුදකලාවෙක
මගේ දූව සිහිවෙලා ඇඬුනා අනේ මට
ඉමක් නොමැති තල්වැට දෙස බලාගෙන
පැය අට ඩියුටියෙහි යෙදුනා දුවේ මම

සුපුරුදු ලෙසින් මම සිටියත් යුධ පිටියේ
හදවත ඉකිබිඳින හඬ කිසිවකු නෑ දන්නේ
සිත් තුළ ඇති දිරිය ගෙන අවි දරමින්නේ
මගෙ රට රැකුමටයි මං අද වෙහෙසෙන්නේ

නිවාඩුවක් ලද නිවසට ආ විගස
තාත්තේ කියල දුව ආවා මා ළඟට
දින දහයේ නිවාඩුව සතුටින් නිමා කොට
හදවත් තුල මහ මෙරක් සේ දුක තබාගෙන
නැවතත් පෙර ලෙසම ආවා යුධ බිමට...

සෙ/300689
සායෙ වික්‍රමආරච්චි ඩබ්පී
15 ශ්‍රීලපාහ. ඩී. කණ්ඩායම.
පලෙයි - යාපනය




සැකසුම:
කපිතාන් ඩබ්ලිව්ආර් ගුණසේකර ශ්‍රීලපාහ

හිතවත් පාඨකය !

උතුරේ හා නැගෙනහිර බංකරයේ රාජකාරියේ යෙදී සිටින ඔබ වෙත නිරතුරුවම ගලාඑන කවි සිතිවිලි හා සංකල්පනා සඳහා මෙම පිටු කිහිපය වෙන් වී ඇත.

ඔබගේ උසස් නිර්මාණයන් "නල් අරඹේ සිට" වෙත ලැබීමට පහත සඳහන් ලිපිනයට තැපැල් කරන්න

සංස්කාරක, "නල් අරඹේ සිට", වයිට් හැකල් සහරාව, රෙජි ශ්‍රීලපාහ, හමුදා ජනපදය, පනාගොඩ

# අපේ පැතුම

සාමය මලින් සැරසී ගස් පිරෙන්නයි
යුද ගිනි නිවී සැම සැනසුම ලබන්නයි
රණවිරු හදට මතු සිසිලක් ගෙනෙන්නයි
පතනෙමි රටට සාමයේ සෙත සැදෙන්නයි

සිතේ ඇවිලෙන දුයේ ගින්දර
පිනි පොකුරු සේ මැකී යන්නයි
අපි සැම දෙනා දකිනා සිහිනයත් මෙයයි
අපේ සිහිනය සැබෑ වන්නට දෙන්න අපට හට දිරිය ශක්තිය

සෙ/309712 සාසෙ නන්දන කුමාර කෝකේඑස්
1 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම , කනගරායන්කුලම්

# සෙබල සිතුවිලි

ගීතයක් වගේ නොවෙයි ජීවිතය කටුකයි වේදනයි...
එහි මිහිර, සුවය ලබන්නේ කී දෙනෙක්ද....
විෂමය ලෝකය විවිධාකාරය ලෝකයේ ජීවත්වන අය වේදනාව
සිත් තුල හොවාගෙන සිනාසෙන්න යත්න දරණ
අයට සමාවක් නැහැ අනුකම්පාවක් නැහැ ලෝකයේ...
කවුද අකමැති සමනල් ලෝකයක ජීවත් වන්න තේ ද....
ඒත්... ඒත්! අපි ඒ ලෝකයේ තටු සිදුන සමනලයන් වගේ
ඒ තරම් සුන්දර ලොවක් නොපැතුවත් වේදනාව දුකින් තොර
සාමය සතුට නිදහස් පිරි ලොවක් හෙට දවසවත් උදා වුනොත්

සෙ/15871 කෝප්‍රල් සරත් පීඑච්
බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ

# රාත්‍රී මුරය

රෑ සඳ නැගෙයි
මුර කුටියම එලිය වෙලා
නිදිවරණා විටදී රෑයේ
සිහිවෙයි ඔබේ රුව මැවිලා
පාලුව දැනෙයි
මා තනිවම සිටින නිසා
එන්නට සිතෙයි
නිදි දෙව්දුව සමගින් ඔබව සොයා
නමුදු බැහැ එන්නට
කෝප්‍රල් ආවෝතින් මා වෙක් වෙනවා

සෙ/306361 සාසෙ මහේෂ් කුමාර එස්එස්එම්පී
3 ශ්‍රීලපාහ. ඒ කණ්ඩායම
ගුවන් සංග්‍රාමික බලසේනාව.
ජලසම්පාදන මධ්‍යස්ථානය මැදවච්චිය


## සෙබල සොයුරණී

එක බඩවැල කඩාගෙන මොලවෙ
එලිය දුටු සහෝදර කැලක් සේ එක්සත්ව
එකපත බෙදගෙන කමින් ගෙවමින් කටුක ජීවිතය
එනමුදු සතුටින් හෙට දිනය ගැන නිශ්චිතව නොසිතා
කැපවීමෙන් කටයුතු කරමු සැමද....

හෙට දින මොලොව එලිය දකින නොදරුවන් වෙනුවෙන්
කැප කරමු අපගේ අද දින
ඔවුන්ගේ හෙට දින ගැන සිතා
නිවහල් දයකට පා ඔසවන්නට
සාමයේ මල් මාවත තනන්නට
දිවි දී සුරකිමු ලක්බිමම සැමද....

'සේවය කරමු'

සෙ/304236 කෝප්‍රල් රත්නායක එස්එස්
ඒ කණ්ඩායම - 10 ශ්‍රීලපාහ




## මට නැති වූ තාත්තා

හිරු හැංගි අවරට යන සැන්දවක
තාත්තේ ඔබ නොමැති ගෙය
ගෙයක් නොව පාලු කතරකි
අප සැම තනි කොට නුඹ ගියා
යළි නොයෙන්නට....

හදවතේ රදුම් දෙන වේදනා
වරින් වර කියන්නට
කෙනෙක් නැත....

අනේ තාත්තේ මෙමට
පාලුවක් තනි කමක්
හදවතේ රජවෙලා
නුඹ නොමැති පාලුව
මගේ නෙත් තෙත්වෙලා
කඳුලු මැවූයේ තුමට ද
දෙවියනි....

නිරතුරුව සෙත් පතමි
බුදු හිමිට මල් පුද...

2/ලුතතන් ඩබ්ජ්ඩී බංඩාර ශ්‍රීලපාහ
7 ශ්‍රීලපාහ "බී" කණ්ඩායම

## ඔහුගෙන් ඇයට හසුනක්

දයාබර සොයුරියේ...
ඔබෙන් සමු අරන් ගම්පියස - නැද හිත මිතුරු කැල
ආවේ උතුරට - රකින්නට නිජබිම
දයාබර යුවතියේ....
ප්‍රථම නිවාඩුව - ලැබුණු විගසින්
ආවේ ගමවෙත ඔබ දකුමට - සිතේ සොම්නස් උපදවාගෙන
දයාබර සොයුරියේ
නමුදු ඔබ වෙනෙකෙකු අතගෙන - ගියේ ඇයි කියන් මා හට
විරුවගේ සේවය නොදන්නා - ඔබ වැනි අයෙක් වෙත්වී යාම
මහත් සැපතකි
සොයුරියේ....
අද නොව හෙට දින වැටහේ - විරුවගේ සේවය ඔබහට....

සෙ/15617 කෝප්‍රල් චන්දන වීරකෝන් ඩබ්ජ්
අණසහ පාලන කණ්ඩායම
12 ශ්‍රීලපාහ

## සුදු දියනියනි

නගමින් කිරි සිනහව දුව පැන නටන තියා
පුන්සඳ විලස නිවස බබලවන් තියා
සුරතල් බසින් හදවත් පුබුදුවන් තියා
මට ඇති පරම සම්පත "දූ" සිගිත් තියා

පෙර පාසලට උදයම පා නගන් තියා
මල්වැනි සොඳුරු කැල සහ පෙල ගැසෙන් තියා
බොළඳිය මගේ ගී සීපද ගයන් තියා
නිවසේ මිණි පහන මගේ "දූ" සිගිත් තියා

සිප්සත ලබා නැන නුවණින් වැඩෙන් තියා
මගේ දියනිටත් හෙට දිනයක් තිබෙන් තියා
විරු වරියක් වෙලා රටදය රකින් තියා
රත් තාරකාවකි මගෙ "දූ" සිගිත් තියා

සෙ/5 ඩී006 34
කෝප්‍රල් බංඩාර ආර්එම්
5 /ශ්‍රීලපාහ ඒ කණ්ඩායම
06 කණුව සාම්පල්තිව් ත්‍රිමලය

## රණබිමෙන් පෙම්වතියට

තනිවී නිදන රැයදී හුද කලාවක
සිරවී මිහිර මැද සැනසුම් ගුලාවක
සිරවී ඇතත් මා නෙත ඔබෙ සිනාවක
තනිවී සිතමි මා ඔබ ගැන විරාමක

දහදින නිවාඩුව ගෙවිනා ඉක්මනට
සමුගෙන ආවා ඔබගේ අද කඳවුරට
අද දින සිට නෙමසක් මෙහි ගෙවුනු විට
එන්නම් ප්‍රියේ ඔබ දකුමට යලි ගමට

සෙ/310531 සාසෙ බණ්ඩාර ආර්එම්ආර්විකේඩබ්
"බී" කණ්ඩායම - 6 ශ්‍රීලපාහ


## සිත නුඹ පාමුල රඳවා

උදුවප් සීතලට ගුලිවී
පිණි පොකුරු වැටෙන නිසාවක
නිදිවරන් දෙනෙත් අතරින්
නුඹ ගැන තතු විමසන සඳ....

ගිණි අවි අත දරන් සිටිනා
අතරතුරේ
ළං වෙන්න වරම් ඇත්නම්
මේ බවයේ.....

සුසුම් හිරවන කවි සිත
තබන්නම් මේ රුදුරු
දේශය තුළ
යොමන්නම් මා හද
ඔබේ සිත පාමුල

සෙ/301036 සාසෙ සේමගේ එස්ඩබ්
"ඩී" කණ්ඩායම 11 ශ්‍රීලපාහ



# ගැහැණිය

ගැහැණිය අහිංසාවේ ජීවමාන පිළිබිඹුවයි. අහිංසාව යනු අසීමිත ප්‍රේමයයි. එයින් අදහස් වන්නේ දුක් වේදනා දරිමෙහිලා ඇති අසීමිත හැකියාවයි. මිනිසාගේ මව වූ ගැහැණිය මිස මේ හැකියාව ඉතා ඉහලම ප්‍රමාණයෙන් පෙන්වා දෙන්නේ කවරෙක් ද?

බිළිඳු දසමසක් කුසෙහි දරා පෝෂණය කරමින් එයින් හට ගැනෙන දුක් වේදනාවෙන් සතුට ලබමින් ඇය මේ හැකියාව ප්‍රකාශ කරයි. ප්‍රසූත වේදනාව පරදලිය හැකි වෙනත් වේදනාවක් තිබේද? උපත ලබා දීමෙහි ප්‍රීතියෙහි ද ඇය මේ වේදනාව අමතක කර දමයි.

යළිදූ තම දරුවා දිනෙන් දින වැඩෙනු දකිනු වස් දිනපතා දුක් වේදනා උසුලන්නේ කවරෙක් ද? ඒ ආදරය මුළු මහත් මිනිස් සංහතියටම පතුරුවාලන්නට ඇයට ඉඩ සලසන්න.

එවිට මිනිසාගේ මව ලෙසින් ඔහුගේ නිර්මාතෘ ලෙසින්. ඔහුගේ නිහඬ නායිකාව ලෙසින් මිනිසා සමග ඇයට හිමි ප්‍රෞඪ ස්ථානයේ ඇය සිටිනවා ඇත. සාමය නැමැති අමාව අවශ්‍යව සිටින කලහාකාරි ලෝකයට සාමයේ කලාව ඉගැන්වීමේ කාර්යය ඇයට පැවරී ඇත.

- මහත්මා - ගාන්ධි-

සෙ/5 ඞ00877 සාසෙ කරුණාතිලක කේඑම්
14 ශ්‍රීලපාහ වැටුප් අංශය

# සෙබලියේ ඔබේ මෙහෙය යුද බිමට වටිනවා

යුද ඇඳුම ගිනි අවිය පුවසය පැළඳලා
පැක් එකද හෙල්මටය ජැකට් එක ගත වෙලා
පැමිණි ඔබ දෙස බැලිමි කවි සිතින් නෙත් හෙලා
අප ගතේ ඇත වීරිය තව තවත් සවි වෙලා

පිරිමි අපි අයුරු ඔබ සතුරො ගැන විමසලා
යෙදෙන මේ මෙහෙවරේ ඇත කඳුළු සිර වෙලා
ඔබ විඳින දුක් ගැහැට නොම දනුන තැන් බලා
පැන මගේ හසුරුවමි එවැනි තැන් බල බලා

උදේ සිට රෑ වෙලත් රැත් නිදහස නැතේ
රෝඩ් බොලොක් වලට වී ඉඳගන්න වත් නැතෙ
අවිව වැසි රෑ දවල් යුද බිමට හුරු නැතෙ
රට රකින සොයුරියේ ඔබේ දුක දත් නැතෙ

මානසික ලෙඩ්ඩු උස් වපර ඇහැ දනවා
ඔබෙන් තව වැඩ ගන්න වෙන අයත් බලනවා
ඔබ කරන මෙහෙවර ද සුලුවෙන්ම සිතනවා
දිනක මතු ඔබෙ නමත් ඉතිහාසෙ රැඳෙනවා

ලොකු අයගේ දූ වරුන් යුද බිමට නො එනවා
යුද බිමේ සෙබලියට අපහාස කරනවා
සාමයේ පරෙවියන් ආ දට සිතෙනවා
සෙබලියේ ඔබෙ මෙහෙය යුද බිමට වටිනවා

සෙ/00029 ච/සැරයන් හේරත් එච්එම්එස්
මූලස්ථානය 9 ශ්‍රීලපාහ
යුද හමුද කඳවුර අච්චුවේලි - යාපනය

# MY FAVOURITE PERSON

I CAN REMEMBER
WHEN I WAS A CHILD
SHE GAVE HER LOVE
AS WELL AS
I GROWN UP...
WHEN I WAS IN SICK
SHE NEVER DEPARTED ME...
SHE IS ONLY BRIGHTING STAR
IN MY WORLD
WHO IS SHE
SHE IS MY MOTHER,

O/63409 2/LT HARSHAPRIYA
'C' COY 8 SLLI

# Fore Ever Mother Land

To my dearest parents,
My smilers are your smiles
My teras are your tears
My victories are your victories
Therefore
My dearest father and mother
Don't cry in frant of me with Embrace
Because it may be a shock to my heart
It can not bear
So encaurage me
To do my duty to my motherland
Till death come to me
And then be proud of Your son.

2/Lt KS Pushpakumara
"C" Coy, 12 SLLI, Kanagarayankulam

# 12 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ වසරක අතීත මෙහෙවර



12 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව (ආධාරක) නමින් යුධ හමුදවේ මෙන්ම පාබල රෙජිමේන්තුවේ ලාබාලතම ඒකකයක් වශයෙන් අණදෙන නිලධාරි වන මේජර් එච්කේඑස් ප්‍රනාන්දු, ආර්ඩබ්ජී ශ්‍රීලපාහගේ නිවැරදි නායකත්වයෙන් යුතු 1997.01.11 දින 0813 පැයට වූ සුභ මොහොතින් වාවකච්චේරි ප්‍රදේශයේ දී ඉතාමත් අභිමානවත් අන්දමින් ස්ථාපනය කරන ලදී.

ඒකකයේ ආරම්භය සඳහා පනාගොඩ සිට වාවකච්චේරිය දක්වා ගිය අණදෙන නිලධාරීන්, 2 වන අණදෙන නිලධාරී වූ මේජර් ජේඩී මල්පාන, ආර්එස්පී, ශ්‍රීලපාහ සමග රෙදපාසැමේ හා විශාදපාසැමේ වශයෙන් කටයුතු කරන ලද බනි 11 දේශප්‍රිය ජී සහ පොදු සමාව IV අධියර යටතේ හාරවී මෙම ඒකකය වෙත මුලින්ම ලබාදුන් සෙනින් 18 දෙනා පළමු දූත පිරිස වේ. මෙම සියලූ දෙනා එවකට 1 ශ්‍රීලපාහ ඒකකය ස්ථානගතව සිටි වාවකච්චේරි කඳවුර වෙත ගොස් වැඩ කටයුතු ආරම්භ කිරීමත් සමග 1,3,4,6,7,8,10 යන සහෝදර බළඇණි වලින් ලබාදීමට නියමිතව තිබූ නිලධාරින් හා සෙසු නිළයින් විවිධ දුෂ්කරතාවයන් මධ්‍යයේ සුලූ කොටසක් පමණක් රපෝර්තු කරන ලදී. බළඇණිය ස්ථාපනය කිරීමට ප්‍රථම 1 ශ්‍රීලපාහ විසින් රාජකාරි කරමින් තිබූ අල්ලරායි, සරසාලේ, වාවකච්චේරි නගර සීමාව වැනි ස්ථාන වලින් මෙම ඒකකය මුදවා හදිසි ක්‍රියාන්විතයක් සඳහා අලිමංකඩ කඳවුර වෙත යැවීමට කටයුතු කරන ලෙස 52 සේනාංකය වෙතින් උපදෙස් ලැබී තිබුණි. නිලධාරින් හා සෙනින් නියමිත පරිදි රපෝර්තු නොකර තිබූ අවස්ථාවක ඒකකයේ පාලන උපකරණ මෙන්ම රාජකාරීන් සඳහා අවශ්‍ය හට පිරිස් හි හිඟතාවය මධ්‍යයේ වුව ද පැමිණි මෙම අභියෝගය අණදෙනනිලධාරී විසින් ඉතාමත් සුහද ලෙස පිළිගෙන එකී පෙදෙස් වල ක්‍රියාන්විත මෙන්ම සිවිල් පරිපාලන කටයුතු නියමිත පරිදි භාර ගන්නා ලදී. මේ අවස්ථාව වන විට ඒකකය වෙත රපෝර්තු කර සිටි නිලධාරීන් හා සෙසු නිලයින් දිවා රාත්‍රියේ දැඩි කැපවීමකින් යුතුව ක්‍රියාකළ අන්දම ඒකකයට ඉතාමත් ගෞරවයකි.

1997.01.11 දින බළඇණිය නිළ වශයෙන් ආරම්භ කිරීමේ උත්සවයේදී අණදෙන නිලධාරි විසින් සියලූ දෙනාගෙන් ඉල්ලා සිටින ලද්දේ ඒකකයේ සියලූම රාජකාරීන්, වගකීම් හා විනය ඉතා උසස් මට්ටමකින් පවත්වාගෙන තම රාජකාරීන් 'සේවය කරමි' යන ආදර්ශ පාඨය පෙරටු කරගෙන ඉටු කරන ලෙසයි. මෙම ඉල්ලීම ඒ ආකාරයෙන්ම ඉටු කිරීමට ඒකකයේ සියලූම නිලධාරීන් හා සෙසුනිළයින් ප්‍රතිඥ දෙමින් 52 සේනාංකයේ උපදෙස් පරිදි 521 බළසේනා මූලස්ථානය යටතේ තමන්ට පැවරී තිබූ රාජකාරීන් මනාව ඉටු කරන ලදී. මෙම රාජකාරී ඉටු කිරීමේ දී නව බළඇණියක් වශයෙන් විවිධ පාලන දූෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවූ අවස්ථා අපමණ වේ. එකී සියලූම දූෂ්කරතාවයන්ට සාර්ථකව මුහුණ දෙමින් අණදෙන නිලධාරීගේ නිවැරදි නායකත්වය යටතේ එම අවස්ථාවන් ක්‍රමානුකූලව මග හරවා ගැනීමට හැකිවිය. ත්‍රස්තවාදී ප්‍රහාර එල්ල වුව ද ඒවා නිසි පරිදි මැඩ පවත්වා ප්‍රදේශයේ සාමය ඇති කිරීමට හා සිවිල් පරිපාලනය ස්ථාපිත කිරීමට සියලූම නිලධාරීන් හා සෙනින් එක්ව ක්‍රියා කරන ලදී.

මුලූ මහත් ශ්‍රී ලංකාවට මෙන්ම ත්‍රිවිධ හමුදවට අතිශයින්ම වැදගත් වන වව්නියා - යාපනය ප්‍රධාන සැපයුම් මාර්ගය ත්‍රස්තවාදීන්ගෙන් මුදවා ගැනීම සඳහා ක්‍රියාත්මක 'ජයසිකුරු' මෙහෙයුම සඳහා මෙම ඒකකයේ දයකත්වය ද අවශ්‍ය විය. මේ අනුව වාවකච්චේරි ප්‍රදේශයේ රාජකාරී 12 වන විජයබාහු පාබල රෙජිමේන්තුව වෙත 97.10.08 දින භාරදී ඒකකයේ සියලූම හට පිරිස් 'ජයසිකුරු' මෙහෙයුම සඳහා නයිනමඩු ප්‍රදේශය වෙත පැමිණි 56 සේනාංක මූලස්ථානයේ උපදෙස් පරිදි 561 බසේමු යටතේ ඉදිරි ආරක්‍ෂක වළල්ලේ රාජකාරීන් භාරගන්නා ලදී.

මෙම ප්‍රදේශයේ ස්ථාන ගතව සිටින අවස්ථාව වන විට ඒකකයේ පළමු සංවත්සර දිනය ඉතාම චාම් අන්දමින් පැවැත්වීමට අණදෙන නිලධාරී තුමා විසින් තීරණය කරන ලදී. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රදේශයේ මෙන්ම යුධ හමුදවේ සහෝදර සෙබළුන් ඉතාම දූෂ්කරතාවයන් මධ්‍යයේ

රාජකාරී ඉටු කරනු ලබන අවස්ථාවක උත්සවය කටයුතු පැවැත්වීම කිසිසේත් නුසුදුසු වන හෙයිනි. මේ අනුව එහි දී ඉතාමත් චාම් අන්දමින් බළඇණි දිනය නිමාවට පත් විය.

එවකට මැදවච්චිය ප්‍රදේශයේ ස්ථානගතව සිටි බළඇණි මූලස්ථානය මගින් මියගිය සහෝදර සෙබළුන්ට පිං පිණිස හා රාජකාරියේ නියුතු සියලුම අයවළුන්ට රට රැකුමට ධෛර්යය, ශක්තිය හා දීර්ඝායුෂ පතමින් බෝධි පූජාවක් පවත්වා මහා සංඝයා වහන්සේලා වෙත අටපිරිකර හා සෙසු පිරිකර සමගින් දානයක් පිරිනමා බළඇණි දිනය සමරන ලදී.

අනෙකුත් පාබල ඒකකයන් සමග කරට කර සිටිමින් 'ජයසිකුරු' ක්‍රියාන්විතයේ ඉදිරියෙන්ම සිටින බළඇණියක් වශයෙන් ඉදිරියටම යමින් කනගරායන්කුලම් සිට මාන්කුලම් දක්වා වන ප්‍රධාන සැපයුම් මාර්ගය මුදා ගැනීමේ සටනට දායක වෙමින් ඉදිරියටම ගොස් ඇත. දැනටමත් මාන්කුලම් නගරයට කිලෝමීටර් එක හමාරක් පමණ වන තෙක් ඉදිරියට ගොස් ඉදිරි ආරක්ෂක වලල්ලේ රාජකාරී කරනු ලබන සහෝදර භට පිරිස් නුදුරේදිම මාන්කුලම් නගරය අත්පත් කර ගැනීමේ බලාපොරොත්තුවෙන් සිටී. මෙම භට පිරිස් සමග අණදෙන නිලධාරී හා 2 වන අණදෙන නිලධාරී වශයෙන් 98.04.18 දින වැඩ භාරගත් මේජර් ජේ එදිරිසිංහ, ආර්එස්පී, ශ්‍රීලපාහ ඔවුන්ව දිරිගන්වමින් ඉදිරි ආරක්ෂක වලලලේ ස්ථාන ගතව සිටී.

ගෙවී ගිය වසරක කාලය තුළ ඒකකය විසින් කුඩා හා විශාල ප්‍රමාණයේ ක්‍රියාන්විතයන් වලට ඉඳුරාම සම්බන්ධ වෙමින් ත්‍රස්තවාදීන් සතු අවි ආයුධ, ගුවන් විදුලි යන්ත්‍ර, පතරොම්, අත් බෝම්බ, ක්ලේමෝ බෝම්බ, පීඩන බෝම්බ හා වටිනා ලියකියවිලි සමග වෙනත් උපකරණ තොගයක් අත්පත් කර ගැනීමට සමත් වි ඇත. යුධ හමුදාවේ අනෙකුත් පාබල ඒකකයන් සමග සන්සන්දනය කිරීමේ දී මෙම ඒකකය පාලනමය අතින් මෙන්ම ක්‍රියාන්විත රාජකාරීන් වලින් සාර්ථක ප්‍රතිපල ලබා ගෙන ඉදිරියෙන්ම සිටින බැව් ආඩම්බරයෙන් යුතුව සිහිපත් කරමි.

ඒකකයේ සියලුම නිලධාරීන්ගේ හා සෙසුනිළයින්ගේ මානසික තත්ත්වය ඉතා උසස් මට්ටමකින් පවත්වා ගෙන යමින් රාජකාරීන් නියමිත පරිදි ඉටු කිරීමට විශේෂ වැඩපිළිවෙලවල් කීපයක්ම ක්‍රියාත්මක කර ඇත. මෙයින් ප්‍රධාන තැන් ගන්නා වැඩපිළිවෙලවල් කීපයක් පහත සඳහන් පරිදි වේ.

1. ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් තුවාල ලබා රෝහල් ගත වන සියලුම දෙනා හට එහි බරපතල තත්ත්වය අනුව රු. 7500.00 ක් දක්වා වන්දි මුදලක් ප්‍රධානය කිරීම. මෙම මුදල් ලබාදීමට කිසිදු සෙනියෙකුගෙන් මුදල් අය නොකිරීම මෙහි විශේෂත්වයකි.
2. සෙනීන්ගේ අවශ්‍යතාවය අනුව රු. 15000.00 ක උපරිමයකට යටත්ව 5% ක් වැනි සුලු පොලියක් අයකරණ මුදලක් කඩිනමින් ලබාදීම.
3. කොනොනි සමාජ ශාලාවක් ආරම්භකර ඉතාමත් සහනදායී පදනම් මත කොනොනීන් හට බියර් ලබාදීම. මෙම බියර් තොග මිලට ලබාගෙන එම මුදලටම ඔවුන් වෙත ලබාදීමට ක්‍රියාකර ඇති අතර, ක්‍රියාන්විත රාජකාරීන් වලට අවහිරතාවයක් නොවන පරිදි මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කරනු ලැබේ. මේ නිසා ඒකකයේ කොනොනියකු හට වෙනත් සහෝදර ඒකකයක කොනොනියකු වෙනුවෙන් ඉතාමත් උසස් අන්දමින් ආගන්තුක සත්කාරයන් කිරීමට අවස්ථාවක් ලැබී ඇත.

ඉහත සඳහන් වැඩ පිළිවෙලවල් ඒකකයේ සියලුම දෙනාගේ මෙන්ම 561 බළසේනා මූලස්ථානයේ හිටපු බළසේනාධිපති වන කර්නල් එම්සීඑම්ජී සමරසිංහ ආර්එස්පී. පීඑස්සී ගේ ද ප්‍රශංසාවට ලක්වී ඇත

ගෙවී ගිය වසරකට අධික කාලය තුල ඒකකයේ සහෝදර සෙබළුන් 05 දෙනෙකු කුරිරු ත්‍රස්තවාදීන් විසින් එල්ල කරන ලද ප්‍රහාර හේතුවෙන් මෙම ඒකකයට මෙන්ම යුධ හමුදාවටත්, ඔවුන්ගේ දෙමාපියන්ටත් අහිමිවී ඇත. මේ අවස්ථාවේ ඔවුන් ද තුවාල ලත් සහෝදර සෙබළුන් ද ඉතාම භක්ති ප්‍රනාමයෙන් යුතුව සිහිපත් කරමි.

මෙම ඒකකය ගොඩනැගීමෙහිලා ශ්‍රී ලංකා පාබල හමුද රෙජිමේන්තු අධිපති තුමන්ද, සේනාවිධායක තුමා සහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සියලුම නිලධාරී / සෙසු නිළයින්ද, අනෙකුත් සහෝදර පාබල් ඒකකයන්හි අණදෙන නිලධාරී වරුන් ගෙන් හා සියලුම නිළයින්ගේ මෙන්ම අනෙකුත් මූලස්ථාන / ඒකකයන් වෙතින් ලැබුණු සහයෝගය කෘතඥ පූර්වකව සිහිපත් කරමි.

මෙවැනි ඒකකයක සේවය කිරීමට ලැබීම අප සැමගේ වාසනාවක් ලෙස සලකන අතර මෙම ඒකකය යුධ හමුදවේ මෙන්ම පාබල රෙජිමේන්තුවේ බැබලෙන තාරකාවක් වැනිය. බළඇණිය ඉදිරි අනාගතය සඳහා පාබල සෙබළුන් වශයෙන් අප සැමගේ දායකත්වය උපරිම මට්ටමින් ලබාදීමට අදිටන් කර ගනිමු.

සකස් කලේ
සෙ/14422 සැරයන් තිමල්සිරි බංඩාර ජ්ජ්එස්
මූලස්ථානය 12 ශ්‍රීලපාහ
කනගරායන්කුලම්. මාන්කුලම්

# සෙබල දිරිගැන්ම

රිවිරැස ආරම්භයේ සිට අවසානය දක්වා මුළු සිංහල ජාතියම ත්‍රිවිධ හමුදාව සමග එක්වී බලා සිටියේ එමගින් රටට සාමය උදාවේ යැයි පරම අභිලාශයෙනි. එහෙත් එය යුධ හමුදාවේ අරමුණ වූයේ යාපා පටුන ජය ගැනීමක් පමණි. එද මූලික වූ ඒ වීරසෙන්පතිගේ වීරෝධාර ක්‍රියාශීලීභාවයෙන් එම නගරය අත්පත් කර ගැනීමට හැකි වූයේ අපේ සහෝදර සෙබලූන්ගේ එඩිතරභාවය නිසා යැයි එක හෙලාම කියන්න පුළුවන්. අන්න ඉහත ඒ ක්‍රියාදමය උදෙසා එද එක්වුණු ලාංකීක ජනතාව අදත් අප සමග මුහුණට මුහුණලා බලා නොසිටියත් අපේ විශ්වාසය කෙරෙහි අරමුණගත් ලාංකීක ජනතාව බලා සිටින්නේ මේ 'ජයසිකුරු' හඩින් රටට සාමය උදවේ යැයි අභිලාශයෙනි. ඉතින් සහෝදර සෙබලූනි ලක්ෂ සංඛ්‍යාතයක් අපි දෙස නෙත් යොමුකරමින් සිටින්නේ අපගේ විශ්වාසය මුල් කරගෙන. ඉතින් සහෝදර සෙබලූනි අපි නොබියව ඉදිරියට ගොස් 'ජය සිකුරු' මගින් ලාංකීක ජනතාවත් අන් සියළු දෙනාත් බලාපොරොත්තු වන කාර්යය ඉෂ්ඨ කරලීමට අපේ උපරිම ධෛර්ය ශක්තිය යොමුකර අන්න ඒ අරමුණත් 'රිවිරැසෙන්' ලැබුණු ජයග්‍රහණය වගේම මේ 'ජයසිකුරු' මාවත විවෘත කර ත්‍රස්තයන් වනසා රටට සාමය ගෙනදෙන මෙන් මාගේ සහෝදර සෙබලූන්ගෙන් ඉල්ලා සිටිමි. රණවිරු විරෝධාර සෙන්පති සැමටත් විශේෂ කාර්ය බහුලව යෙදී සිටින 'ජයසිකුරු' සේනාංක වලටත් රණවිරු සැමටත් ත්‍රිවිධ රත්නයේ පිහිටයි.

ඔබ සැමට ජය සිකුරුයි

සෙ/303055 කෝප්‍රල් සෙනරත් ඩබ්ජ්එල්
12 ශ්‍රීලපාහ. ආධාරක කණ්ඩායම. යුහ කඳවුර. කුන්චිකුලම්

# ගුවන් යානය

අද යුද හමුදවේ රාජකාරී කරන ඕනෑම ක්ෂේත්‍රයක අයෙකු එක් වාරයක් හෝ ගුවනින් ගමන් ගෙන ඇති බවට කිසිදු සැකයක් නොමැතත මේ අනුව ප්‍රථමයෙන් ගුවන් යානයක් නිපදවූයේ කවුරුන්ද? එය කුමන ආකාරයකින් සිදුවූවක් ද? යන්න පැහැදිලි කිරීම ඉතා කාලෝචිත එකක් බැවින් මෙම මාතෘකාව යටතේ ලිවීමට මම අදහස් කළෙමි.

ලොව මුලින්ම මිනිසුන් පවා තැනකින් තවත් තැනකට යාමට හැකි පහසුම ක්‍රමය පිළිබඳව යුහුසුළුව සොයා බැලිනි. ඒ අනුව සත්වයින් මාර්ගයෙන්, දව උපකරණ මාර්ගයෙන් එය පිරිමසා ගැනීමට මිනිසා තැත් කළේය. පසුව සාගර තරණය කිරීමට ද ක්‍රම සොයා ගත්තේය. ඉන් අනතුරුව ගුවන තරණය කිරීමත්, එය කෙසේ විය යුතු ද යන්න සොයා බැලීමට ලොව විද්‍යාඥයින් වෙහෙසට පත් වී තම ජීවිත පරිත්‍යාගයෙන් යුතුව ක්‍රියා කර ඇත.

පුරාණ කථාන්තර අනුව ගුවනින් ගමන් කිරීම පිණිස පක්ෂීන් සොයාගත් බව ප්‍රකටය. තවත් අවස්ථාවක ලී දඬු උපයෝගී කරගනිමින් ගුවන් යානා නිපදවා ඇත. මෙහි දී 'දඬුමොණරය' නම් වූ පුරාණ කථා වස්තුවක් අප සිහියට නැගෙන්නේ නිරායාසයෙනි.

මෙයින් පෙනී යන්නේ ගුවන් තරණය පිළිබඳව ඇත ඉතිහාසයක් තිබෙන බවය. එහෙත් නවීන තාක්ෂණයේ දියුණුව අනුව දැනට තිබෙන අධිවේගී ගුවන් යානා වලට එතරම් ඈත ඉතිහාසයක් නොමැති බව පෙනී යනු ඇත.

ලොව මුල්ම ගුවන් යානය නිපදවා ඇත්තේ ජර්මන් ජාතිකයෙකු වූ 'ඔටෝ ලිලියන් කෝල්' නමැති ඉංජිනේරුවා විසිනි. එය 1896 වසරේ දී සිදුවූවකි. ඔහු තමා විසින් නිපදවාගත් යානය සමග ගුවන්ගත වී වැඩිදුරක් නොගොස් ටික වේලාවකින් කඩාවැටී ඔහු ඇතුළු සහායකින් සියළු දෙනාම ජීවිතක්ෂයට පත්වූහ. මේ වන විට තවත් ගුවන් යානයක් නිපදවමින් සිටි 'රයිට්' නම් සහෝදරයන් පෙර සිදු වූ දුර්වලතා මගහරවා ගනිමින් ඔරුවට කොල්ලැව මෙන් යානයේ සමබරතාවයට පියාපත් දෙකක් අවශ්‍ය බව කරුණු වටහාගත් ඔවුන්, තම යානය නිපදවා යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් ගුවන් ගත කර නැවත නිරුපද්‍රිතව පොළවට පතිත කිරීමෙන් ගුවන් යානයේ නිර්මාතෘත්වය 'විල්බර් රයිට්' සහ ඔල්වර් රයිට්' නම් සහෝදරයන් දෙදෙනාගේ නම් ලෝක ඉතිහාසයට එක් කරන ලදී.

මෙම පළමු ගුවන් යානය ගුවන් ගත කරනලද්දේ 1903 දෙසැම්බර් 17 දින උතුරු කැරොලයිනාවේ කිට්හුක් නමැති ග්‍රාමයේ දීය. අද ලොව නවීන විද්‍යාවේ දියුණුව උච්චස්ථානයකට එළඹ ඇති බැවින් නියමුවන් රහිතව ද පාත්පයින්ඩර් නමැති යානාවට අඟහරු වැනි පිටස්තර ග්‍රහ ලෝකයන් ජය ගැනීමට ද හැකිවී තිබේ.

හුලං පිරවූ බැලූනයක් එහි කට අත හරිය විට බැලූනය සුළඟත් සමග ඉදිරියට ඇදී යාමේ න්‍යාය පදනම් කරගෙන විශාල හුලං පෙත්තක් යන්ත්‍රානුසාරයෙන් කැරකීමේ බලයෙන් වේගයෙන් ඉදිරියට යාමට සකස් කර ඇත. ලක්දිවට ප්‍රථමයෙන් ගුවන් යානයක් ගෙනෙන ලද්දේ 1911 සැප්තැම්බර් 12 වැනිද එවකට ලංකාවේ සිටි ඉංග්‍රීසි ආණ්ඩුකාරයෙක් වූ කෝලින් බ්‍රවුන් නමැති අයයි. මෙම ඓතිහාසික සිදුවීම දැක බලාගැනීම සඳහා විශාල ජනකායක් කොළඹ ගුවන්තොටුපල වෙත රැස්වූ බව වාර්තාවේ.

(කේපීවී ගුණසේකර මහතාගේ 'සුබෝධ රත්නකාරය නම් ග්‍රන්ථය ඇසුරෙනි)

බති 11 විජේසිංහ ඩබ්ලිව්
බුද්ධි අංශය - 15 ශ්‍රීලපාහ

# එල් එම් ජී අවියක් කථා කරයි

මම මුලින්ම උපන්නේ එනම් 1956 චීන සමූහාණ්ඩුවේ. ඉතිං මම තවත් සහෝදරයන් රැසක් සමග උපත ලැබුවත් එයින් අනෙක් සහෝදරයන් වෙනත්ර ටවල් බලා ගිය ද මම 1981 වර්ෂයේ දී සීමිත පිරිසක් සමග ශ්‍රී ලංකාව වැනි පුංචි දිවයින වෙත පැමිණියෙමි.

ඉතිං ටී 56 නමින් හැඳින්වෙන අය මගේ මල්ලී, මල්ලීගෙන් මෙන්ම මගෙන් ද මෙම දිවයිනේ සිටින සෙබලුන් බලාපොරොත්තු වූයේ වෙඩි බලයයි. මට ආවරණය වෙඩි සපයන්න පුළුවන්. මම කිලෝ 7.9 ක් බරයි. මගේ උස මිමි 1037 යි. මට අංකයක් ද තිබේ. ඉතිං මම දිවයිනට ඇවිත් ටික දිනක් කාමරයක සිර වී සිටියා. පසුව මා සමග පැමිණි මගේ සහෝදරයන් වෙනත් මිතුරන් සමග ගිය අතර, මට ද නව මිතුරෙකු හමු විය. ඔහු යුධ හමුදවේ ලා/කෝප්‍රල් වරයෙකි. ඔහු මගේ අංකය යොද අත්සන් කර ඔහු අතටම මා පත් කර ගත්තා. ඔහු අතට මම යන විට මාව රැගෙන යාමේ පහසුව සඳහා මට තවත් පටියක් එකතු කළා. එය මගේ බෙල්ල පැත්තෙන් සහ කකුල් පැත්තෙන් සවිකරන ලදී.

වෙනද මම සීතලෙන් බේරිලා සිටියත් දන් මට මගේ මිතුරා සමග ඔහුගේ තනිය පාලුව රකිමින් සීතලේ ගැහි ගැහී සිටීමට සිදුවේ. මගේ මිතුරා ඇඳුම් ඇන්දත් මට නම් හැමදම ඉන්න වෙන්නේ උපන් හැටියෙන් බව මම දනිමි. ඉතින් මට අවශ්‍ය වෙලාවට ක්‍රියත්මක වීමට නොහැක. ඒ වේලාවට මගේ මිතුරගේ සහාය අවශ්‍ය වෙනවා. සමහර වේලාවට මගේ අතවශ්‍ය තැන්වලට ඇඟිලි ගැසීම නිසා නොයෙක් අකරතැබ්බයන්ට මිතුරා මුහුණ පානවා.

සමහර අවස්ථාවල මගේ මිතුරා පුහුණුවීම් කටයුතු වල යොදනවා. එවැනි අවස්ථාවල දී මට ඔහුට සහාය දෙන්න වෙනවා. ඒ වේලාවට මගේ මිතුරා අමුතුම ජාතියේ ගීයක් කියමින් මගේ අවයව එකිනෙක ඉවත් කරනවා. ඒ වේලාවට මට රිදුනට මිතුරාට ගානක්වත් නැහැ. මිතුරා නිසාම ඉවසගෙන ඉන්නවා. මගේ ගලවන ලද කොටස් නියමිත ස්ථානවලට සම්බන්ධ කිරීමට නොහැකිවන අවස්ථාවල දී මිතුරා එම කොටස් කටෙන් එල්ලාගෙන සිටිනවා. එවැනි වේලාවල් වල දී මටත් අමාරුයි. ඔහුටත් අමාරුයි.

ඉතිං ඇත්තටම මටම කියල සතුරෙක් නැති වුනාට මගේ මිතුරාට සතුරන් ඉන්නවා. එවැනි සතුරන් දුටුවහොත් ඔහුගේ සහය ඇතිව මම ක්‍රියාත්මක වෙනවා. සමහර අවස්ථාවලදී මගේ මිතුරා බංකරයේ ඔලුව ගහගෙන මාව පමණක් බංකරයෙන් පිටතට දලා මාව පත ගත්වනවා. ඉතිං මට ඒ වේලාවට හිනාත් යනවා. සමහර වේලාවට කියනවා මම එයාගේ බිරිඳ කියලා. මගේ මිතුරාට නිදිමත වැඩි වේලාවන්හිදී ඔහුටත් නොදැන මාව බිම වැටෙනවා. ඊට පසුව මට බැන බැන ආපසු මාව එල්ලා ගන්නවා. රාජකාරී පැය ගණන අවසන් වූ වහාම මිතුරා හොඳට නිදියනවා මම ඈහැරගෙන බංකරයේ මුල්ලකට වී හේත්තු වෙලා ඉන්නවා.

ඉතිං අපි දෙනෙනා කොච්චර සිටියත් මාස 02 ක් 03 ක් වන විට මගේ මිතුරාට ගෙදර මතක් වෙනවා. ඒ වේලාවට ඔහුගේ දෙමාපිය සහෝදර හිත මිතුරාන් බලන්න යනවා. ඒත් ඉතිං මට මගේ උපන් රට බලා යන්නනම් ලැබෙන්නේ නැහැ. මට සිද්ධ වෙන්නේ මිතුරා නිවාඩු අවසන් වී කවද හෝ දිනයක එනතෙක් ඔහුගේ නමයි, අංකයයි පිටේ එල්ලගෙන අර මා මුලින් සිටි අඳුරු කාමරයේ කොනකට වී එල්ලී සිටීම පමණයි.

සෙ/14238
කෝප්‍රල් සෙනෙවිරත්න එම්ඩබ්එස්පී
15 ශ්‍රීලපාහ ඩී කණ්ඩායම පලෙයි - යාපනය

# අඩපන වී යන කොටි බලය

මුල් කාලයේ එල්ටීටීඊ සංවිධානය ආයුධ ගෙන එන ලද්දේ ඉන්දියාව හරහා ගොඩබිම් මාර්ගයක් ඔස්සේ ය. දකුණු ඉන්දියාවේ යම්කිසි ස්ථානයකට ගොඩබානු ලබන අවි ආයුධ වරින් වර අධිවේගී බෝට්ටු මගින් ලංකාවට ප්‍රවාහනය කිරීමට ඔවුන්ගේ එකල උපාය මාර්ගය විය. එහෙත් ඉන්දීය අගමැති රජීව් ගාන්ධි ඝාතනයත් සමගම එම මාර්ගය වැසී ගියේ ය. මේ වන විට කොටි සංවිධානය විසින් තම සංවිධානයට අනුබද්ධව නැව් සමාගම් දෙකක් ලියාපදිංචි කර තිබුණි. පාවිච්චිකර ඉවත් කරන ලද නැව් මිලදීගෙන ප්‍රතිසංස්කරණය කර නැවත යෙදවීමත්, නැව් කුලියට ගෙන තම ප්‍රවාහන පහසුකම් සපුරා ගැනීමත් මෙම සමාගම් දෙක මගින් සිදුවිය. මෙම කටයුතු භාරව සිටියේ ප්‍රභාකරන්ගේ සමීපතම ඥතියකු වූ කේ පද්මනාදන් නමැත්තාය. ගොඩබිම් මාර්ගය වැසීයාමත් සමගම එල්ටීටීඊ කලේ අවි ආයුධ හා පුපුරණ ද්‍රව්‍ය ගෙන එනු ලබන නැව් ජාත්‍යන්තර මුහුදු සීමාවේ නැංගුරම් ලා නවතා අධිවේගී බෝට්ටු මගින් ටිකෙන් ටික රටතුලට ප්‍රවාහනය කිරීමයි.


මෙම උපාය මාර්ගයට පළමුවන මරු පහර එල්ල කලේ ඉන්දීය නාවුක හමුදාව විසිනි. එල්ටීටීඊයේ මුල් පෙලේ නායකයෙකු වූ කිට්ටු ඇතුළු පිරිසක් විශාල අවි ආයුධ තොගයක් සමග ගමන් කළ අහට් නමැති නෞකාව ඉන්දීය නාවුක හමුදාව විසින් පහරදී ගිල්වා දමන ලදී. මෙය සිදුවූයේ 1994 වසරේ දීය. දෙවැනි ප්‍රහාරය එල්ල වූයේ මුලතිව් මුහුදේදී එවැනිම නෞකාවකට ශ්‍රී ලංකා නාවික හමුදාවෙවනි. එහිදී ද විශාල අවි ආයුධ තොගයක් සමග එල්ටීටීඊ පිරිසක් මුහුදුබත්විය. මෙවර ප්‍රහාරය එල්ල වූයේ එවැනිම තුන්වන නැවටය. එහිදී ප්‍රධාන පෙලේ කොටි නායකයන් කිහිපදෙනෙකු සමග තවත් පිරිසක් හා විශාල අවි ආයුධ තොගයක් මුලතිව් මුහුදු පත්ලේ වැනසී ගියේ ය. දළ වශයෙන් විශ්වාස කරන පරිදි එල්ටීටීඊය සතුව මෙවැනිම නැව් 05 ක් ඇති අතර එයින් 03 ක් මේ වන විට විනාශ වී හමාරය.

කොටි සංවිධානය තම සන්නද්ධ අංශයක් ලෙස මුහුදු කොටි බලකාය ගොඩනගන ලද්දේ ආයුධ බෙහෙත්, සටන්කාමීන්, හා වෙනත් සැපයුම් ප්‍රවාහනය කිරීමත් නාවුක හමුදාව සමග මුහුදේ සටන් කිරීමත් ඉලක්ක කරගෙනය. එහෙත් පසුගිය කාලසීමාව තුල සිදුවූ සිදුවීම් දෙස බැලීමේ දී පෙනී යන්නේ අපගේ නාවුක හමුදාව වෙතින් දිගින් දිගටම බරපතල ප්‍රහාරයන්ට ලක්වීමට මුහුදු කොටි බළකායට සිදුවී ඇති බවයි. ඒ අනුව ක්‍රමයෙන් මුහුදු කොටි බළකායේ කටයුතු මෙන්ම එල්ටීටීඊයේ සමුද්‍ර සංග්‍රාමය ද පසුබෑමකට ලක්වී ඇත.

එල්ටීටීඊයේ මුහුදු කොටි බළකායේ කටයුතු හීනවීමත් සමගම 'ජයසිකුරු' සේනාංකයන්ට වාසිදයක තත්ත්වයක් උදාවී ඇත. පුලියන්කුලම් ප්‍රදේශයට පැමිණ සිටි 'ජයසිකුරු' සේනාංක තම ගමන් මාර්ගය වෙනස්කර කැලෑ ප්‍රදේශය ඔස්සේ ඉදිරියට ගමන් කර පැහැදිලි ස්ථාවරයකට පැමිණ සිටි. ඔඩ්ඩුසුඩාන්, මාන්කුලම් මාර්ගය අත්පත් කර ගැනීමත් සමගම කොටින්ගේ බලය හීනවීමත් සිදුවී ඇති බව සටන් බිම තුළ සිටින කාටවුව ද පැහැදිලිව පෙනෙන්නට තිබේ. තම ස්ථාවරය ගොඩනගා ගැනීමත් හමුද ගමන් මග ඇහිරීමත් යන කරුණු දෙක මුල්කරගෙන ගෙවීගිය දිනයන්හිදී ඔවුන් එල්ල කර ප්‍රහාරයන් කීපයේදීම ඔවුන් නොසිතූ තරම් කොටි සාමාජිකයන් පිරිසක් හමුදාව අතින් මැරුම් කන ලදී. එමෙන්ම විශාල අවි ආයුධ තොගයක් ද ඔවුන්ට අහිමි විය. ප්‍රධාන රැකගැනීමත්, වනය තුලින්ඉදිරියට ඇදෙන හට පිරිස්වලට මුහුණදීමත් යන කරුණු දෙකටම දන් ඔවුන් සම්මාදන් විය යුතු ය. එය කියියේත්ම ඉටු කිරීමට අපහසු කරුණක් බව ඔවුන්ට ද වැටහී ඇත. එල්ටීටීඊයේ පිරිස් හමුදාව වෙත භාරවීමත් තම සංවිධානයෙන් බලපෑමක් දෙස බැලීමේ දී මෙය පැහැදිලිවේ. මේ වනවිට 'ජයසිකුරු' සේනාංකයන් විසින් කොටි සාමාජිකයන් 4000 ආසන්න ප්‍රමාණයක් මරා දමා ඇති අතර, තවත් 3000 ආසන්න ප්‍රමාණයකට බරපතල තුවාල සිදුකර ඇති බව සංඛ්‍යා ලේඛන සණනය කිරීමේ දී පෙනීය. කොටි බලය කිඳබැසගත් ප්‍රදේශයක් හරහා ගමන් කිරීමේ දී සතුරාගේ දැඩි ප්‍රහාරයන්ට මුහුණ දීමට සිදුවේ. විශේෂයෙන්ම සතුරු මෝටාර් ප්‍රහාර බහුලවීමත් හේතුකොටගෙන අපගේ තුවාලවීම් සංඛ්‍යාව ඉහල ගොස් ඇත. මෙතෙක් හමුදාව ලබාගත් ජයග්‍රහණයන් දෙස බැලීමේ දී අපගේ සහෝදර සොල්දදුවන්ගේ මානසික තත්ත්වය හා උපායශීලී ක්‍රියා මාර්ග ගැනීමේ හැකියාව ඉහළ තලයක තිබෙන බැව් ඉඳුරාම සඳහන් කළහැක.

දිගු කාලයක් තිස්සේ කොටි සංවිධානය විසින් යොදන ලද මුල් පෙලේ උපාය මාර්ග දන් දන් ප්‍රතිඵල රහිත තත්ත්වයකට පත්ව ඇති නමුත් කොටි සංවිධානයේ ක්‍රියාකාරකම් මුළුමනින්ම අඩපණවී ඇති බවත් ඇතැයි සිතීම අනුවන ක්‍රියාවකි. උදවන හෙට දිනයේ දී ඔවුන්ගේ දෙවැනි පෙලේ උපාය මාර්ග තුලින් හමුදාව සමග ගැටීමට පෙළඹීම අනිවාර්යයෙන් සිදුවන්නකි. නමුත් එම උපාය මාර්ග ජයගැනීමට හැකියාව අපගේ සහෝදර සෙබලුන් තුල ඇති බව පැහැදිලිවම පෙනෙන්නට තිබේ. වරින් වර සිදුවන සටනේ වාසි හා අවාසි තත්ත්වය දේලණය වීම නිසා අප අකර්මන්‍ය නොවී සියළු බාධකයන්ට මුහුණ දිය යුතු ය. ප්‍රභාකරන් අඩවියේ බළය පතුරවමින් හයමස් ගෙවන 'ජයසිකුරු' සේනාංකයන් ඉදිරියේ දී පැහැදිලි ජයග්‍රහණයක් ලබන බැව් පැහැදිලිවම සටහන් කළහැක.

ජයසිකුරු සටන්බිමේ සිට සටහන් කලේ
සැරයන් අයෝක බණ්ඩාර විජම
බුද්ධි අංශය - 3 ශ්‍රීලපාහ



# යාපනයේ පුංචි ඡන්දය

යාපනය ප්‍රදේශය තුළ සේවයේනියුතු ආරක්ෂක හමුදවක් ලෙසින් පසුගිය ද නිමාවූ මුළු ලොවෙහිම නෙත් යොමා සිටි යාපනයේ පැවැත්වූ ඡන්දය පිළබඳ තොරතුරු බිඳක් ඔබ හමුවේ තැබීම මැනවයි සිතමි. යාපනය ප්‍රදේශය තුළ පමණක් නොව ඒ අවට ප්‍රදේශය තුළ ද පැවැත්වූ මේ ඡන්දය පිළිබ ව සියළු තොරතුරු පහතින් සටහන් කරමි.

යාපනය සහ කිලිනොච්චි පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත මහ නගර සභා 01 ක්ද, නගර සභා 03 ක් සහ ප්‍රාදේශීය සභා 15 ක් තුළ මෙම ඡන්දය පවත්වන්නට යෙදුණි. එනමුත් කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ පැන නැගුණු ආරක්ෂිත තත්ත්වය හේතු කොටගෙන ප්‍රාදේශීය සභා 02 ක් ඡන්දය පැවැත්වීම අත්හිටුවන ලදී. මෙම ප්‍රාදේශීය සභා 02 ක හැර ඉතිරි පළාත් පාලන 17 ක් තුළ 1998 ජනවාරි මස 29 වන දින පවත්වන ලදී.

මෙම පළාත් පාලන 17 තුළ සම්පූර්ණ සභිකයින් 236 දෙනකු ඡන්දයෙන් තෝරාපත් කර ගන්නා ලදී. මෙම පුංචි ඡන්දය සඳහා පිළිගත් දේශපාලන පක්ෂ 5 ක් සහ ස්වාධීන කණ්ඩායම් 2 ක් තරග වැදුණි. එම පක්ෂයන් පිළිවෙලින් පහතින් දක්වා ඇති පරිදි වේ.

**දේශපාලන පකෂ :-**

1. ඊපීඩීපී (ඊලාම් ජනතා ප්‍රජාතාන්ත්‍රවාදී පක්ෂය)
2. ඊපීආර්එල්එෆ් (ඊලාම් ජනතා විප්ලවවාදී විමුක්ති පෙරමුණ)
3. ටෙලෝ (ද්‍රවිඩ ඊලාම් විමුක්ති සංවිධානය)
4. ඩීපීඑල්ෆ් (ප්ලොට්) (ප්‍රජාතාන්ත්‍රවාදී ජනතා විමුක්ති පෙරමුණ)
5. ටියුඑල්එෆ් (ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ)

**ස්වාධීන කණ්ඩායම්:**

1. වෙලනයි ප්‍රාදේශීය සභාව (ස්වාධීන 01 යි)
2. කයිට්ස් ප්‍රාදේශීය සභාව (ස්වාධීන 02 යි)

ප්‍රථමයෙන් මේ ඡන්දය සඳහා ඡන්ද මධ්‍යස්ථාන 424 ක ඡන්දය පැවැත්වීමට යෙදී තිබුණත් ආරක්ෂක හේතුන් මත ඡන්දය පවත්වනු ලැබුවේ ඡන්ද මධ්‍යස්ථාන 116 ක පමණි. මෙම ඡන්දය පැවැත්වීම සඳහා යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන් තුළ සේවය කරන රජයේ සේවකයින්ට අමතරව කොළඹ සහ වෙනත් දිස්ත්‍රික්කයන්ගෙන් රජයේ සේවකයින් 900 ක් පමණ සහභාගී වූහ. මීට අමතරව ආරක්ෂාව සැපයීම සඳහා අමතර පොලිස් කණ්ඩායම් සහ හමුදවන් ද කොළඹින් පැමිණ සිටියහ. මීට අමතරව ප්‍රවාහන පහසුකම් සඳහා කොළඹ සිට බස්රථ 94 ක් සහ අනෙකුත් වාහන 45 ක් පමණ නැව් මගින් ගෙන එන ලදී. ඡන්දය සඳහා තරග වැදුණු සියලූ දේශපාලන පක්ෂයන් තමන්ගේ සම්පූර්ණ සහයෝගය තේරීම් භාර නිලධාරීන්ට ලබාදුන් බව ද, ඡන්දයේ ආරක්ෂක කටයුතු ආරක්ෂක හමුදාව සහ පොලීසිය විසින් සතුටුදයක ලෙසින් ඉටු කර ඇති බව තේරීම් භාර නිලධාරීන් විසින් අපහට දන්වන ලදී.

මින් අනතුරුව ඡන්දය පැවැත්වූ පළාත් පාලන ආයතන සහ ඡන්දය පිළිබඳ අනෙකුත් විස්තර පහතින් සටහන් කරමි.

| පළාත් පාලන ආයතන | ලියාපදිංචි සංඛ්‍යාව | පාවිච්චි කරනලද ඡන්ද සංඛ්‍යාව | ප්‍රතික්ෂේප සංඛ්‍යාව | වලංගු ඡන්ද සංඛ්‍යාව | තෝරාපත් කර ගත් මන්ත්‍රී සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. යාපනය මහ නගර සභාව | 82667 | 11697 | 907 | 10790 | 23 |
| 2. වැල්වැටිතුරේ නගර සභාව | 11128 | 1479 | 255 | 1224 | 09 |
| 3. වාවකච්චේරිය නගර සභාව | 14802 | 3287 | 527 | 2760 | 11 |
| 4. කයිට්ස් ප්‍රාදේශීය සභාව | 30340 | 4095 | 269 | 3826 | 11 |
| 5. වෙලනයි ප්‍රාදේශීය සභාව | 31399 | 2876 | 284 | 2592 | 11 |
| 6. ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව | 4209 | 1925 | 125 | 1800 | 09 |
| 7. වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව | 37746 | 7632 | 1307 | 6325 | 14 |
| 8. වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව | 53697 | 6577 | 469 | 6108 | 21 |
| 9. වඩමාරච්චි නි. ප්‍රාදේශීය සභාව | 45214 | 10486 | 1868 | 8618 | 18 |
| 10. වලිකාමම් නැ. ප්‍රාදේශීය සභාව | 54386 | 12325 | 1711 | 10614 | 21 |
| 11. පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව | 29929 | 6252 | 1177 | 5075 | 09 |
| 12. වාවකච්චේරිය ප්‍රදේශීය සභාව | 39861 | 11900 | 2504 | 9296 | 15 |
| 13. නල්ලූර් ප්‍රාදේශීය සභාව | 32814 | 4803 | 554 | 4249 | 12 |
| 14. වලිකාමම් ද: ප්‍රාදේශීය සභාව | 41444 | 8757 | 939 | 7818 | 16 |
| 15. පේදුරුතුඩුව නගර සභාව | 12721 | 2610 | 374 | 2236 | 09 |
| 16. වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව | 41856 | 7956 | 1213 | 6743 | 16 |
| 17. පච්චිල පල්ලි ප්‍රාදේශීය සභාව | 7463 | 1969 | 385 | 1584 | 09 |

මීට අමතරව ඒ ඒ පළාත් පාලන ආයතන තුළ ඒ ඒ දේශපාලන පක්ෂයන් ලබාගත් ආසන සංඛ්‍යාව සහිත වගුවක් පහතින් දක්වා ඇත.

| පළාත් පාලන ආයතන | ඊපීඩීපී | ඊපීආර්එල්එෆ් | ඩීපීඑල්එෆ් | ටියුඑල්එෆ් | ස්වාධීන | ටෙලෝ |
|---|---|---|---|---|---|---|
| 1. යාපනය මහ නගර සභාව | 06 | 02 | 06 | 09 | - | - |
| 2. වැල්වැටිතුරේ නගර සභාව | 02 | - | 01 | - | - | 06 |
| 3. පේදුරුතුඩුව නගර සභාව | 02 | - | 06 | - | - | 01 |
| 4. වාවකච්චේරිය නගර සභාව | 02 | 03 | 06 | - | - | - |
| 5. කයිට්ස් ප්‍රාදේශීය සභාව | 09 | - | 01 | - | 01 | - |
| 6. වෙලනයි ප්‍රාදේශීය සභාව | 08 | - | 01 | - | 02 | - |
| 7. ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව | 08 | - | 01 | - | - | - |
| 8. වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව | 08 | 01 | 04 | - | - | 01 |
| 9. වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව | 06 | 02 | 02 | 11 | - | - |
| 10. වඩමාරච්චි නි. ප්‍රාදේශීය සභාව | 09 | 01 | 06 | - | - | 02 |
| 11. වලිකාමම් නැ. ප්‍රාදේශීය සභාව | 09 | 05 | 05 | - | - | 02 |
| 12. පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව | 05 | 02 | 01 | - | - | 01 |
| 13. වාවකච්චේරිය ප්‍රදේශීය සභාව | 04 | 03 | 07 | - | - | 01 |
| 14. නල්ලූර් ප්‍රාදේශීය සභාව | 07 | 02 | 02 | - | - | 01 |
| 15. වලිකාමම් ද: ප්‍රාදේශීය සභාව | 08 | 02 | 05 | - | - | 01 |
| 16. වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව | 10 | 01 | 03 | - | - | 02 |
| 17. පච්චිල පල්ලි ප්‍රාදේශීය සභාව | 02 | 02 | 05 | - | - | - |

යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන් තුළ පැවැත්වූ මේ ඡන්දය සාමයෙන් පැවැත්වීමට ආරක්ෂක හමුදව විශාල මෙහෙයක් ඉටු කෙරුහ. ඊට අමතරව මෙම පළාත් පාලන ආයතන තුළ පැවැත්වූ ඡන්දය පිළිබඳව දේශපාලණ පක්ෂයන්ගෙන් හෝ මහජනතාවගෙන් හෝ වෙනත් කිසිදු ආයතනයකින් හෝ කිසිදු පැමිණිල්ලක් ලැබී නොමැත. ඊට අමතරව කිසිදු ප්‍රචණ්ඩකාරී සිදුවීමක් ද වාර්ථා වී නොමැත. පොදුවෙන් ගත්කළ මේ යාපනය පුංචි ඡන්දය සාමකාමීව නීතියට අනුව සිදුකෙරුණු ඡන්දයක් හැටියට හැඳින්වීමට පුළුවන.

නි/63271 2/ලුති බිඩී පැලවත්ත
11 ශ්‍රීලපාහ යාපනය

# අභීකරු මදුරුවා

ඉතින් මදුරුවෝ ඔබගේ දුක සැප කෙසේ ද අපිට නම් ඔයාගේන් තොර ලෝකයක් නෑ. ඉතින් ඔබ එවපු ලිපිය ලැබුනා ඒ ලිපිය බලා මා සිතුවා අපේ වයිට් හැකල් එකටවත් ලියන්න ඕන කියලා මොකද ඔබ ඒ තරම් අහිංසක සතෙක් නිසා. ඔයාගේ මුල් ඉපදීම සිදුවෙන්නේ කොහේ ද කියා මා දන්නවා ඒත් ඔබගේ වර්ගයා වැඩිය බෝ කිරීමේ නීති ඔබ තවම දන්නේ නැතිව ඇති. ඒ නිසා වෙන්න ඇති ඔබ නිතරම කාකි යුනිපෝම් වලට ආස ඉතින් ඒ ගැන පවුල් සේවිකාවගෙන් උපදෙස් ගන්න. ඔබගේ නොසෑහෙන දරු උපත් නිසා අපගේ වර්ගයාට ලෙඩ සෑදෙනවා කියා ලඟදී ප්‍රවෘත්ති වලත් කිව්වා. ඉතිං මේ ලිපිය ඔබට මා ලිවීමට අදහස් කලේ ඔබව පහත් තත්ත්වයකට දමන්න නොවේ. ඔබ එක වෙලාවකට අපට හිසරදයක්, තවත් අයට නම් මරේ මරු ඒ අය සිතුවේ ඔබ සතුරෙක් කියා නෑ ඔබ කොටියන්ගෙන් උන්ව බේරා ගන්නවා නෙ. අර ගාඩ් එකේ ඉන්න අයට වද කරන්නෙ, කමක් නෑ ඒ අය ඉන්න පැය දෙකේම කන්න. ඒත් බුදියන අයට ඔබ වද කරන්න එපා. ඉතිං ඔයාගේ නංගීවත් ආදරයෙන් මතක් කළ බව කියන්න. ආ.... ඒක නෙමෙයි ඔයාල නිසා දැන් අපේ අයට උණ සෑහෙන්න හැදෙනවා සමහරක් අයට ආසයි. මොකද මැලේරියාවට සෑහෙන කල් රෙස්ට් කරන්න පුළුවන්නේ ඒ නිසා වෙන්න ඇති. අනේ මේ සමහර විට ඔයාටත් දෙස් කියන්න බෑ. අපේ අයමයි අපි ඉන්න වටාපිටාව අපිරිසිදු වතුර රඳවන්නේ ඉතින් අපගේ අයටත් කිසිම උවමනාවක් නෑ රෑට මදුරු කොයිල් හොයනවා පත්තු කරන්න. ඉතින් දැන් එන්න එන්නම මේ ප්‍රශ්ණයට මුල් වෙලා තිබෙන්නෙ අපේ අයගෙම නොසැලකිලිමත් කම නිසා අපේ අය අවට පිරිසිදුව ඉන්නවා නම් ඔයාලගෙන් කරදර අඩුවෙයි කියා මා සිතනවා.

ඒක නොවෙයි. ඔයා දන්නවා ද වැඩක්, සමහර විට ඔබලා සිතන්නේ නැතිව ඇති මේ ජීවිත විනාශය අප උතුරට ආවෙ මේ ජාති භේද ප්‍රශ්නය නිරාකරණය කරන්න. දැන් එන්න එන්නම වැඩියි. අපේ පිරිස මේ ළඟදී පුංචි පරීක්ෂණයක් කරා ඔබලාගේ උපත් ප්‍රමාණය හා මරණ ප්‍රමාණය බලන්න. ඉතින් ඒ සමීක්ෂණය ටිකක් සාර්ථකයි. ඔබලා හිතන්න මේ ටික. අපේ මේ වව්නියා ප්‍රදේශයේ කාකි යුනිෆෝම් 50,000 ක් කියලා දළ වශයෙන් ගත්තොත් ඔවුන් සැම දම මිනීවිරුවන් වෙනවා. එක්කෙනකු දවසකට ඔබලාගේ ජීවිත 10 ක් නැති කරනවා සිතන්න. බලන්න එක පැයකට එක්කෙනකුගෙන් 10 ක් ගානේ 50,000 ක් ජීවිත නැතිවෙනවා නේ එකතුව දන්නවා ද 50,0000 ක් හිතන්න අමාරුයි නේ ද, ඔයාලගේ ජීවිත හානිය. අත් මන්ද දැන් අපේ අයට බංකරයේ ඉදිරිපිට විතරක් බලා පිටමැද සතුරාව නසන්නට අතපය වටේ කරක කරක තමා ඉන්නේ අනේ දෙල් මදිවට පොල් කීවලු. බලන්නකෝ ලඟදී සිට අර කෝඳුරු රාළත් කැරකෙනවා නෙ උන්වත් දවල් රෑ නෑ හැම වේලේම කරදරේ. ඉතින් මෙහෙම ලිවීම ගැන කණගාටු වෙනවා. දැන් ඔයාව මට තිත්ත වෙලා තියෙන්නේ. ඔයා මේ ලියන ගමනුත් ඇඟ වටේ කැරකැවෙනවා ඔජායේ සින්දුව කිය කියා. අපේ අය නම් ගෝනි පොල්ලෙලි කොයිල් වලින් තමයි ඔයාලගෙන් තිබෙන කරදරය මර්ධනය කරන්නේ. අපට අර දීලා තියෙන කාකි නෙට් අනේ ඒ අස්සෙනුත් ඇවිත් බයිලා කිය කියා කන වටේ කැරකැවෙනවා. ඇත්තමයි දවසට ඔයාල අපේ ලේ බෝතල් කොපමණ බොනවා ද දැන් මේ ලිපිය බලපු ගමන් හැමෝටම කේන්ති යයි ඔයා ගැන සිතා. ඉතින් ඉවර කරන්න හිතෙන්නේ නෑ. ඔයා ගැන මට කොපමණ ලිව්වත් මදි. මම හිතනවා ඔබ ලියපු ලිපිය එන සැරේ වයිට් හැකල් එකට දමන්නත් හැබැයි මේ සැරේ මේක පල උනොත් තමයි පුතෝ. නැත්නම් මේක කුණු කූඩෙට යයි නොවරදවා ම ඔබ එවපු ලිපියේ කොටසක් මා දමන්නම් ඒකෙ තියෙනවා නෙ ඔබට වෙන අසාධාරණකම් කොපමණ ද කියා, ඉතින් ඒක පළවුනාම ඔබ ද හරි මම ද හරි කියා තේරේවි. ඉතින් මෙය දමන්න වයිට් හැකල් එකට කියා. ඔයත් නිතරම මේ හැකල් එක ලියන ලේඛක මහතෙකුට කරදර කරන්න. එතකොට එයත් නිතරම පලකරයි.

ඉතින් මා මේ ලිපිය දැනට නතර කරන්නම්. ඔයා ගැන මට මෙහෙම ලියා මදි. ඔයා කරන වැරදි වැඩ ගැනත් මම ලියනවා එන සැරේ. මෙයට හොඳ ප්‍රතිචාරයක් ආවොත් හැමදම ඔබ ගැන ලියනවා. ආ..... ඒක නෙවෙයි ඉක්මනින් මේ වර්ගයා වඳ කරන්න ජාතික පවුල් සංවිධාන අංශයට යන්න. ඔයාට ලස්සන පුංචි පවුල රත්තරන් වගේ හොඳ උපදෙස් දෙයි මේ ගැන හැබැයි පරිස්සමෙන් එතන ඉන්නේ වැඩිපුරම 'ගෑහැනු ළමයි' ඒ නිසා කාකි යුනිෆෝම් රෑට ඇවිත් දමන පාට් දම්මොත් ඔයාට එතනින් එන්න වෙන එකක් නෑ.ත ඔයාල සියලූ දෙනාට රීසට ඔඳං දෙවියන්ගේ පිහිටයි.

සෙ/304360
කෝප්‍රල් රත්නතිලක ඩබ්අයි
"බී" කණ්ඩායම 8 ශ්‍රීලපාහ ඔිලුමඩු

## දැඩි අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කරමු

අප ශ්‍රී ලංකා ද්වීපයෙහි ඒකීය භාවය උදෙසා සටන් වැද සිටින උතුරු නැගෙනහිර සෙබල සොයුරනි. අප දිවා රෑ නොතකා සටන් කරමින් අපගේ මේ මුතු ඇටයකන් වැනි පුංචි රට බේරා ගැනීම ශ්‍රී ලංකාවේ වෙසෙන තරුණයන් වන අපගේ යුතුකම වේ. මෙය අපගේ ද වගකීමයි. සියලු රණවිරුවන් මුලු රටක් ම සැම ජාතියක්ම බලා සිටිනුයේ මෙම රටේ සාමයෙන් සතුටින් ජිවත්වීමේ අභිලාෂයෙනි. මෙ නිසා අප සියලු ම දෙනා දැඩි අධිෂ්ඨානයෙන් යුතුව වීර ක්‍රියා විහි විදහා පාමින් සතුරා විනාශ කිරීමේ අභිලාශයෙන් නිර්භීතව අප දේශයේ නාමයෙන් පෙර රජවරු කළ දස්කම් සිහි කරමින් අප සටන් කරන්නෙමු. අප ඉපදුනු මාතෘභූමිය නමැති මේ කුඩා දිවයින කිසිම බලවේගයකින් යට කිරීමට ඉඩ නොදී එකම දේශයක් ලෙස සදා කල්හිම රැක ගැනීම පරම පවිත්‍ර අධිෂ්ඨානයයි. එල්ටීටීඊ වර්ග වාදී ත්‍රස්තවාදීන්ගේ ඊලම කියනුයේ නින්දෙදී දකින සිහිනයක් හා සමානය. අප සෙබල කැලගේ අධිෂ්ඨානය එකම ජාතියක් හා එකම දේශයක් එය රැක ගැනීම අප සියලූම සෙබල කැලගේ අධිෂ්ඨාන පූර්ව වගකීම සහ පරමාර්ථය වනු නිසැකය. අප අපගේ දේශය අපේ පන මෙන් සැම කල්හිම ආරක්ෂා කරන්නෙමු.

නි/63739 2/ලුති කේඑච්එම් කුමාරසිංහ ශ්‍රීලපාහ
"ඩී" කණ්ඩායම 8 ශ්‍රීලපාහ ඕලුමඩු

## මා දකින සැමරූ නිදහස

අවසරයි මිනිසුනේ මට මෙලෙස අසන්නට
1948 පෙබරවාරි මස 04 වෙනි දින ලැබුනා
වූ අපේ නිදහස
සැබැවින්ම එය නිදහසක් ද?
1972 ජනරජ ව්‍යවස්ථාවෙන් පසු ලැබුනායයි
කියා හඬ නගන රටේ සම්මත බුද්ධිමතුන්ගේ
නිදහස,
ඇත්තෙන්ම එය නිදහසක් ද?
නොනිද ජීවත්වන්නට මේ 'රටේ ජනතාවට
එය සැබෑ නිදහසක් නොවන බව නොරහසකි.
එසේ නම් 1948 පෙබරවාරි මස 04 වැනි ද
සිට සමරන නිදහස කුමක් ද?
දේශපාලන නිදහසක් ද?
සමාජයී නිදහසක් ද?
සංස්කෘතික නිදහසක් ද?
ආගමික නිදහසක්ද?
ආගමික, සමාජීය, දේශපාලන, සංස්කෘතික
මේ සියල්ලගේම අවසන් ප්‍රතිපළ පුද්ගලික
නිදහස නොවන්නේ ද
පුහු ආටෝප, සටෝප වලින් පිරුණු උත්සව
වලින් තොර මුලු මහත් ජාතියක් අපේක්ෂා
කරනා නුඹලාට රටක් ජාතියක් නැද්ද? මව්
බිමක් නැද්ද සතුරාගෙන් බේරා ගන්නට?
අවදිකරන්නට කාලය එළඹ ඇත නිද
නොනිද සිටින උදසීන මිනිසුන්
කාලය එළඹුණේ අද ඊයේ නොවේ. එය
උදවුයේ මෙයට දසකයකටත් පෙරය.
මා දකිනා සැනකෙළි කෙලිනා නිදහසේ
අරුත මෙයයි.

සෙ/308295
සාසෙ ප්‍රියන්ත ඩී
11 ශ්‍රීලපාහ අරියාලෙයි - යාපනය

# ළදරු වයසේ අප යුධ බිමේ 14(සෙව්) ශ්‍රීලපාහ

පෙරදිග මිතු ඇටය ලෙස පුරාණයේ සිට ලෝකයා විසින් හඳුන්වන ලද පුංචි රට වන අපේ ලක්දිව තුල නොයෙක් ජාතීන් හා ආගමිකයින් ජීවත් වන සෞභාග්‍යමත් රටකි. අප රටේ ඉතිහාසය දෙස ආපසු හැරී බැලුවහොත් ඔවුන් අතරින් ලොවේ නම් දරාපු වීරවරයින් ගණනාවක් සිටි බැව් පොත් පත් ලියූ ලේඛකයින් අභිමානාත්මකව සටහන් තබා ඇත.

එවැනි ඉතිහාසයකට උරුමක්කාරකම් දරණ ලක්දිව අද මූණපා ඇත්තේ සුව නොකළ හැකි වසංගත රෝගයක් ලෙස අප මුළු මිනිස් සමාජයම දකින කුරිරු ත්‍රස්තවාදී උවදුරයි. මෙම අවි අමෝරාගත් ත්‍රස්තවාදීන් මේ ලක් දෙරණ මතින් සදහටම තුරන් කර සමගියෙන් සපිරි නිවහල් දයක් තුල එකා මෙන් ජීවත් වීමයි. අප සියලූම ජන කොටස්වල ඒකායන බලාපොරොත්තුව.

මේ අවි අමෝරාගත් කුරිරු ත්‍රස්තවාදීන් මොහොතින් මොහොත මිනිස් ජීවිත දහස් ගණනින් බිලිගෙන මේ උතුම් දිවයින දඩබිමක් කර ගන්නට වැයම් දරන මෙවන් අවදියක එයට එරෙහිව සටන් වදින යුධ හමුදාව සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන්නට විය. ඉන් යුධ හමුද පාබල හමුදවේ එක් සාමාජිකයකු වූ ශ්‍රීලපාහ ඒකක 01 සිට 15 ක් දක්වා එක් රෙජිමේන්තු මධ්‍යස්ථානයක් යටතේ ව්‍යාප්ත වී ඇති බැව් සාඩම්භරයෙන් සිහිපත් කරන්නෙමු.

මෙම ඒකකය ස්වේච්ඡා ශ්‍රීලපාහ නව බළඇණියක් ලෙස එනම් මීට අවුරුදු 01 යි මාස 03 කට පෙර පුරාණ ඉතිහාසයකට උරුමකම් කියන එහෙත් අද යුද්ධ ග්‍රහණයට ලක් වූ යාපා පටුනේ, කයිට් දූපතේ දී 1996.12.30 වන දින උපත ලදී. ඒ ළදරු වයසේ සිටම අනිකුත් සහෝදර ඒකකයන් සමග උරෙන් උර ගැටී ජයග්‍රාහී මාවතක් ඔස්සේ ජයග්‍රහණ රැසක් අතපත් කරගෙන අද වන විට උසන් - මිරුසුවිල් ආරක්ෂක වලල්ලේ ත්‍රස්තවාදී ක්‍රියා මැඩලීමේ ක්‍රියාත්විතයේ උදරතර මෙහෙයකට උරදී රාජකාරියේ යෙදී ඇති බැව් අප පාබල සෙබලුන් වශයෙන් අභිමානවයෙන් යුතුව මුලු ලොවට හඬගා කියන්නෙමු.

සෙ/14ඩී00200 කෝප්‍රල් ලීල් සමරසේකර ඊඇම්
මූලස්ථානය 14 (සෙව්) ශ්‍රීලපාහ
යුධ හමුද කඳවුර උසන් මිරුසුවිල් යාපනය

# 5 වන (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදවේ දසක සංවත්සරය

ශ්‍රීලපාහ රෙජිමේන්තුවට අයත් ජ්‍යෙෂ්ඨත්වය මත දෙවෙනි ස්වේච්ඡා ඒකකය වන 5 වන (සෙව්) බළඇණිය, ශ්‍රී ලංකා පාබල හමුදව 1997.08.15 වන දිනට දසවන සංවත්සරය සමරණ ලදී.

5 වන (සෙව්) ශ්‍රීලපාහ ඒකකය ආරම්භය 1987.08.10 වන දින වුවත් මෙම ඒකකයට වර්ෂ 1962 වැඩි දුරටත් දිවයන ඉතිහාසයක් ඇත.


1962 වන විට ඒකකයට තිබූ ස්වේච්ඡා ඒකක තුනක් විසුරුවා හැර 1962 දී පළමුවන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුලුව ස්ථාපනය කළ අතර, 1981 දී එම බලමුලුව විසුරුවා හැර 2 වන විමර්ෂණ රෙජිමේන්තුව ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය (සෙව්) නගා සිටුවන ලදී. එම බළකාය ද 1987 දී විසුරුවා හැර 5 ශ්‍රීලපාහ ඒකකය නගා සිටුවන ලදී.

පළමුවන දෙවන සහ තුන්වන ඊලාම් යුද්ධ වලදී සහ 1989 භීෂණ සමයේ දී ඒකකය දිවයිනේ විවිධ ප්‍රදේශවල රාජකාරී කරන ලදී. උතුරු නැගෙනහිර ද මෙම ඒකකය ත්‍රස්තවාදීන්ට එරෙහිව සටන් කිරීමේ දී නිලධාරීන් 04 ක් සහ සෙසුනිළයින් 119 ක් ජීවිත පරිත්‍යාග කර ඇත.

දනට මෙම ඒකකය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුඹුරුපිටිය සහ පුල්මුඩේ කොට්ඨාශවල ස්ථානගතව ඇත.

ඒකකයේ 10 වන සංවත්සරය වෙනුවෙන් පල්ලෙකැලේ පසු මූලයේ ආගමික වතාවත් සිදුකරණ ලදී.

බීජේ ලේකම්ගේ
කපිතන්. ශ්‍රීලපාහ විධායක
අධිකාරී - 5 (සෙව්) ශ්‍රීලපාහ



*6 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරී වශයෙන් මේජර් එස්කේජීඑන්බී ඇහැලමල්පේ ශ්‍රීලපාහ වැඩ භාර ගැනීමට පෙර සම්මාන මුරය පිළිගන්නා අයුරු*

# අණ දෙන නිලධාරී භාරදීම / භාරගැනීම

*1998 අප්‍රේල් මස 08 වන දින 9 වන (සෙවි) බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදවේ අණදෙන නිලධාරී වශයෙන් ලුතිතන් කර්නල් ඩබ්ඩ්එල්පී වික්‍රමසිංහ, ශ්‍රීලපාහ යෙදුණු සුභ මොහොතින් වැඩභාර ගැනීම*





*1998.04.24 වන දින ලුතිතන් කර්නල් ඒයූසී සුරවීර ශ්‍රීලපාහ 2(සෙවි) ශ්‍රීලපාහ ඒකකයේ 35 වන අණදෙන නිලධාරී වශයෙන් පත්වී වැඩ භාරගැනීම*

# පාසල් දරුවන් වෙනුවෙන් දිවිදුන් රණවිරුවන්

ශ්‍රී ලංකා පාබල හමුදවේ 14 (ස්වේච්ඡා) බළඇණියේ නිලධාරියෙක් ඇතුළුව රණවිරුවන් හත් දෙනෙකු කොඩිකාමම් - මිරුසුවිල් ප්‍රදේශයේ දී පාසල් දරුවන් වෙනුවෙන් 1998 පෙබරවාරි මස 16 වන දින දිවි පිදූහ.

ලැබුණු තොරතුරක් අනුව ක්‍රියාත්මක වූ සෙබල පිරිස එදින තම ආරක්ෂක වළල්ලෙන් පිටතට ත්‍රස්තවාදීන් සොයා සටන්කාමී මුර සංචාරයක් ක්‍රියාත්මක කරන ලදී. එහිදී අප සෙබල පිරිස් හට මුහුණ පෑමට සිදුවූයේ නොසිතූ විරූ තත්ත්වයකි. රුදුරු ත්‍රස්තයන් සාමාන්‍ය ඇඳුමෙන් සැරසී පාසල් දරුවන් පළිහක් ලෙස යොද ගනිමින් අප හට පිරිස් වෙත ප්‍රහාරයක් එල්ල කරන ලදී. මෙහි දී එම හට පිරිස් මෙහෙය වූ නිලධාරිගේ අණ ක්‍රියාත්මක වී ඇත්තේ පාසල් දරුවන්ට කිසිදු හානියක් සිදු නොවන ලෙසයි. මෙය අප අදත් අභිමානයෙන් යුතුව සිහිපත් කරමු.

මේ සැබැදිව ප්‍රධාන පුවත්පතක ලියවී තිබුනේ මෙසේ ය. 'යාපන වැසියන්ගෙන් යුධ හමුදවට පැසසුම්' 'රණවිරුවන්ගෙන් එද - මෙද තුර අප දුරු උතුම්ම ආදර්ශයක්'

එහිදී ත්‍රස්තයන්ට ද බරපතල හානි සිදුවූ අතර එක් ත්‍රස්තවාදියෙකුගේ මළ සිරුරක් සහ ආර්පීජී වර්ගයේ ගිනි අවියක් අප හට පිරිස් විසින් සොයා ගන්නා ලදී. එහි දී අපගේ තවත් සෙබළුන් හතර දෙනෙකු තුවාල සිදුවීමෙන් රෝහල් ගත කරන ලදී.

යුධ හමුද රණවිරුවන්ගේ ශ්‍රේෂ්ඨත්වය කැප කිරීම හා අවස්ථානු කූලව ක්‍රියා කිරීම නිසා සිවිල් වැසියන් වෙත තව තවත් සමීප වීමට හැකිවීම හමුදව ලැබූ තවත් ජයග්‍රහණයකි. මෙවන් සිදුවීම් මත විශ්වාසනීයත්වය තව තවත් ශක්තිමත් වන අතර එය යුද්ධයේ නිමාවක පසු බිමක් වනු නියතය. එය අප සැමගේ ඒකායන ප්‍රාර්ථනයයි.

මෙය සැම ත්‍රිවිධ හමුද සහ පොලිස් රණවිරුවකු විසින් ම අගය කළ යුතුයි. පිළිපැදිය යුතු ආදර්ශයකි. ඔවුන් රට ජාතිය වෙනුවෙන් දිවි පිදූහ. අප ඔවුන්ගේ ලද ආදර්ශය නොමියෙන්නට ඉඩ දිය යුතු නැත.


නි/21515 2/ලුතිතන් පීවීජ් රෝහිත ශ්‍රීලපාහ
14 (සෙව්) ශ්‍රීලපාහ - ඩී කණ්ඩායම
යුධ හමුද කඳවුර
කච්චායි - කොඩිකාමම්
යාපනය


## Platoon Commander's Keys to Success

1. TAKING THE INITIATIVE - Expected to continue the mission in the absence of orders
2. LEADING BY EXAMPLES - There is no important leadership trait than being an example for his soldiers and NCOs to follow
3. DELEGATING AUTHORITY - Should use the experience of his NOCs. Can delegate authority but can not delegate responsibility.
4. TAKING CARE OF SOLDIERS - Not mean making them happy and confortable, but means training them to become seasoned soldiers on battle field because they are technically, physically, and mentally proficient. Showing sympathy to a soldier who is hot or tried, for instance, will only weaken him for facing real challenges in COMBAT. Same time must be able to recognise cases in which a soldier may be over heated or suffering from heat exhaustion./
5. UPHOLDING MORAL AND VALUES - Think of evey thing in the We sense instead of the I sense
6. EXHIBIT LOYALTY AND INTEGRITY - Many times he will find himself in disagreement with other officers. His only option is to VOICE HIS OPINION IN A PROFESSIONAL MANNER.

Leaders does not speak critically of another leader infront of troops

Give orders on own name instead of saying "men, the commander says we have to..."


CAPT S. D UDAYASENA


# 1998 වර්ෂය වෙනුවෙන් උතුරු නැගෙනහිර පවත්වන ලද පළාත් සභා ඡන්දය

යාපනය පළාත් සභා ඡන්දය 1998 ජනවාරි මස 29 දින පැවැත්වීමට කටයුතු සලසා තිබුණි. යාපනය දිස්ත්‍රික්කය තුළ මෙම ඡන්දය සඳහා දෙමළ පක්ෂ 06 ලියා පදිංචි වී තිබුණි (ඊපීඩීපී, ඊපීආර්එල්එෆ්, ප්ලොට්, ටෙලෝ, ටීයූඑල්ෆ්) සහ ස්වාධීන වශයෙන් යාපනය ත්‍රස්තවාදී ග්‍රහනයෙන් මුදවා ගෙන සිවිල් පාලනය ඇතිකිරීමෙන් පසු මෙවැනි ඡන්දයක් පැවැත්වීම යාපනය වැසියාට ලැබුණු නිදහසේ තවත් එක් ජයග්‍රහණයක් විය. වසර ගණනාවකට පසු මුහුණදුන එකම ඡන්දය මෙය විය. මුලු යාපනය දිස්ත්‍රික්කයේම ඡන්ද අපේක්ෂකයින්ගේ නම් ඡන්ද ලකුණු පින්තූර සහිත දැන්වීම් වලින් පලවී වාහන සහ සෑම තාප්පයක් බිත්තියක්ම පිරී තිබුණි. ශබ්දවිකාශණ යන්ත්‍ර යොදගනිමින් ඡන්ද ප්‍රචාරක කටයුතු අපේක්ෂකයින් මහත් ඉහලින් සිදු කළේය. මෙම ඡන්ද ප්‍රචාරක කටයුතු වලදී එක් එක් පක්ෂය අනෙක් පක්ෂය අභිබවා ප්‍රචාරක කටයුතු කිරීම නිසා ප්‍රචාරක තරගයන් ද ඇති වී තිබුණි. එම තරගය නිසාම එක් පක්ෂයකගේ ප්‍රචාරක කටයුතු ඉහලින්ම සිදුවිය. එල්ටීටීඊ ත්‍රස්තවාදීන් මෙම ඡන්ද ප්‍රචාරක වාහනයක තිබී ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ඡන්ද අපේක්ෂකයින් ප්‍රචාරය කළ කැසට් පටය ගලවා දමා එල්ටීටීඊ සංවිධානයේ ප්‍රචාරක කැසට් පටයක් ප්‍රචාරය කළ අවස්ථාවක් යාපනය කෝපායි ප්‍රදේශයෙන් වාර්තා වී තිබුණි. කොටි ත්‍රස්තවාදීන් මෙම ප්‍රචාරක කටයුතු සහ ඡන්ද මධ්‍යස්ථාන හා ඡන්ද අපේක්ෂකයින් ඉලක්ක කරගෙන මෙම ඡන්දය කඩාකප්පල් කිරීම සඳහා විශාල සැලැස්මක් දියත් කර තිබුන ද, එය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව ත්‍රස්තවාදීන් කෙරෙහි ආරක්ෂක හමුද දැඩි අවධානයෙන් සිටීම නිසා ගිලිහී ගියේ ය.

ඡන්දය ආරම්භ වූ දින සිට ඡන්දය අවසන් වන තුරු කිසිදු විරෝධතාවයක් ත්‍රස්ථ ක්‍රියාවක් සිදු නොවන්නට උතුරෙ ආරක්ෂක හමුදවන් සියලු විධිවිධාන යොද තිබුණි. 9(සෙව්) ශ්‍රීලපාහ ඒකක බලප්‍රදේශ තුල අච්චුවේලි ප්‍රදේශය අයත් කෝපායි ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ඡන්දය සාමකාමී අයුරින් සිදුවිය. ඡන්දය සඳහා අපේක්ෂකයින් 27 දෙනකු ඉදිරිපත් විය. පක්ෂ 04 ක් තරග වැදුනු අතර මෙම ප්‍රදේශයේ ද ත්‍රස්තවාදීන් ඡන්ද කඩාකප්පල් කිරීමට කටයුතු යොද තිබූ අතර, ආරක්ෂක හමුදවේ දිවා රෑ දැඩි මුරකාවල් ඔස්සේ ඔවුනට එවන්නක් කිරීමට අවස්ථාවක් නොතිබුණි.


ව/සැරයන් හේරත් එම්එම්එස්
මූලස්ථාන 9(සෙව්) ශ්‍රීලපාහ
යුධ හමුද කඳවුර . අච්චුවේලි - යාපනය

# "ඉංග්‍රීසීන් උඩරට රාජධානිය ඇල්ලීමට ගත් උපක්‍රම"

ඉංග්‍රීසින් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අල්ලා ගත්තේ කන්ද උඩරට සිංහලයන් යුද්ධයකින් පරාජය කිරීමෙන් නොවේ එවකට සිටි ශ්‍රී වික්‍රම රාජසිංහ රජු මත්පැන් වලට පුරුදු කරවා සිංහල නායකයන් කෙරෙහි අවිශ්වාසය ගොඩනගා සිංහලයන්ට මහත්සේ කෲර ලෙස සැලකීමට යොමු කරවීමතුලින් ඔහු රට වැසියාට අප්‍රසන්න පුද්ගලයෙකු බවට පත් කරමින් අනෙක් පසින් තමන් සිංහලයන්ගේ ගැලවුම් කාරයන් ලෙස පෙනී සිටි සිංහල නායකයන් මුලා කර රවටා උඩරට ගිවිසුම අත්සන් කර ගැනීමෙනි.

එහිදී 1818 කැරැල්ල මෙහෙයවන ලද්දේ සිවුරු හැර රාජප්‍රති රූපකයා ලෙස පෙනී සිටි විල්බාවේ විසිනි. මෙම නිදහස් සටන ඉංග්‍රීසින් විසින් කෲර ලෙස මර්ධනය කරන ලද අතර වීර කැප්පෙටිපොළ හා මඩුගල්ලේගේ හිස ගසා දමන ලදී. සිර භාරයට ගත් වාරියපොල ශ්‍රී සුමංගල හිමියෝ 1831 දී අපවත් වූහ. ඉහගම හිමියන් සහ පිලිමතලාවේ ඇතුළු 75 ක් පමණ පිරිසක් මුරිසි දූපතට පිටුවහල් කරනු ලැබිනි.

1822 මාතලේ කැරැල්ලේ දී කහවත්තේ හිමියන් සිරබාරයට ගන්නා ලදී 1814 දී කැරැල්ලේ දී කඩහපොල හිමියෝ ජාතියේ නිදහස වෙනුවෙන් දිවි පිදූහ. 1948 දක්වා ශ්‍රී ලංකාවේ ඉදිරියට ගමන් කරන ලද්දේ ඉතිහාසය පුරා ශක්තිමත්ව ඉදිරියට පැමිණි මෙම නිදහස් සටන් ව්‍යාපාරයයි. ඒ සඳහා ජාතිහිතෛෂී ශ්‍රේෂ්ඨ රජවරු ද භික්ෂු වරයෝ ද දිවි පිදූහ.

ඔවුන්ගේ ජීවිත පරිත්‍යාගය නිසා ඉතිහාසය පුරා වරින්වර ලාංකීකයනට ආක්‍රමණයක් එළඹෙන තුරු නිදහසේ කල් ගෙවන්නට ඉඩ ප්‍රස්ථා සැලසිනි. ඉතිහාසයේ ඉංග්‍රීසීන් තරම් ශ්‍රී ලංකාවේ ඓතිහාසික දේශයට හානි පමුණුවන ලද වෙනත් ආක්‍රමණික පිරිසක් අප රටේ නොවූ තරම් ය. ඔවුන් සිංහල ජාතිය කෲර ලෙස මර්ධනය කළ අතර, බුදු දහම ජාති සිරිත් විරිත් සිංහල භාෂාව ජාතිකත්වය දේශයේ අනන්‍යතාවය ආදී සියල්ල විනාශ කර ජාතිය කනපිටට පෙරලා දැමූහ.

ලාංකීකයන් ඔවුනට නතුකර ගැනීම උදෙසා අප සිංහල ජාතියේ ආචර්යවරුන් වීම පිණිස පන්සල් පාසල් විනාශ කර මිෂනාරී පාසල් වලට සිංහල ගැමි දරුවන් යොමු කරවා ගැනීමට කළ හැකි සෑම ක්‍රියා මාර්ගයක්ම කළහ. රටේ උරුමය ලාංකීකයනට අහිමි කිරීම පිණිස මුඩුබිම් පනත ඉදිරිපත් කර ඔප්පු ඉදිරිපත් කිරීමට නොහැකි වූ සියලූ ඉඩම් ඉංග්‍රීසීන්ට පවරාගෙන රටේ කෘෂිකාර්මික ජිවන රටාව විනාශකර දමා වතු වගාව තුලින් වැවිලි ආර්ථිකය ගොඩ නගන ලදී. ඒවායේ සේවයට ගෙන්වා ගන්නා ලද්දේ ඉන්දියාවේ ද්‍රවිඩ ජාතිකයන්ය එය අප රටට ප්‍රශ්නයක් බවට පත් කරන ලදී.

> "තාන්ත මාන්ත හා නම්බුනාම ප්‍රිය කළ වැවිලි වගාවෙන් දනවත් වූ තම මධ්‍යම පාන්තිකයන් ජාතිය ආගම අමතක කොට ඉංග්‍රීසිය ගරු කරමින් හෞතිස්ම වද වී ජාතිකත්වය විනාශ කිරීමට ඉදිරිපත් වූහ."

කෝල්බෲක් කැමරන් යෝජනා මගින පන්සල්, පාසල් විනාශකර දැමීමට කටයුතු කරන ලද අතර, ඉංග්‍රීසිය රජයේ භාෂාව කිරීම නිසා අප රටේ පවතින සිංහල භාෂාවේ උන්නතිය ඇන හිටියා පමණක් නොව දේශීයත්වය ද අපට අහිමි විය. අප රටේ කෘෂි ආර්ථිකය විනාශ කර පිටරටින් සහල් ගෙන්වා දීම තුළින් පාරම්පරික ජන ජීවන රටාව විනාශ කරමින් අපේ සිංහල ජනතාව ඔවුන්ගේ වහලුන් බවට පත් කිරීම පමණක් නොව දේශීයත්වය සපුරා විනාශ කෙරිණි.

තාන්න මාන්න හා නම්බුනාම ප්‍රිය කළ වැවිලි වගාවෙන් දනවත් වූ තම මධ්‍යම පාන්තිකයන් ජාතිය ආගම අමතක කොට ඉංග්‍රීසිය ගරු කරමින් හෞතිස්ම ද වී ජාතිකත්වය විනාශ කිරීමට ඉදිරිපත් වූහ. මිෂනාරීන් විසින් ගම් නියම්ගම් පුරා යමින් අපේ රටේ බුදු දහමට පහර වදින ප්‍රකාශ හා මුද්‍රිත ප්‍රකාශ ද ප්‍රචාරය කරන්නට වීම නොඉවසූ මිගෙට්ටු වත්තේ ගුණානන්ද හිමි හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, වස්කඩුවේ ශ්‍රී සුභූති හිමි ආදී ජාති හිතෛෂී භික්ෂු වරයෝ එක්ව ඔවුන්ගේ මත වාද වල සාවද්‍යතාවය පැහැදිලි කරන්න ට වීම නිසා වාද විවාද ඇති විය.

එහි වැදගත් ප්‍රතිඵලයක් වශයෙන් පානදුරාවාදය ජයග්‍රහණය කරන්නට අපට හැකි විය. එය වනාහි නිදහස් සටනේ ප්‍රධාන සංධිස්ථානයක් මෑත බෞද්ධ පුනරුදයේ විශිෂ්ඨ අවස්ථාව එය විය. එහ ජයග්‍රහණයත් සමග ඇති වූ විශිෂ්ඨ ප්‍රබෝදය නිසා එතෙක් කිතු සමය වැළඳ සිටි මධ්‍යම පාන්තිකයෝ යළිත් බුදු දහම වටා ඒකරාශී වන්නට විය. ඔවුන්ගේ දණය බුදු දහමේත් සිංහල ජාතියේත් වුන්නතිය වෙනුවෙන් කැප කිරීමට ඔවුහු කැමැත්තක් දක්වූහ. වාදයේ පිටපත් කියවූ හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ශ්‍රී ලංකාවට පැමිණි පරම විද්දොෝදය සමාගම පිහිටුවා උගත් භික්ෂු වරයන් සමග බෞද්ධ පාසැල් ව්‍යාපාරය නැවත ශක්තිමත් කිරීම නිසා යලිත් ලංකීය දරුවන්ට බෞද්ධ පරිසරයක් යටතේ ඉගෙනුම ලබන්නට ඉඩකඩ සැලසින. සිංහලයෙන් මුද්‍රණ ශිල්පය දියුණු කිරීමත් සමග යළිත් සිංහල භාෂාව පණ ගැන්වෙන්නට විය.

පානදුරාවාදයේ ජයග්‍රහණයත් සමග වර්ෂ 1873 දී හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් විද්යෝදය පිරිවෙනෙත් 1875 දී රත්මලාංනේ ධර්මාලෝක නාහිමියන් විසින් විද්‍යාලංකාර පිරිවෙනෙත් ආරම්භ කිරීම නිසා භික්ෂු අධ්‍යාපනයේ විශිෂ්ඨ උන්නතියක් හට නැගින. එම ආයතන ජාත්‍යන්තර වශයෙන් කීර්තියට පත්විය. එම අධ්‍යාපන ආයතන් මගින් ප්‍රාචීන හා ශාස්ත්‍ර, සහ බුදු දහම කෙරෙහි පුලුල් අවබෝධයක් ලක් ගිහි පැවැදි ශ්‍රේෂ්ඨ පඬි පරපුරක් බිහි වූ අතර ඔවුහු ලංකාව පුරා බෞද්ධ ගම් නියම්ගම් සියාරා පැතිර යද්දී ශ්‍රී ලාංකීකයන් තුළ සැබෑ නිදහස කුමක් ද යන්න පිළිබඳ සැබෑ අවබෝධයක් ඇති වන්නක් විය.

සෙ/14ඩී00388
සාසෙ සෙනෙවිරත්න යූඑම්එෆ්
මූලස්ථානය 14(සෙව්) ශ්‍රීලපාහ

# IMPORTANT EVENTS OF THE REGT FROM 01 JAN 1998.

## 1 LUNCH TO DISABLED SOLDIERS

As per the directions of Regtl Council a special lunch was given to all disabled sldrs on the following dates. The Snr offrs who attended as the Chief Guests are also mentioned below.

| DATE | CHIEF GUEST |
|---|---|
| 20 Feb 1998 | Col of the Regt , Maj Gen AK Jayawardhana RWP RSP rcds psc |
| 23 March 1998 | SO 1 (v), Lt Col SIB Thennakoon SLLI |
| 20 May 1998 | Centre Comdt, Lt Col JS Masakkara SLLI |

It is regretted to info that the lunch for the disabled sldrs which was scheduled to held in following months did not take place due to following unavoidable circumstances.

| MONTH | REASON |
|---|---|
| April | Due to Sinhala and Tamil new year |
| June | Due to the funeral arrangements of Late Maj JC Malpahana RSP SLLI |

## 2 ANNUAL GENERAL MEETING OF SLLI ASSN ON 25 JAN 1998.



As per the request made by new chairman of the SLLI ASSN, the Annual General Meeting of SLLI ASSN for 1998 was held at the Auditorium of Rgetl Centre on 25 Jan 1998. Col of the Rget, Maj Gen AK Jayawardhana RWP RSP rcds psc and several senior offrs of the Regt participated at this occasion. A Cheque for Rs 1,95,350 ( Member ship fees of the serving members) was handed over to the chairman of ASSN and Col of the Regt delivered a speech on behalf of all the offrs and ORS of the Regiment.

## 3 PARTICIPATION IN THE 50TH INDEPENDENCE DAY CELEBRATION ON 04 FEB 1998.

06 x 200 TPS participated in the independence day celebration which was held at the Parliament premises in Sri Jayawardhanapura Kotte on 04.02.1998. As per the directions of the Regtl Council Lt Col DA Amunugama RSP SLLI performed the duties as escort Comd of this ceremonial parade. Regtl mascot, the Brass and drums and Pipe Bands of the Regiment also participated in this occasion.

## 4 CEREMONIAL GUARD OF HONOUR FOR THE DEPARTURE OF HRH THE PRINCE OF WALES OF THE BRITISH EMPIRE ON 06 FEB 1998

As per the directions of AHQ, A Ceremonial Guard of Honour was presented at the departure of Prince Charles who came to participate in the Silver Jubilee of independence day at the international airport at Katunayake on 06 Feb 1998.

## 5 CPLS' CLUB NIGHT ON FEB 1998



As per the directions of Col of the Regt a Cpls' Club Night was held at the Cpls' club of the Regiment on 13 Feb 1998. Col of the Regiment Maj Gen AK Jayawardhana RWP RSP rcds psc participated as the Chief Guest and Brig TTR de Silva RWP RSP psc and several other senior offrs of the Regiment also participated in this occasion. The Regiment Beat Group,"The Buglers" provided the Back Ground Music for this function.

## 6 FLAGS BLESSING CEREMONY ON 27/28 FEB 1998 AT KATARAGAMA

According to the instructions given by Col of the Regiment the Flags Blessing ceremony was held at Kataragama sacred area on 27/28 Feb 1998 with the participation of Col of the Regt, Maj Gen AK Jayawardhana RWP RSP rcds psc, Col



RMD Ratnayake RWP RSP psc, and several senior officers of the Regiment who graced this occasion. The General programme of the ceremony is given below.

| DATE | TIME | EVENT | VENUE |
|---|---|---|---|
| 27 Feb 1998 | 1800 Hrs | Bodhi puja | Kirivehera |
| - do - | 2000 Hrs | Dharma desana | Temple of Kataragama |
| 28 Feb 1998 | 0730 Hrs | Heel Dhana for 25x Priests | Temple of Kataragama |
| - do - | 1100 Hrs | Flags blessing ceremony | Kataragama Devalaya |

### 7 BN ORQMS' CONFERENCE ON 10 MARCH 1998

A co-ordination conference with Bn ORQMS was conducted by the Centre Comdt in order to settle outstanding administration matters of the Bns.

### 8. DINNER NIGHT OF WOS' AND SGTS' MESS ON 11 MARCH 1998

WOS' and SGTS' Mess Dinner Night was held at the Regtl WOS'/SGTS' Mess. Col of the Regt, Maj Gen AK Jayawardhana RWP RSP rcds psc participated as the Chief Guest. Following Snr offrs of the Regiment were also attended with several offrs represented from Bns.

Maj Gen SHS Kottegoda RWP RSP
Brig N Mallawaarachchi psc
Brig D Ratnasabapathy RSP
Brig TTR de Silva RWP RSP psc
Brig MJ Alwis KSV
Col NA Jayasooriya RWP RSP psc
Col WMR Wijesundara RSP psc
Col RMD Ratnayake RWP RSP psc
Lt Col JS Masakkara SLLI
Lt Col AKDJP Siriwardhana RWP RSP psc
Lt Col HW Hewaarachchi RWP RSP SLLI
Lt Col KADA Karunasekara RSP SLLI
Lt Col DA Amunugama RSP SLLI
Lt Col SIB Thennakoon SLLI

### 9 HOUSING PROGRAMME ON 10 APRIL 1998

A house which was made under the programme of Army Housing project for the disabled soldiers have been completed and handed over to S/11913 C/Sgt Liyanage HR (ISLLI) who had been selected from a board which was appointed at the Regimental Centre. Centre Comdt, Lt Col JS Masakkara SLLI participated as the Chief Guest at this occasion. Address of the house is given below.


No: 589/A
Narangodapaluwa
Batuwatte
Ragama

### 10. VISIT OF OFFR CADET INTAKE 44 AND L/O/CADT INTAKE 04 ON 25 APRIL 98

52x O/Cdts and 44 L/O/Cdts visited the Regtl Centre on the given date at 1000 Hrs. For the benefit of these cadets, following events had been organised.

a. A Presentation regarding the History of the SLLI and some of the major offensive operations carried out by SLLI Bns.
b. Regtl Museum visit.
c. Dinner at the Regtl Offrs' Mess.

### 11. SRAMADANA CAMPAIGN FOR THE TEMPLE OF THE TOOTH RELIC ON 25/26 APRIL 1998.



A sramadana campaign was launched to assist the re-construction work at the Temple of the Tooth relic at Kandy which was partly damaged by a Gp of terrorists. 150x personnel representing all SLLI Bns participated in this occasion and SO 1 (v) Lt Col SIB Thennakoon SLLI also participated as the chief co-ordinator of this event.

### 12. PASSING OUT PARADE ON 07 MAY 1998.

31st passing out parade was conducted on 07 May 1998 at the Regtl Parade ground. 118x Recs were on parade. Lt Col DU de Lanerolle RWP RSP SLLI participated as the Chief Guest.



## 13. PERFORMANCES OF THE REGTL BEAT GROUP "THE BUGLERS"

Regtl Beat Group, "the Buglers" performed a out door musical show at Reedigama in Kurunagala from 10.00 Hrs to 0200 Hrs on 12.05.1998. In addition to that the Beat group provided Back ground Music for various Regtl functions, military weddings and opening ceremonies which were taken place up to now.

## 14 CEREMONIAL FUNCTIONS FOR MAJ GEN SHS KOTTEGODA RWP RSP ON 15 JUNE 1998.



As per the directions of Col of the Regt following ceremonial functions were organised for the first visit of Maj Gen SHS Kottegoda RWP RSP after being promoted from the rank of Brig.

a. Guard turnout
b. Guard of Honour
c. Address by the Maj Gen
d. Photograph with all offrs
e. Tea at WOs'/SGTs' Mess
f. Drill and Band display
g. Lunch at the Offrs' Mess

As per the request of Maj Gen SHS Kottegoda RWP RSP, the scheduled programme was amended and deleted all the musical arrangements as a mark of respect for Late Maj JC Malpahana RSP SLLI who died on the same day due to a heart attack.

## 15. MILITARY FUNERALS FOR OFFRS

Ceremonial military funerals were given to following offrs with a view of respecting them for the contribution that they have extended to the Regiment.

| NAME | UNIT | DATE | TIME | CEMETRY |
|---|---|---|---|---|
| Late Lt RMNAB Tennakoon SLLI | 9(V)SLLI | 16.03.98 | 1500 Hrs | Ebbagamuwa |
| Late Lt MB Tennakoon RSP SLLI | 3 SLLI | 23.04.98 | 1530 Hrs | Pujapitiya |
| Late Lt WSP Dias RSP KSV SLLI | 2(v)SLLI | 29.04.98 | 6000 Hrs | Kaduwela |
| Late Lt HP Jayasena KSV SLLI | 2(v)SLLI | 25.05.98 | 1500 Hrs | Yakkala |
| Late Lt KR Thudugala SLLi | 7 SLLI | 25.05.98 | 1500 Hrs | Walasmulla |
| Late Maj AN Dissanayake SLLI | 7 SLLI | 07.06.98 | 1500 Hrs | Bandarawela |
| Late Maj JC Malpahana RSP SLLI | 12 SLLI | 18.06.98 - | 1700 Hrs | Boralla |
| Late Lt UG Suresh Kumara SLLI | 10 SLLI | 21.06.98 | 1000 Hrs | Kolonnawa |

## 16. PROMOTION TESTS FOR ERE PERS


Promotion test for the 1st quarter of year 1998 was conducted from 1st week of July as per the directions given by Regtl Council. The results will be published to each Bns in due course.



# ජයසිකුරු ක්‍රියාන්විතයේ විවිධ අවස්ථා



ජයසිකුරු ජයමාවත කරා ඇදෙන 6 ශ්‍රීලපාහ හට පිරිස් විසින් අත් අඩංගුවට ගන්නා ලද අවි ආයුධ.



ජයසිකුරු ක්‍රියාන්විතයේදී 10 ශ්‍රීලපාහ ඒකක හට පිරිස් නොච්චිමුඩෙයි පාලම පසුකරමින් ගමන්ගන්නා අයුරු.



ජයසිකුරු ක්‍රියාන්විතයේ නියුතු 6 ශ්‍රීලපාහ හට පිරිස් ඉදිරියට ඇදෙමින්.



ජයසිකුරු වන මැද 6 ශ්‍රීලපාහ ඒකක හට පිරිස් අවුරුදු උදාව චාරිත්‍රානුකූලව සිදුකරනු ලබන අයුරු.



8 ශ්‍රීලපාහ ඒකක හට පිරිස් ජයසිකුරු ක්‍රියාන්විතයේ ඉදිරියට ඇදෙමින්.

ජයසිකුරු වන මැද 8 ශ්‍රීලපාහ හට පිරිස් මද විවේකයක් ලබමින්.




1998/05/07 දින පැවති ආධුනික සෙනින්ගේ විසිරයෑමේ පෙළපාලිය ආරාධිත අමුත්තා විසින් පරීක්ෂා කරන අයුරු



සැම අතින්ම අතිශූර සෙබලාට හිමි කුසලානය ආරාධිත අමුත්තා විසින් පිරිනමන අයුරු



1998/05/09 දින රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ හි පවත්වන ලද අවුරුදු උලෙලේ ප්‍රධාන අමුත්තා විසින් පොල්තෙල් පහන දල්වන අයුරු.



අලියාට ඇස තැබීම තරගයේ ජයග්‍රාහී උත්සාහය ...



ආබාධිත රණවිරුවන්ගේ රෝද පුටු තරගයේ අවස්ථාවක්



කනාමුට්ටිය බිඳීම තරගයේ අවස්ථාවක්